

2024
වාර්ෂික වාර්තාව





සී/ස හලාවත වැවිලි සමාගම
சில்லா பிளானேஷன்ஸ் லிமிடெட்
CHILAW PLANTATIONS LTD

වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය
பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சு
Ministry of Plantation and Community Infrastructure

අන්තර්ගතය

	පිටු අංකය
දැක්ම සහ මෙහෙවර	01
මූල්‍ය තොරතුරු විශේෂ අවස්ථා	02
සභාපතිතුමන්ගේ පණිවිඩය	03-04
අධ්‍යක්ෂ මණ්ඩලය	05-07
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය	08
කළමනාකරණ විමසුම	09-20
මූල්‍ය සමාලෝචනය	21-26
ආයතනික පාලන ප්‍රකාශය	27
අවධානම් කළමනාකරණය	28-30
විගණන කමිටු වාර්තාව	31

මූල්‍ය වාර්තා

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව	32-35
අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය	36
විගණකාධිපති වාර්තාව	37-40
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය	41
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය	42-43
ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය	44
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	45
ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන්	46-84
දස වසරක සාරාංශය	85
වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ නිවේදනය	86
පෙරකලාසි අයදුම් පත	87
ආයතනික විස්තර	පිටුපස කවරයේ ඇතුළත

දැක්ම

පොල් කර්මාන්තයේ තිරසර සංවර්ධනය මඟින් ශ්‍රී ලංකා ආර්ථිකයට උපරිම දායකත්වයක් ලබාදීම.

මෙහෙවර

පොල් පාදක කර්මාන්තයේ තිරසාර සංවර්ධනය සඳහා තමන් සතු සීමිත සම්පත් ඵලදායී ලෙස හා කාර්යක්ෂම ලෙස භාවිත කරමින් පිළිගත් ප්‍රතිපත්ති මඟින් සේවකයන්ගේ සහ මහජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම.

අගයන්

අවංක බව

කණ්ඩායම් හැඟීම

අඛණ්ඩතාව

සවිබල ගැන්වීම

විනිවිදභාවය

නව්‍යකරණය

නායකත්වය

වෘත්තීයභාවය

වගකීම සහ වගවීම

මූල්‍ය තොරතුරු විශේෂ අවස්ථා

	2024	2023	වෙනස (%)
පොල් නිශ්පාදනය ගෙඩි '000	10,360	11,729	(11.67)
සාරාංශ ප්‍රතිඵල	රු'000	රු'000	%
අයභාරය	961,593	885,350	9
දළ ලාභය	239,388	227,783	5
පොළිය සහ බදු පෙර ලාභය	179,604	126,873	42
බදු පෙර ලාභය	219,207	302,606	(28)
බදු පසු ලාභය	(138,375)	231,738	(160)
මුළු විස්තීර්ණ ආදායම්	(158,096)	209,549	(175)
රඳවාගත් ලාභය	1,991,506	2,179,602	(9)
මූල්‍ය තත්වය			
ජංගම නොවන වත්කම්	1,667,930	1,590,941	5
මේරු/නොමේරු වගා	1,148,043	1,100,977	4
ජංගම වත්කම්	1,318,982	1,456,651	(9)
තොග	76,577	148,934	(49)
කෙටි කාලීන ආයෝජන (ස්ථාවර තැන්පතු)	1,094,477	1,090,243	0
මුළු වත්කම්	2,986,912	3,047,593	(2)
ජංගම වගකීම්	187,211	408,540	(54)
ජංගම නොවන වගකීම්	608,194	259,450	134
කොටස් ප්‍රග්ධනය	200,000	200,000	-
කොටස් කරුවන්ගේ අරමුදල්	2,191,506	2,379,602	(8)
මූලික දර්ශක	වාර/ % /රු.	වාර/ % /රු.	වෙනස (%)
ජංගම අනුපාතය (වාර)	7.05	3.57	98
ක්ෂණික අනුපාතය (වාර)	6.64	3.20	107
දළ ලාභ අනුපාතය %	24.89	25.73	(3)
කොටසක ඉපයීම රු.	(6.92)	11.59	(160)
සාමාන්‍ය ස්කන්ධයට ආපසු ලැබීම් (ROE) %	(6.05)	9.79	(162)
ප්‍රාග්ධන යෙදවීමට ආපසු ලැබීම් (ROCE) %	6.42	4.81	33
ණයගැති අනුපාතය	0.27	0.22	21
කොටස්කරුවන්ගේ අරමුදල් අනුපාතය %	73.37	78.08	(6)
පොළී ආවරණය වාර	2.28	2.06	11

සභාපතිතුමාගේ සමාලෝචනය

2024 නොවැම්බර් මාසයේදී හලාවත වැවිලි සමාගමේ (CPL) නව සභාපතිවරයා ලෙස වැඩ භාරගත් මා, මාගේ පළමු සභාපතිවරයාගේ සමාලෝචනය ඉදිරිපත් කරන්නේ මහත් වගකීමකින් සහ ජාතික කැපවීමකිනි. වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පූර්ණ රජය සතු ව්‍යවසායක් ලෙස, CPL රටේ වැවිලි ආර්ථිකයට දායක වීම, තිරසාර ඉඩම් භාවිතය ප්‍රවර්ධනය කිරීම, ග්‍රාමීය ජීවනෝපායන් සහ ආහාර සුරක්ෂිතතාව වැඩි දියුණු කිරීම සඳහා උපායමාර්ගික කාර්යභාරයක් ඉටු කරයි.

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ මගේ සේවා කාලය කෙටි වුවද, සංකීර්ණ හා සංක්‍රාන්ති කාල පරිච්ඡේදයක් තුළ සමාගමේ ජයග්‍රහණ සහ ඔරොත්තු දීමේ හැකියාව මම බෙහෙවින් අගය කරමි.

මෙහෙයුම් විශේෂ අවස්ථා

විශේෂයෙන් වියළි කලාපයේ පිහිටි අපගේ වතුවල පැවති අහිතකර කාලගුණික තත්ත්වයන් සහ පසුගිය වසරවල වාර්තා වූ පොහොර හිඟය හේතුවෙන් පොල් නිෂ්පාදනය 11.7% කින් පහත වැටුණද, CPL ආදායමේ ප්‍රශංසනීය වර්ධනයක් වාර්තා වූ අතර එය රුපියල් මිලියන 961.59 ක් විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පොල් ගෙඩියකට රු. 82.96 ක ශුද්ධ විකුණුම් සාමාන්‍යයක් (NSA) පැවතීම සහ පොල් නිෂ්පාදන සඳහා පැවති ඉහළ ඉල්ලුමයි. මුළු ආදායමෙන් 90% ක් දායක වන පොල් අංශය අපගේ මෙහෙයුම්වල කොඳු නාරටිය ලෙස පැවතුනි.

විවිධාංගීකරණය සහ වැඩිදියුණු කළ මෙහෙයුම් කාර්යක්ෂමතාව කෙරෙහි අපගේ අවධානය පිළිබිඹු කරමින්, කජු සහ පශු සම්පත් අංශවල ද සමාගම සැලකිය යුතු දියුණුවක් අත්පත් කරගෙන ඇත.

මූල්‍ය කාර්ය සාධන දළ විශ්ලේෂණය

2024 දී සමාගම රුපියල් මිලියන 239.39 ක දළ ලාභයක් වාර්තා කළ අතර එය පෙර වසරට වඩා 5% ක වැඩිවීමකි. නිෂ්පාදනයේ පහත වැටීමක් තිබියදීත් පොල් මිල ඉහළ යාම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. කජු සහ පශු සම්පත් අංශ ද හොඳින් ක්‍රියාත්මක වූ අතර, අලෙවි නොකළ පොල් පැළ වල වටිනාකම කපා හැරීම හේතුවෙන් පොල් පැළ තවාන් අංශය තුළින් අලාභයක් වාර්තා විය. කෙසේ වෙතත්, බදු ගෙවීමට පෙර ලාභය (PBT) 2023 දී රුපියල් මිලියන 302.61 සිට රුපියල් මිලියන 219.21 දක්වා පහත වැටුණි. මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ස්ථාවර තැන්පතු සඳහා පැවති අඩු පොලී අනුපාත හේතුවෙන් මූල්‍ය ආදායම සැලකිය යුතු ලෙස පහත වැටීමත් සහ දළ දේශීය නිෂ්පාදිත අවධමනකය පදනම්ව ඉඩම් කල්බදු සඳහා වාර්ෂික කල්බදු කුලී බැඳීම් වැඩිවීමෙන් පැන නගින මූල්‍ය පිරිවැය ඉහළ යාමයි. වඩා හොඳ දළ ලාභදායීතාවයක් තිබියදීත්, මෙම මූල්‍ය පීඩනයන් සමාගමේ බදු ගෙවීමට පෙර ඉපැයීම් කෙරෙහි බලපා ඇත.

2024 වර්ෂයේදී සමාගම රුපියල් මිලියන 138.7 ක බදු පසු අලාභයක් වාර්තා කළ අතර, එයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ රුපියල් මිලියන 323.3 ක විලම්භිත බදු ප්‍රතිපාදනයක් ප්‍රවර්තන වර්ෂයේ ගිණුම් වාර්තා තුළ හඳුනා ගැනීමයි. මෙය, 2024 අප්‍රේල් මාසයේ සිට කෘෂිකාර්මික ආදායමද ආදායම් බද්දට යටත් වූ බැවින් යාවත්කාලීන කරන ලද බදු රෙගුලාසිවලට අනුකූලව සිදු කරන ලද මුදල් නොවන ගිණුම්කරණ ගැලපුමකි. එබැවින් මෙය සමාගමේ මූල්‍ය තත්ත්වයට හෝ එහි මෙහෙයුම් ක්‍රියාකාරිත්වයට සෘජු බලපෑමක් නැති බව සැලකිල්ලට ගැනීම වැදගත්ය.

රජයට කරන ලද දායකත්වය

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය යටතේ පාලනය වන පූර්ණ වශයෙන් රජය සතු ආයතනයක් ලෙස, හලාවත වැවිලි සමාගම රජයට අර්ථවත් ලෙස සිය දායකත්වය ලබාදීමට කැපවී සිටියි. සමාලෝචිත වර්ෂය තුළ, සමාගම 2022 සහ 2023 මූල්‍ය වර්ෂවල උපයාගත් ලාභයෙන් රුපියල් මිලියන 215 ක ලාභාංශයක් මහා භාණ්ඩාගාරය වෙත ගෙවීම් කළ අතර, එය ජාතික ආදායමට දායක වීමේ සමාගමේ භූමිකාව අවධාරණය කරයි.

මානව ප්‍රාග්ධනය සහ කාර්ය මණ්ඩල ඇගයීම

2024 දී, හලාවත වැවිලි සමාගම ප්‍රථම වරට කාර්ය සාධනය මත පදනම් වූ දිරි දීමනා ගෙවීම් ක්‍රමයක් හඳුන්වා දුන් අතර, එමඟින් තනි පුද්ගල කාර්ය සාධනය ඇගයීම්වලට අනුව ප්‍රතිලාභ ගෙවීම තුළින් ආයතනය තුළ කැපවීම සහ වගවීම් පිළිබඳ සංස්කෘතියක් ස්ථාපිත කරන ලදී. පෙර වසරේ ගෙවන ලද රුපියල් මිලියන 29.54 ට සාපේක්ෂව මෙම යෝජනා ක්‍රමය යටතේ රුපියල් මිලියන 30.3 ක් ගෙවීම්කර ඇත.

2024 දී දිරි දීමනා ගෙවීම වඩාත් සාධාරණ අයුරින් සිදු වූ අතර, එහිදී 45% ක් වතු කම්කරුවන්ටත්, 55% ක් කාර්ය මණ්ඩලයට සහ කළමනාකරණ සේවකයින්ටත් වෙන් කරනු ලැබීය. පසුගිය වසරේදී මෙම අනුපාතය 35% ක් 65% ලෙස පැවතුනි. මෙම වෙනස සමාගමේ මූලික මෙහෙයුම් සහ නිෂ්පාදන ක්‍රියාවලියෙහි ක්ෂේත්‍ර මට්ටමේ සේවකයන් දැරූ විශේෂිත භූමිකාව පිළිබඳව ඇති ධනාත්මක ආකල්පය පිළිබිඹු වේ.

එමෙන්ම, 2023 වසරේදී ගෙවූ රු. මිලියන 12.96 ක ප්‍රතිලාභයට සාපේක්ෂව, භාණ්ඩාගාර චක්‍රලේඛවලට අනුකූලව, 2024 වසරේදී සියලු සේවකයින්හට වාර්ෂික ප්‍රසාද දීමනා ලෙස රු. මිලියන 12.55 ක් ගෙවනු ලැබීය. මෙම පියවරයන් සමඟින්, සේවක අභිප්‍රේරණය, සාධාරණත්වය සහ දිගුකාලීන පැවැත්ම පිළිබඳව හලාවත වැවිලි සමාගමේ කැපවීම අවධාරණය කරයි.

උපායමාර්ගික ආයෝජන සහ තිරසාරභාවය

2024 දී, ක්ෂේත්‍ර සංවර්ධනය සඳහා රුපියල් මිලියන 79.45 ක් සහ දේපළ හා උපකරණ අත්පත් කර ගැනීම සහ වැඩිදියුණු කිරීම් සඳහා රුපියල් මිලියන 32 ක ප්‍රාග්ධන වියදමක් දරමින් හලාවත වැවිලි සමාගම එහි අනාගතය වෙනුවෙන් ආයෝජනය කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. මෙම ආයෝජන වතු ඵලදායීතාව, යටිතල පහසුකම් සහ තිරසාරභාවය වැඩි දියුණු කිරීම සඳහා සමාගමේ දිගුකාලීන උපාය මාර්ගයේ කොටසකි.

අනාගතය දෙස බලන විට, හලාවත වැවිලි සමාගමේ කළමනාකාරිත්වය උපායමාර්ගික කෘෂිකාර්මික ව්‍යාප්තිය තුළින් සමාගමේ තිරසාර සංවර්ධනය සඳහා කැපවී සිටියි. සුදුසු ප්‍රදේශ තුළ නව පොල් වගාවන් ස්ථාපිත කිරීම, පුළුල් කිරීම සහ සියලුම වතුවල අතුරු බෝග වගා ආරම්භ කිරීම්, පුළුල් කිරීමට සැලසුම් සකස් වෙමින් පවතී. මෙම ප්‍රයත්නයන් තුලින් අරමුණු කරනු ලබන්නේ ඉඩම් ඵලදායීතාව වැඩිදියුණු කිරීම, ආදායම් මාර්ග විවිධාංගීකරණය කිරීම සහ දේශගුණික හා වෙළඳපළ අභියෝගවලට එරෙහිව දිගුකාලීන ඔරොත්තු දීමේ හැකියාව සහතික කිරීමයි.

ස්තූතිය

ව්‍යුහාත්මක වෙනසක් සිදු වූ වසරක් තුළ ලබාදුන් නායකත්වය සහ ප්‍රතිපත්තිමය සහයෝගය වෙනුවෙන් වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍ය ගරු සමන්ත විද්‍යාරත්න මැතිතුමාට මගේ අවංක කෘතඥතාව පලකිරීමට කැමැත්තෙමි. හලාවත වැවිලි සමාගමෙහි ඵලදායී ක්‍රියාකාරිත්වය සඳහා අඛණ්ඩ මග පෙන්වීම සහ සම්බන්ධීකරණය සිදුකරනු ලබන අමාත්‍යාංශ ලේකම්තුමාට ද මගේ හෘදයාංගම ස්තූතිය පළ කරමි.

සමාලෝචිත වසරේ වැඩි කාලයක් තුළ මඟ පෙන්වීම සහ සහයෝගය ලබා දුන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ හිටපු අමාත්‍යතුමාට සහ ලේකම්තුමාට මාගේ ස්තූතිය පුදකරමි.

වසර තුළ සිදුකල කාර්යයන් වෙනුවෙන් හිටපු සභාපතිවරයාට, අධ්‍යක්ෂ මණ්ඩලයට, කළමනාකාරිත්වයට සහ කාර්ය මණ්ඩලයට මම ප්‍රශංසා කරමි.

අවසාන වශයෙන්, හලාවත වැවිලි සමාගම වගකිවයුතු සහ ඉහළ කාර්යසාධනයක් සහිත රාජ්‍ය ව්‍යවසායයක් ලෙස දිගටම පවත්වාගෙන යාමට හැකිවන පරිදි විශ්වාසය සහ අධීක්ෂණය ලබාදුන් අපගේ චිකම කොටස් හිමියා වන මහා භාණ්ඩාගාරයේ නිළධාරින්ට මම ස්තූතිවන්ත වෙමි.

මම මෙම නව භූමිකාව යටතේ, සාමූහික උත්සාහයෙන්, වැවිලි ශේස්ත්‍රයේ වර්ධනය සමඟ, තිරසාරභාවය, ඵලදායීතාව තුළින් හලාවත වැවිලි සමාගම නව යුගයකට ගෙන යා හැකි බව මාගේ විශ්වාසයි.

.....
චන්දන දිසානායක
සභාපති
හලාවත වැවිලි සමාගම

අධ්‍යක්ෂක මණ්ඩලය



චන්දන දිසානායක මහතා
සභාපති/ප්‍රධාන විධායක නිලධාරී

චන්දන දිසානායක මහතා 2024 නොවැම්බර් 25 වන දින හලාවත වැවිලි සමාගමේ සභාපති/ප්‍රධාන විධායක නිලධාරී ලෙස පත් කරන ලදි.

චන්දන දිසානායක මහතා සුප්‍රසිද්ධ ඉබ්බාගමුව මධ්‍ය මහා විද්‍යාලයේ දීප්තිමත් ආදි ශිෂ්‍යයෙකු වන අතර කැලණිය විශ්ව විද්‍යාලයයේ වාණිජවේදී (විශේෂ) උපාධිය ලබා ඇත. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් පවත්වනු ලබන වරලත් ගණකාධිකරණ අන්තර් වෘත්තීය පාඨමාලාව හදාරණු ලැබීය.

චන්දන දිසානායක මහතා 2006 වර්ෂයේදී පෞද්ගලික අංශයෙන් සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ අතර, හලාවත වැවිලි සමාගමෙහි සභාපති/ප්‍රධාන විධායක නිලධාරී ලෙස පත්වීමට පෙර ඔහු ප්‍රමුඛපෙළේ මූල්‍ය හා රක්ෂණ ආයතනවල ප්‍රධාන කළමනාකරු, පළාත් කළමනාකරු, ප්‍රාදේශීය කළමනාකරු, හා මූල්‍ය හා රක්ෂණ උපදේශකවරයෙකු ලෙස සේවය කළේය.

ඔහුගේ විශිෂ්ඨ නායකත්ව හා කළමනාකරණ කුසලතා විදහා පාමින් සේවය කරන ලද සියලුම ආයතනයන්හි ඉලක්ක හා අරමුණු සාක්ෂාත් කරගනිමින්, ඉහළ ප්‍රමිතීන් කරා ළඟා වීමට සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත.



පී.එච්.ඒ.එස්. විජයරත්න මහතා
අධ්‍යක්ෂ/මහා භාණ්ඩාගාර නියෝජිත

2021 නොවැම්බර් 01 වන දින මුදල්, සැලසුම් සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් ධුරයට පත් වූ පී.එච්. ආනන්ද එස්. විජයරත්න මහතා ශ්‍රී ලංකා සැලසුම් සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වන අතර වසර 31 කට ආසන්න කාලයක් රාජ්‍ය සේවයේ විවිධ තනතුරු හොබවා ඇති අතර ඉන් වසර 26 ක් මහා භාණ්ඩාගාරයේ සේවය කර ඇත. ආනන්ද විජයරත්න මහතා 1994 දී සහකාර අධ්‍යක්ෂවරයෙකු ලෙස රාජ්‍ය සේවයට එක් විය.

ආනන්ද විජයරත්න මහතා රුහුණු විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විශේෂවේදී ගෞරව උපාධියක් ලබා ඇත. ඔහු කොළඹ විශ්ව විද්‍යාලයෙන් ජාතික සංවර්ධන සැලසුම්කරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සහ දකුණු කොරියානු ජනරජයේ කුං හී විශ්ව විද්‍යාලයෙන් ජාත්‍යන්තර ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අවසාන මට්ටමේ විභාග දක්වා සම්පූර්ණ කර ඇත.

එතුමා 1994 දී ශ්‍රී ලංකා සැලසුම් සේවයට සම්බන්ධ වූ අතර බදුල්ල දිස්ත්‍රික්කයේ රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත කරන ලදී. 1999 දී විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට සම්බන්ධ වූ ඔහු 2011 දී ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන ලදී. 2013 දී මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ලෙස පත් කරන ලද එතුමන් 2020 දී මුදල් හා ප්‍රාග්ධන වෙළඳපොළ සහ ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස උසස් කරන ලද අතර දැනට මුදල්, සැලසුම් සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ චිම තනතුරේම කටයුතු කරයි.



අරුණි එස්. රණසිංහ මහත්මිය
අධ්‍යක්ෂ

අරුණි එස්. රණසිංහ මහත්මිය 2020 පෙබරවාරි 14 වන දින සිට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය නියෝජනය කරමින් හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකාවක් ලෙස කටයුතු කරයි. ඇය රාජ්‍ය ආයතන කිහිපයක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් ලෙස සේවය කරයි.

එතුමිය වර්තමානයේ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පරිපාලන) ලෙස කටයුතු කරයි. රණසිංහ මහත්මිය ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරිණියක් වන අතර වසර 27 ක රාජ්‍ය සේවා පළපුරුද්දක් ඇත.

ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් වාණිජවේදී (විශේෂ) ගෞරව උපාධියක් ලබා ඇති අතර ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් (SLIDA) රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත.



ඩිලූෂ ප්‍රනාන්දු මහතා
අධ්‍යක්ෂ

ඩිලූෂ ප්‍රනාන්දු මහතා ඇඟලුම් අංශය තුළ නිෂ්පාදන සැලසුම්කරණය සහ මෙහෙයුම් කළමනාකරණය පිළිබඳ වසර 18 කට වැඩි පළපුරුද්දක් ඇති ඉතා දක්ෂ හා ප්‍රතිඵල මත පදනම් වූ සහකාර සාමාන්‍යාධිකාරිවරයෙකි. නිෂ්පාදන ක්‍රියාවලීන් විධිමත් කිරීම, සැපයුම්දාම කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ ඉල්ලුම පුරෝකථනයන් සහ කාලසීමාවන් සපුරාලීම සඳහා සම්පත් වෙන් කිරීම ප්‍රශස්ත කිරීම සඳහා දක්ෂය. ඇඟලුම් නිෂ්පාදනය, තොග පාලනය සහ තත්ත්ව ප්‍රමිතීන් පිළිබඳ දැඩි අවබෝධයක් මෙතුමා සතු වේ.

පිරිවැය-ඵලදායීතාවය පවත්වා ගනිමින් නිෂ්පාදන කාලෝචිත ලෙස බෙදා හැරීම සහතික කිරීම සඳහා සැලසුම් කිරීම, ප්‍රසම්පාදනය සහ විකුණුම් ඇතුළුව හරස් ක්‍රියාකාරී කණ්ඩායම් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම ඔහු විසින් සනාථ කර ඇත. කණ්ඩායම් කළමනාකරණය, ක්‍රියාවලි වැඩිදියුණු කිරීම් මෙහෙයවීම සහ ඵලදායීතාව වැඩි දියුණු කිරීම සඳහා මෙහෙයුම් ගැටළු නිරාකරණය කිරීමේදී ශක්තිමත් නායකත්ව හැකියාවන් පෙන්නුම් කරයි.

දත්ත මත පදනම් වූ තීරණ ගැනීම, ERP පද්ධති භාවිතා කිරීම සහ නිෂ්පාදන සැලසුම්කරණයේ හොඳම භාවිතයන් ක්‍රියාත්මක කිරීමට නායකත්වය දීම පිළිබඳ දක්ෂතාවයක් ඇත.

අවදානම් හඳුනා ගැනීම සහ අවම කිරීම, කර්මාන්ත රෙගුලාසි වලට අනුකූල වීම සහතික කිරීම සහ පාරිභෝගික අවශ්‍යතා සපුරාලීම සඳහා නිෂ්පාදන කාලසටහන් අඛණ්ඩව වැඩිදියුණු කිරීම සඳහා දක්ෂයෙකු වූ මොහු නිෂ්පාදන වැඩ ප්‍රවාහ ප්‍රශස්ත කිරීම සහ ව්‍යාපාරයේ වර්ධනයට තල්ලු කිරීම සඳහා තාක්ෂණය උපයෝගී කර ගැනීම කෙරෙහි දැඩි ඇල්මක් දක්වයි.



ඩබ්.සිරිවර්ධන මහතා
අධ්‍යක්ෂ

සිරිවර්ධන මහතා අම්පාර හාඩි ජ්‍යෙෂ්ඨ තාක්ෂණික ආයතනයේ ජාතික කෘෂිකර්ම ඩිප්ලෝමාව සහ ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ ව්‍යවසායකත්ව සංවර්ධන සහ කුඩා ව්‍යාපාර කළමනාකරණ පාඨමාලාව සාර්ථකව නිම කරන ලදි.

එතුමා ග්‍රාමීය ණය වැඩසටහන් සහ තිරසාර කෘෂිකර්මාන්තය සඳහා ඒකාබද්ධ ගොවිතැන් ක්‍රමය සමඟ කෘෂිකාර්මික ව්‍යාප්තිය සහ ව්‍යවසාය සංවර්ධනය පිළිබඳ අත්දැකීම් රාශියකින් සමන්විත වේ.

සිරිවර්ධන මහතා කෘෂිකාර්මික ඵලදායීතාව, ලබා ගැනීමේ හැකියාව, සංවාද හරහා ප්‍රවේශය සහ භෝග සහ පශු සම්පත් නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීමෙන් සම්පත් විවිධාංගීකරණය කිරීම මඟින් ගෘහස්ථ ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය සඳහා ප්‍රජා ඔරොත්තු දීමේ හැකියාව නිර්මාණය කරයි. එසේම, ඔහු බොහෝ සංවිධානවල කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරියෙකු, ව්‍යවසාය සංවර්ධන නිලධාරියෙකු, කෘෂිකර්ම කළමනාකරුවෙකු සහ ප්‍රාදේශීය කෘෂිකර්ම සහ සැපයුම් කළමනාකරුවෙකු ලෙස සේවය කළේය.



පී.වී.ආර්.එස්. කුමාර මහතා
අධ්‍යක්ෂ

ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (විශේෂ) / බැංකු හා මූල්‍ය ඩිප්ලෝමාව / ණය කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව

පී.වී.ආර්.එස්.කුමාර මහතා බැංකු ක්ෂේත්‍රයේ වසර 29 කට වැඩි පළපුරුද්දක් ඇති ජ්‍යෙෂ්ඨ බැංකු කළමනාකරුවෙකි. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ඔහුගේ වෘත්තීය ජීවිතය පුරාවටම, ඔහු විවේචනාත්මක චින්තනය, ගැටළු විසඳීම, කළමනාකරණය සහ නායකත්වය පිළිබඳ ඔහුගේ කුසලතා ඔප් නංවාගෙන ඇති අතර, සුවිශේෂී මූල්‍ය සේවා සැපයීම සහතික කරමින් සහ ආයතනික වර්ධනය පෝෂණය කරයි. එතුමාගේ විශිෂ්ටත්වය සහ අනුවර්තනය වීමේ කැපවීම මත පාරිභෝගික තෘප්තිය සහ කණ්ඩායම් සංවර්ධනය කෙරෙහි දැඩි අවධානයක් යොමු කරමින් සංකීර්ණ අභියෝග ඵලදායී ලෙස සැරිසැරීමට ඔහුට හැකියාව ලබා දී ඇත. ඔහුගේ වෘත්තීය කටයුතු වලින් ඔබ්බට, ක්‍රියාශීලී සමාජ සේවකයෙක් වන එතුමා, ප්‍රජා අභිවෘද්ධිය සඳහා දායක වීමට සහ ධනාත්මක වෙනසක් ප්‍රවර්ධනය කිරීමට දැඩි උනන්දුවක් දක්වයි.



ජේ.එම්.චන්ද්‍ර කුමාර සිරි ජයසිංහ මහතා
අධ්‍යක්ෂ

මෙතුමා තේ වතු අධිකාරීවරයකු ලෙස වසරක කාලයක් පුහුණුව ලැබීය.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අනුබද්ධිතව තිබූ ශ්‍රමික ගව හා කිරි පට්ටි සංවර්ධන ව්‍යාපාරයේ වසර හතක සේවය කළේය.

කුරුණෑගල ෆීලික්ස් එන්ටර්ප්‍රයිසස් ආයතනයේ (වාහන, වාහන අමතර කොටස්, ඩෝසර්, එක්ස්කැවේටර් සහ යතුරු පැදි ආනයනය හා අළුත්වැඩියා කර අලෙවි කරනු ලබන ආයතනයකි.) වසර 27 ක් පමණ සේවය කරන ලදී.

තවද රන්දෙණිගල ඩිස්ටලරීස් ආයතනයේ මෙහෙයුම් කළමණාකරු ලෙස වසරක කාලයක් සේවය කළේය.

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස වසරක එකහමාරක පමණ සේවය කරන ලදී.



ඒ.ආර්.කේ. කුමාර මහතා
අධ්‍යක්ෂ

රෝහණ කුමාර මහතා සක්‍රීය කාබන් කර්මාන්තය සඳහා තිරසාර පොල්කටු ප්‍රසම්පාදනය පිළිබඳ ගෞරවනීය ශ්‍රී ලාංකික විශේෂඥයෙකි. ඔහු දැනට ප්‍රමුඛ පෙළේ සක්‍රීය කාබන් සමාගමක පොල්කටු මිලදී ගැනීමේ කළමනාකරු ලෙස සේවය කරන මෙතුමා 2007 සිට, සක්‍රීය කාබන් නිෂ්පාදනය සඳහා භාවිතා කරන ප්‍රධාන අමු ද්‍රව්‍ය වන උසස් තත්ත්වයේ පොල්කටු අඟුරු ලබා ගැනීම සඳහා වගකිව යුතු නිලධාරියෙකු ලෙස කටයුතු කරයි.

දශක දෙකකට ආසන්න අත්දැකීම් ඇති කුමාර මහතා, පොල් ආශ්‍රිත සක්‍රීය කාබන් නිෂ්පාදනයේ ගෝලීය ප්‍රමුඛයා ලෙස ශ්‍රී ලංකාවේ තත්ත්වය ශක්තිමත් කිරීම සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කර ඇත. කර්මාන්තය තුළ අමු ද්‍රව්‍ය ප්‍රසම්පාදනයේ ගුණාත්මකභාවය සහ විශ්වසනීයත්වය යන දෙකම ඉහළ නැංවීමට ඔහුගේ කාර්යය සැලකිය යුතු ලෙස දායක වී තිබේ.

තම වෘත්තීය වගකීම්වලට අමතරව, කුමාර මහතා පාරිසරික තිරසාරභාවය සඳහා දැඩි උනන්දුවක් දක්වන අයෙකි. පොල් වගාව ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් "දසලක්ෂයක පොල් පැළ වැඩසටහන" නමින් මහා පරිමාණ මුල පිරීමකට එතුමා වර්තමානයේ නායකත්වය දෙයි.

කුමාර මහතා ශ්‍රී ලංකාවේ තිරසාර ප්‍රසම්පාදන පිළිවෙත්, හරිත මූලාශ්‍රකරණය සහ කර්මාන්ත පුරා පාරිසරික ප්‍රයත්නයන් පිටුපස ගාමක බලවේගයක් ලෙස අඛණ්ඩව කටයුතු කරයි.

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

ප්‍රධාන කාර්යාලය

01. චන්දන දිසානායක මහතා	- සභාපති/ප්‍රධාන විධායක නිලධාරී
02. බී. හෙට්ටිආරච්චි මහතා	- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - වැවිලි (වැඩ බලන)
03. ආර්.එම්.ආර්.බී. රත්නායක මහතා	- සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය
04. එච්.පී.එම්.ඩබ්. හේමචන්ද්‍ර මහතා	- ප්‍රධාන අභ්‍යන්තර විගණක
05. ඒ.එම්.ටි.එච්.බී. අතපත්තු මහතා	- සහකාර සාමාන්‍යාධිකාරී - පාලන (වැඩ බලන)
06. ඒ.ඒ. අශෝක ආනන්ද මහතා	- සහකාර සාමාන්‍යාධිකාරී - වැවිලි/ව්‍යාපෘති) (retd. 24/11/24)
07. ඩබ්. කේ. ප්‍රදීප් මහතා	- ජ්‍යෙෂ්ඨ කළමනාකාර (තාක්ෂණ/සංවර්ධන)
08. ඒ.එන්.ඒ.එස්. කරුණාතුංග මහතා	- කළමනාකාර (අලෙවි)

වතු අධිකාරිවරුන්


09. එම්.ජී.සී. ඩයස් මහතා	- සහකාර සාමාන්‍යාධිකාරී - වතු/වැවිලි (දිවුලපිටිය වතු කලාපය)
10. ජේ.එච්. ප්‍රනාන්දු මහතා	- ජ්‍යේෂ්ඨ වතු අධිකාරී (පලුගස්වැව වතු කලාපය)
11. ඩි.එම්.ජි.ඒ. දිසානායක මහතා	- වතු අධිකාරී (මාදම්පේ වතු කලාපය)
12. බී.එම්.යු.බී. බස්නායක මහතා	- වතු අධිකාරී (හලාවත වතු කලාපය)
13. ඒ.එම්.ඩි.ගුණතිලක මහතා	- වතු අධිකාරී (බිංගිරිය වතු කලාපය)
14. එච්.ටි.එස්. පෙරේරා මහතා	- වතු අධිකාරී (තම්බපණ්ණි වතු කලාපය)
15. බී.ඒ.පී.ඩි. ධර්මසේන මහතා	- වතු අධිකාරී (මංගලවිලිය වතු කලාපය)
16. කේ.ඒ.එන්.අයි. කරුණාරත්න මහතා	- වතු අධිකාරී (නිකවැරටිය වතු කලාපය)

කළමනාකරණ විශ්ලේෂණය

භූමි පිහිටීම

හලාවත වැවිලි සමාගම අක්කර 14,136.08 ක භූමි ප්‍රමාණයකට හිමකම් කියනු ලබන වැවිලි සමාගම් අතර ප්‍රමුඛ රාජ්‍ය වැවිලි සමාගමක් වේ. වැවිලි සමාගමට අයත් සමස්ත භූමි ප්‍රමාණය වයඹ පළාතට අයත් පුත්තලම සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කයන් තුළ සහ බස්නාහිර පළාතට අයත් ගම්පහ දිස්ත්‍රික්කය ඇතුළත ව්‍යාප්තව පවතී. මීට අමතරව 2023 වර්ෂයේදී ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සමඟ ඇති කර ගන්නා ලද එකඟතාවයකට අනුව උතුරු පළාතේ කිලිනොච්චිය දිස්ත්‍රික්කය ඇතුළත පිහිටි වතු කොට්ඨාශ 4 ක් හලාවත වැවිලි සමාගමට එක් කරගන්නා ලදී. ඒ අනුව වර්තමානයේ දී හලාවත වැවිලි සමාගම විසින් කළමනාකරණය කරනු ලබන අක්කර ප්‍රමාණය 14,802.07 වේ.

දිස්ත්‍රික්ක අතර භූමි ප්‍රමාණයේ ව්‍යාප්තිය පහත පරිදි වේ.





හලාවත වැවිලි සමාගමෙහි ප්‍රධාන නිෂ්පාදනය වශයෙන් පොල් සඳහා ප්‍රමුඛ ස්ථානය ලබා දෙමින් අතුරු බෝග වශයෙන් කජු, රඹුටන්, කුරුඳු, TJC අඹ, ඩ්‍රැගන් ෆෘට් සහ ගම්මිරිස් වගාවන් සහ සත්ත්ව පාලන ව්‍යාපෘති ද පවතී. ඊට අමතරව අගය එකතු කරන නිෂ්පාදනයන් කෙරෙහි ද හලාවත වැවිලි සමාගම දීර්ඝ කාලයක සිට යොමු වී සිටී.


වතු කලාපය	වතු ඒකක ගණන	හෙක්. ගණන	ප්‍රධාන භෝග (හෙක්.)			ප්‍රා.ලේ.කොට්ඨාශ	ප්‍රධාන නගරය
			පොල්	කජු	අනෙකුත් බෝග		
බිංගිරිය	11	1,109.74	706.95	20.00	0.81	බිංගිරිය, කොබෙයිගනේ	වීරපොකුණ
හලාවත	12	645.57	485.36	49.96	13.55	පල්ලම, ආරච්චිකට්ටුව, රස්නායකපුර	පල්ලම
දිවුලපිටිය	14	414.37	393.62	-	49.69	දිවුලපිටිය, කටාන, දංකොටුව	බඩල්ගම
මාදම්පේ	12	655.86	603.65	6.07	4.72	නාත්තන්ඩිය, හලාවත, බිංගිරිය, උඩුබද්දාව, මාදම්පේ	උඩුබද්දාව
මංගලවළිය	11	816.64	300.79	314.64	-	පුත්තලම, මූන්දලම, මහකුඹුක්කඩවල	මූන්දලම
නිකවැරටිය	14	399.92	332.87	18.2	-	කොබෙයිගනේ, පඩුවස්නුවර	කොබෙයිගනේ
පළුගස්වැව වත්ත	1	672.22	619.16	-	0.5	ආරච්චිකට්ටුව	ආරච්චිකට්ටුව
තම්බපණ්ණි	10	1,008.79	422.38	445.75	-	පුත්තලම, වනාතවිල්ලුව, කල්පිටිය	පුත්තලම
පලෙයි	4	269.63	37.25	-	-	කිලිනොච්චිය	කිලිනොච්චිය, යාපනය
එකතුව	**89**	**5,992.74**	**3,902.03**	**854.62**	**69.27**		


හලාවත වැවිලි සමාගම රාජ්‍ය ආයතනයක් වශයෙන් පොල් නිෂ්පාදනයේ ප්‍රමුඛ ස්ථානය අත්කර ගනිමින් සිටින නමුදු, පොල් වගාවේ වැඩි භූමි ප්‍රමාණයක් වියළි දේශගුණික කලාප තුළ පිහිටා තිබීම සහ වගා ඉඩම්වල ඵලදරණ පොල් ගස් ඝණත්වය නිසි ප්‍රමිතියෙන් නොපැවතීම ඉහළ පොල් අස්වැන්නකට යාමට අවාසි සහගතව බලපා ඇත. එමෙන්ම දිගු කාලයක සිට යෙදවුම් වල මිල ගණන් ඉහළ ගිය නමුදු, පොල් නිෂ්පාදන අලෙවියෙන් ලද ආදායම් සැලකිය යුතු මට්ටමින් ඉහළ නොයෑම ද කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සිදුකළ යුතු සමහර ආයෝජනයන් කෙරෙහි අවාසි සහගතව බලපාන ලදී. විශේෂයෙන් රසායනික පොහොර මිල ඉහළ යාම මත සමස්ථ වගාවට දීර්ඝ කාලයක සිට අවශ්‍ය පෝෂක සංඝටක ප්‍රමාණය ප්‍රමාණවත්ව නොලැබීම ද ඵලදාව ක්‍රමිකව පහළ යාමට හේතුවක් වුණි.


පොල් නිෂ්පාදන දත්ත



බිංගිරිය වතු කලාපය
3,000,000
2,500,000
2,000,000
1,500,000
1,000,000
500,000
0
2019 2020 2021 2022 2023 2024
ඵලදාව



හලාවත වතු කලාපය
2,000,000
1,800,000
1,600,000
1,400,000
1,200,000
1,000,000
800,000
600,000
400,000
200,000
0
2019 2020 2021 2022 2023 2024
ඵලදාව



දිවුලපිටිය වතු කලාපය
2,000,000
1,500,000
1,000,000
500,000
0
2019 2020 2021 2022 2023 2024
ඵලදාව



මාදම්පේ වතු කලාපය
2,500,000
2,000,000
1,500,000
1,000,000
500,000
0
2019 2020 2021 2022 2023 2024
ඵලදාව


මංගලවැළිය වතු කලාපය
1,000,000
900,000
800,000
700,000
600,000
500,000
400,000
300,000
200,000
100,000
0
2019 2020 2021 2022 2023 2024
ඵලදාව


නිකවැරටිය වතු කලාපය
1,200,000
1,000,000
800,000
600,000
400,000
200,000
0
2019 2020 2021 2022 2023 2024
ඵලදාව








පස් අවුරුදු පොල් නිෂ්පාදන ප්‍රගතිය

වර්ෂය	පොල් අස්වැන්න (ගෙඩි)	වෙනස	ඵලදරන ගස් සංඛ්‍යාව	පොල් ගසක සාමාන්‍ය ගෙඩි ගණන	ශ්‍රී ලංකාවේ පොල් නිෂ්පාදනය (මිලියන)	වෙනස %
2020	11,943,494	-26%	273,429	44	2,818	-10%
2021	14,715,763	19%	275,267	53	3,383	17%
2022	15,172,334	3%	277,190	55	3,351	-1%
2023	11,697,511	-30%	271,411	43	2,944	-14%
2024	10,359,584	-13	273,215	38	2,650	-11%

පොල් මිලෙහි වෙළඳ පොළ මිල උච්චාවචනය වීම

අතීත තොරතුරු පරිශීලනය කිරීමේදී ද දක්නට ලැබෙන තත්ත්වයක් වනුයේ වෙළඳපොළ තුළ සෑම භාණ්ඩයකම හා නිෂ්පාදනයක මිල ඉහළ යාම් තුළ දිගුකාලීනව පොල් මිලෙහි පමණක් විශාල උච්චාවචනයක් සිදු නොවීම වේ. මෙම ගැටළුව හලාවත වැවිලි සමාගමට පමණක් නොව සමස්ථ පොල් කර්මාන්තයටම අහිතකර ලෙසින් බලපාන ලදී. නමුත් 2023 වර්ෂයේ පොල් ගෙඩියක සාමාන්‍ය අලෙවි වටිනාකමට සාපේක්ෂව පාදක වර්ෂයේදී සැලකිය යුතු අගයකින් ඉහළ යන ලදී. එය සමාගමට හිතකර අයුරින් ලාභය ඉහළ නංවා ගැනීමට උපකාරී වූහ. එම වෙනස්වීම් පහත පරිදි දැක්විය හැකිය.



2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේදී රටෙහි සමස්ථ පොල් නිෂ්පාදනයද අඩු අගයක් ගත් අතර, අස්වනු වල වීම පසුබෑමත් සමඟ පොල් ගෙඩියක විකුණුම් මිල රුපියල් 82.96 ක් දක්වා පාදක වර්ෂයේදී ඉහළ යන ලදී.

කෘෂිකාර්මික සංවර්ධන සැලැස්ම

හලාවත වැවිලි සමාගමෙහි කෘෂිකාර්මික සංවර්ධන සැලැස්ම යටතේ සෑම විටම පාදක වර්ෂයේ අත්පත් කරගෙන තිබෙන ප්‍රගතිය ඉක්මවා ඉහළ කාර්ය සාධනයක් බලාපොරොත්තු විය. එහිදී පොල් පැළ වගාව ව්‍යාප්ත කිරීම, අතුරු බෝග වගා කිරීම, සත්ත්ව පාලනය, අගය එකතු කරනු ලබන නිෂ්පාදන පුළුල් කිරීම වෙනත් සංවර්ධන ව්‍යාපෘතීන් ආරම්භ කිරීම වැනි දෑ ක්‍රියාත්මක කරනු ලැබීය.

1.පොල් යටි වගාවන් ව්‍යාප්ත කිරීම

හලාවත වැවිලි සමාගමෙහි ආරම්භයේ සිටම නිසි පැළ ඝණත්වය පැවතිය යුතු ගස් / පැළ සංඛ්‍යාවෙන් හරි අඩක් පමණ වතුවල භෞතිකව දක්නට ලැබූ නමුත් ක්‍රමිකව වීම පැළ ඝණත්වය මේ වන විට අක්කරයකට පැළ 47 දක්වා වැඩිකර ගැනීමට සමත් විය. පාදක වර්ෂයේදී ද සමස්ත වගාව ඇතුළත පොල් පැළ 3,113 ක් සිටුවීමට කටයුතු කරනු ලැබීය. පොල් පැළ වගාවන්ට අදාළ තොරතුරු පහත පරිදි වේ.

වතු කලාපය	පාදක වර්ෂයේ සිටුවූ පොල් පැළ ප්‍රමාණය	වර්ෂ අවසානයේ පැවැති පොල් පැළ වගා ප්‍රමාණය (හෙක්.)	වර්ෂ අවසානයේ පැළ ප්‍රමාණය	පැළ වගාව මුළු වගාවේ ප්‍රතිශතයක් (%) ලෙසට
බිංගිරිය		92.50	10,479	13%
හලාවත	100	14.68	1,136	3%
දිවුලපිටිය	-	21.50	3,683	5%
මාදම්පේ	-	59.50	7,690	10%
මංගලවප්‍රිය	490	22.25	3,188	7%
නිකවැරටිය	-	7.02	988	2%
පළුගස්වැව	750	40.00	4,875	6%
තම්බපණ්නි	1,773	59.00	4,983	14%
එකතුව	**3,113**	**316.45**	**37,022**	**8%**

2. බෝග විවිධාංගීකරණය

2.1. සමාගම විසින් සිදුකරනු ලබන අතුරු බෝග

හලාවත වැවිලි සමාගමට අයත් දිවුලපිටිය, මාදම්පේ, හලාවත යන වතු කලාපවල බෝග විවිධාංගීකරණය සැලකිය යුතු මට්ටමින් දීර්ඝ කාලයක සිට සිදුකර තිබුණි. පාදක වර්ෂයේදී ද පාංශු යෝග්‍යතාවය හඳුනා ගනිමින් ඌණ භාවිත ඉඩම් තුළ කුරුඳු බෝගය අක්කර 10.65 ක අලුතෙන් ව්‍යාප්ත කිරීමට සමත්විය.

වත්ත	කජු (හෙක්.)	ගම්මිරිස් (හෙක්.)	රඹුටන් (හෙක්.)	ඩ්‍රැගන් ෆෘට් (හෙක්.)	කුරුඳු (හෙක්.)	අඹ (හෙක්.)	එළවළු (හෙක්.)	කොසෙල් (හෙක්.)
තම්බපණ්නි	445.75	-	-	-	-	-	4	-
මංගලවිළිය	314.64	-	-	-	-	-	-	-
බිංගිරිය	20.00	-	-	-	0.81	-	-	-
නිකවැරටිය	18.20	-	-	-	-	-	-	-
හලාවත	49.96	-	-	-	1.85	11.70	-	-
මාදම්පේ	6.07	-	-	2.12	-	1.60	-	1.00
දිවුලපිටිය	-	16.06	20.00	-	13.63	-	-	-
පලුගස්වැව	-	-	-	0.50	-	-	-	-
එකතුව	**845.62**	**16.06**	**20.00**	**2.62**	**16.29**	**13.30**	**4.00**	**1.00**

2.2.පෞද්ගලික ව්‍යවසායකයින් සමඟ එක්ව සිදු කරනු ලබන බෝග විවිධාංගීකරණය

සමාගමෙහි කළමනාකාරීත්ව තීරණයකට අනුව අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතීන් සහිතව ඌණ භාවිත ඉඩම් කෙටිකාලීන සහ අර්ධ බහු වාර්ෂික බෝග වගාවන් සඳහා උපරිම පස් අවුරුදු කාලයක් වෙනුවෙන් පෞද්ගලික ව්‍යවසායකයන්හට අතුරු බදු දීමේ ව්‍යාපෘතියක් 2020 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන ලදී.

මෙම ක්‍රියාවලියේදී සමාගම විසින් 2024 වර්ෂ අවසානය වනවිට පොල් වගා ඉඩම් තුළින් සහ ඌණ භාවිත ඉඩම් යන දෙබාණ්ඩයේම අක්කර 1,412 ක ප්‍රමාණයක් අතුරු බදුදීම් සිදුකර තිබුණි. එතුළින් අක්කර 133 ක ප්‍රමාණයක් පාදක වර්ෂයට අදාලව බදු දී තිබුණි. 2024.12.31 දිනට රුපියල් 8,270,177.73 ක අමතර අදායමක් හලාවත වැවිලි සමාගමට අත්කර දීමට හැකි වූ අතර, එම ඉඩම් දෙවන පාර්ශවයක් ලවා නඩත්තු වීම තුළින් ඉපැයූ ආදායම හා සමාන වියදමක් සමාගමට ඉතිරි වූ බවද දැක්විය හැකිය.

3.පොල් වගාවට ජල සම්පාදනය

2022 සහ 2023 යන වර්ෂයන් තුළ දී අක්කර 100 ක බිංදු ජල සම්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලද අතර, පාදක වර්ෂයේදී රස්නායකපුර පිහිටි සීනුගල නැමැති වත්තේ වගාකොට ඇති TJC අඹ වගාවේ අක්කර 10 කට බිංදු ජල සම්පාදන කටයුතු සිදුකිරීම ආරම්භ කරන ලද නමුත් වැඩකටයුතු අවසන් කිරීමට අපොහොසත් විය.

4.නිෂ්පාදන විවිධාංගීකරණය

හලාවත වැවිලි සමාගමෙහි ප්‍රධානතම අදායම පොල් අලෙවියෙන් ලබා ගන්නා අතර, වගකිව යුතු රාජ්‍ය සමාගමක් වශයෙන් පාරිභෝගිකයා වෙත ගුණාත්වයෙන් යුතු පොල් ආශ්‍රිත නිමි අගය එකතු කරන ලද නිෂ්පාදන වශයෙන් දිලීර ආසාදනයෙන් සහ **ඇෆ්ලටොක්සීන්** විෂ සංයෝග ඇතුළත් නොවන නෑඹුල් පොල් තෙල් නිෂ්පාදනය සහ පිරිසිදු පොල් පැණි නිෂ්පාදනය කිරීමක් කරනු ලබයි.
ඊට අමතරව කජු පිරිසැකසුම් ක්‍රියාවලිය තුළින් ගුණාත්වයෙන් යුතුව කෘතිම රසකාරක වලින් තොරව කජු ද, සත්ත්ව පාලන ව්‍යාපෘතීන් තුළින් නිෂ්පාදනය කරනු ලබන මී කිරි සහ එළකිරි, යෝගට් ද නිෂ්පාදන ක්‍රියාවලිය තුළ සිදු වෙමින් පවතී. 2024 වර්ෂයේ නිෂ්පාදන ධාරිතාවය පහත පරිදි වේ.

ව්‍යාපෘතිය	නිෂ්පාදන මාදිලිය	ප්‍රමාණය	ධාරිතාවය
පොල් තෙල් නිෂ්පාදනය	බෝතල්	12,575	11,905 (ලීටර්)
පිරිසැකසුම් කරන ලද කජු	කි.ග්‍රෑ	1,928	1,928 (කි.ග්‍රෑ)
පොල් පැණි	බෝතල්	10,845	10,845 (මි.ලී 750)
මී කිරි	හට්ටි	17,937	15,813 (ලීටර්)
ගිතෙල්	බෝතල් (මි.ලී 200)	595	119 (ලීටර්)
යෝගට්	කප්ස්	19,670	1,574 (මි.ලී 80)

5. වැඩි දියුණු කරන ලද 'කප්රුවන' පොල් පැළ නිෂ්පාදනය

හලාවත වැවිලි සමාගම සහ ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනය 2012 වර්ෂයේදී අත්සන් කරනු ලැබූ ද්විපාර්ශ්වික අවබෝධතා ගිවිසුමක් මත බිංගිරිය වතු කලාපයේ කිණියම නැමැති පොල් වත්ත ඇතුළත අක්කර 148 ක භූමියක් තුළ 'කප්රුවන' නැමැති ජානමය වශයෙන් වැඩිදියුණු කරනු ලැබ ඇති බීජ පොල් නිෂ්පාදනයට බීජ පොල් උයනක් ඇති කරන ලදී.

වාණිජමය වශයෙන් ආර්ථික ලාභ ලැබීම වෙනුවෙන් සහ ගුණාත්වයෙන් යුතු උසස් ප්‍රභේදයෙන් බීජ පොල් හෝ පැළ නිකුත් කිරීම මූලික අරමුණ කරමින් මෙහි බීජ පොල් නිෂ්පාදන කටයුතු සිදුවේ. පළමු වරට 2024 වර්ෂයේදී බීජ පොල් නිෂ්පාදන කටයුතු වාණිජමය වශයෙන් ආරම්භ කරනු ලැබූ අතර, 'කප්රුවන' ප්‍රභේදයට අයත් පොල් පර්යේෂණ ආයතනය විසින් සහතික කරන ලද බඳුන් ගත පොල් පැළ 2065 ක් දීපව්‍යාප්තව අලෙවි කිරීමට හැකි විය.

6.කජු වගාව

වියළි කජු නිෂ්පාදනයේ ප්‍රමුඛ සමාගමක් වශයෙන් හලාවත වැවිලි සමාගම නම් කළ හැකිය. අක්කර 2000 ට වැඩි කජු වගා භූමි ප්‍රමාණයක් සතු හලාවත වැවිලි සමාගම විසින් පෙර වර්ෂයකදී ශ්‍රී ලංකාවේ කජු නිෂ්පාදනයේ ප්‍රමුඛයා ලෙසින් කිරුළ පැළඳීමට ද හැකි විය.

අස්වනු නෙළන කාල වකවානුව තුළ පවතින කාළගුණික තත්ත්වය මත කජු අස්වනු ධාරිතාවය විචල්‍ය වේ. විශේෂයෙන් පුත්තලම දිස්ත්‍රික්කය ඇතුළත දේශගුණික රටාව මීට වසර කිහිපයක පැවැති තත්ත්වයට වඩා වෙනස් හැසිරීමක් පෙන්නුම් කිරීම මත බොහොමයක් අවස්ථාවන්හි දී කජු මල් පිපෙන කාලයන්හි දී වැසි තත්ත්වයන් ඇති වී මල් හැලීම වැඩි වශයෙන් දක්නට ලැබෙයි.


කජු අස්වනු වික් රැස් කිරීමට වතුවල සිටින කම්කරුවන් ද සීමා සහිත වීම මත 2023 වර්ෂයේදී පළමු වරට කජු අස්වැන්න සමඟ කජු ගස් බදු දීමේ ක්‍රියාවලියක් කළමනාකාරිත්වය විසින් ක්‍රියාවට නංවන ලදී. එම ක්‍රියාවලියම පාදක වර්ෂය තුළ ද ක්‍රියාත්මක කරන ලදී.

හලාවත වැවිලි සමාගම දීර්ඝ කාලීනව වගා කොට ඇති අක්කර 2000 ක කජු වගාව කාබනික වගාවක් වශයෙන් වතු ඒකක 30 ක පවත්වා ගෙන යනු ලැබේ. ඒ තුළින් 2021 වර්ෂයේදී විශාලතම වතු ඒකක 06 ක කජු වගාව සඳහා කාබනික සන්නාමය හිමිකරගන්නා ලදී. පසුව වාර්ෂිකව එම වගාවන් ගුණාත්මකව පාලනය කරමින් සෑම වර්ෂයකදීම කාබනික සහතිකය ලබා ගැනීමට සමත් විය.

7. සත්ත්ව පාලනය

පොල් පැළ සිටුවා අවුරුදු 15 ක් පමණ ගතවූ පසුව එම වගා ඉඩම ඇතුළත සත්ත්ව පාලන කටයුතු ඉතාමත් පහසුවෙන් සිදුකළ හැකි වේ. එනම් පැළ වගාවක් නොමැති ඉඩමක පහසුවෙන් සත්ත්ව පාලන කටයුතු සිදුකළ හැකි වේ.

හලාවත වැවිලි සමාගම විසින් තෝරා ගන්නා ලද පහසුකම් ඇති වතු කිහිපයක දීර්ඝ කාලයක සිට සත්ත්ව පාලන කටයුතු මැනවින් සිදුකරමින් පවතී. එහිදී මී ගව පාලන ව්‍යාපෘතිය පලුගස්වැව වත්ත මූලික කරමින්ද, බැටළු පාලන ව්‍යාපෘති බිංගිරිය කිණියම වත්ත සහ මාදම්පේ හීම්මැලියාගාර වත්ත මූලික කරමින්ද ව්‍යාප්තව ඇත. වර්තමානය වන විට එම ව්‍යාපෘතීන්ට අමතරව තම්බපණ්ණි වතු කොට්ඨාශයේ එළු පාලන ව්‍යාපෘතීන් ද ආරම්භ කොට ඇත.




Oil
Treacle
Copra
Coconut
Fresh Nut
Husk
Shell

සමාගමෙහි නිෂ්පාදිත අලෙවිකරණ යාන්ත්‍රණය

හලාවත වැවිලි සමාගම පොල් වගාව මූලික කර ගනිමින් ක්‍රියාත්මක වන වැවිලි සමාගමක් වන හෙයින් ආයතනයේ ප්‍රධාන ආදායම් මාර්ගය පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන අලෙවිය තුළින් ලබා ගනී. පොල් අලෙවි කිරීම ඉතාමත් විනිවිදභාවයකින් යුතුව සෑම නිෂ්පාදන භාණ්ඩයක් සඳහාම ඉහළ විකුණුම් වටිනාකමක් ලබා ගැනීමේ අරමුණු පෙර දැරිව පාදක වාර්ෂය තුළ දී ද සිදු කරනු ලැබීය.

හලාවත වැවිලි සමාගම විසින් නිෂ්පාදන විවිධාංගීකරණය යටතේ එකිනෙකට බද්ධ වූ වෙනස් නිෂ්පාදනයන් අලෙවිය සඳහා වෙළඳපොළට ඉදිරිපත් කරනු ලැබීය.

01. මිල ගණන් කැඳවීමකට යටත්ව භාණ්ඩ හා නිෂ්පාදන අලෙවිය

1.1. පොල් අලෙවිය

ආයතනයේ සෑම නිෂ්පාදනයක් ටෙන්ඩර් ක්‍රමවේදයක් යටතේ සිදුකරනු ලැබීය. පොල් අලෙවිය වතු කාර්යාල මඟින් සහ ප්‍රධාන කාර්යාලය මඟින් ප්‍රධානව ටෙන්ඩර් කැඳවා 'පොල් පොළ' නමින් හඳුන්වන ටෙන්ඩර් ක්‍රමවේදය යටතේ වර්ෂය පුරාම අලෙවියට ඉදිරිපත් කරනු ලබයි. සතියේ සඳුදා සිට බ්‍රහස්පතින්දා දක්වා දිනකට වතු කලාප 02 බැගින් හා සිකුරාදා දින ප්‍රධාන කාර්යාලීය පොල් පොළ ටෙන්ඩර් පටිපාටිය තුළින් පොල් අලෙවි කරනු ලබන අතර, ඒ තුළින් ඕනෑම අවශ්‍යතාවයකට අනුව සුදුසු පොල් ප්‍රමාණවත් පරිදි ගැණුම්කරුවන්හට ලබා ගැනීමට හැකියාව ඇත. කොප්පරා අලෙවි කිරීමේදී ද මෙම ක්‍රමවේදය ක්‍රියාත්මක වේ.

1.2. පළතුරු බෝග අලෙවිය

කජු සහ රඹුටන් වැනි බෝගයන් අස්වනු හටගැනීම ආරම්භයත් සමඟ අස්වනු නෙලා ගැනීමට ගස් ලෙසින් බදු දීමක් කරනු ලබයි. අඹ සහ ඩ්‍රැගන් ෆෘට් වැනි බෝගයන්ගේ අස්වනු බර අනුව ටෙන්ඩර් කර ලබා දෙනු ලබයි.

1.3. කුළු බඩු බෝග

කුළු බඩු බෝග වශයෙන් කුරුඳු සහ ගම්මිරිස් යන බෝගයන් වගා කොට ඇත. ගම්මිරිස් පඳුරු අනුව බදු දීමක් ද, කුරුඳු සාම්ප්‍රදායික ලෙසින් අස්වනුවලින් අර්ධයක වටිනාකම ලබා ගැනීම යටතේ අලෙවි කිරීම් සිදුකරයි.

1.4. දැව අලෙවිය

හලාවත වැවිලි සමාගමෙහි අනුමත පස් අවුරුදු 'වන කළමනාකරණ' සැලැස්මට අනුව වාර්ෂික දැව හෙලීම සිදු කෙරේ. කෙසේ නමුත් අවසන් කාර්තුව තුළදී පැවැති මැතිවරණ හේතුවෙන් 'වන කළමනාකරණ' සැලැස්ම නියාමනය කරනු ලබන ආයතන නිලධාරීන් නොපැමිණීම වර්ෂ අවසානයත් සමඟ සිදුවූ හෙයින් පාදක වර්ෂයේදී දැව ගස් හෙලීමක් සිදු නොවීය.

02. අලෙවි නියෝජිතයින් පත් කිරීම මඟින්

හලාවත වැවිලි සමාගම විසින් දිවයිනේ බොහෝ ප්‍රදේශ ආවරණය වන පරිදි පත් කර ඇති අලෙවි නියෝජිතයින් හරහා ද සමාගමෙහි අගය එකතු කළ නිෂ්පාදන පාරිභෝගික ජනතාව වෙත අලෙවි කිරීමක් කරනු ලබයි.

03. අලෙවිසැල් මඟින්

වැවිලි සමාගමේ හලාවත ප්‍රධාන කාර්යාලය, කොළඹ ශාඛා කාර්යාලය පරිශ්‍රයන්හි පිහිටි අලෙවිසැල් මඟින් සහ පලුගස්වැව වත්තේ රාජකදළුව ප්‍රධාන ගේට්ටුව අසල පිහිටි ප්‍රධාන අලෙවිසැල හරහා අපගේ අගය එකතු කළ නිෂ්පාදිත පාරිභෝගික ජනතාව වෙත අලෙවි කිරීමද සිදුකරනු ලබයි.

04. සුභ සාධක සංගම් වෙත භාණ්ඩ අලෙවි කිරීම

බොහෝ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනවල සුභ සාධක සංගම් සම්බන්ධීකරණය කර ගනිමින් අපගේ අගය එකතු කළ නිෂ්පාදිත අලෙවි කිරීමේ ක්‍රියාදාමයන් අලෙවි අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබයි. මෙම ක්‍රියාදාමයන් තුළින් අපගේ නිෂ්පාදිත පාරිභෝගික ජනතාවට සෘජුවම මිලදී ගැනීමේ හැකියාව පවතී.


05. මාර්ගගත අලෙවිකරණය


වෙළඳපොළ තුළ ඉතා ශීඝ්‍රයෙන් ප්‍රචලිත වන මාර්ගගත අලෙවිකරණය (Online Marketing) භාවිතා කරමින් හලාවත වැවිලි සමාගමෙහි නිෂ්පාදන ඇණවුම් කිරීමට අවස්ථාව ලබා දී ඇත. ඒ සඳහා Chilaw Plantations Limited-Kapruka Sewana ෆෙස්බුක් පිටුව හරහා සහ පාරිභෝගික සේවා අංකයක් හරහා ද පාරිභෝගික ජනතාවට අවශ්‍ය නිෂ්පාදිත ඇණවුම් කිරීමේ පහසුකම් ලබා දීමට සැලසුම් කර ඇත.


පාරිසරික සාධක වල බලපෑම්


01. වාර්ෂික වර්ෂාපතන රටාව


හලාවත වැවිලි සමාගම සතු ඉඩම් වැඩි ප්‍රමාණයක් වියළි දේශගුණික කලාපය ඇතුළත පිහිටා තිබේ. මුළු ඉඩම් ප්‍රතිශතයෙන් 54 % ක් ඍජුවම පුත්තලම දිස්ත්‍රික්කය ඇතුළත ද, කුරුණෑගල දිස්ත්‍රික්කය ඇතුළත වූව ද වියළි දේශගුණික තත්වයක් පෙන්නුම් කරන කොබෙයිගනේ සහ රස්නායකපුර ප්‍රදේශ අවට ද පිහිටා ඇත. පොල් ශාකය වසර මුළුල්ලේ අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කරමින් අස්වනු ලබාදෙනු ලබන බෝගයක් හෙයින් වර්ෂාපතනයේ තීව්‍රතාවයට වඩා වර්ෂාපතනයේ පැතිරීම පාංශු තෙතමනය ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගැනීමට ඉවහල් වේ.




















02. පාරිසරික උෂ්ණත්වය

පාරිසරික උෂ්ණත්වය පොල් මලෙහි නිෂ්පාදනය කරන පරාගවල ජීවී ගුණය පවත්වා ගැනීමට ඉතාමත් වැදගත් වේ. පොල් ශාකයේ ක්‍රියාකාරීත්වයට ප්‍රශස්ථ උෂ්ණත්වය $29C^0$ වන අතර පරිසර උෂ්ණත්වය ක්‍රමිකව ඉහළ යනවිට පොල් මලෙහි හටගන්නා පරාගවල ජීවී ගුණය අඩු වේ. එම අජීවී හෝ මද වශයෙන් සක්‍රීය පරාග, පරාගන ක්‍රියාවලියට භාජනය වූව ද ඵල හට ගැනීමට දැඩි අහිතකර බලපෑමක් ඇතිකරයි.

03. පසේ ස්වභාවය

වැවිලි සමාගමට අයත් මුහුදු බඩ සීමාවේ පිහිටි වතුවල වැලි බහුල පසක් පවතී. මෙම පසෙහි වාසි අවාසි යන දෙකාණ්ඩයම ඇත. පසෙහි භූගත ජල මට්ටම වර්ෂා කාලයන්හි දී වඩාත් ඉහළින් පිහිටන අතර, කෙටි වියළි තත්ත්වයක දී භූගත ජල මට්ටම නැවත පහළ යයි. මෙම සංසිද්ධිය හේතුවෙන් පොල් ශාකයේ මූල මණ්ඩලය වඩාත් ගැඹුරට නොගොස් පාංශු මතු පිට උප ස්ථරය තුළ තිරස් ආකාරයෙන් වැඩෙනු ලැබෙයි. වැඩි මූල සංඛ්‍යාවක් පිහිටා ඇත.

කුරුණෑගල සහ ගම්පහ යන දිස්ත්‍රික්කයන් ඇතුළත පිහිටි වතුවල පස වැලිමය ලොම් පස් කාණ්ඩයේ සිට රෙඩ් යෙලෝ පොඩ්සොලික් පස් කාණ්ඩය දක්වා ව්‍යාප්තව ඇත.

පරිසරය ආරක්ෂා කරමින් තිරසර කෘෂිකර්මාන්තයේ නියැලීම

සමාගම විසින් පෙව සම්පත් තිරසර ලෙසින් ප්‍රයෝජනයට ගනිමින් කටයුතු කරනු ලබයි. එහි දී වතු ඒකකවල සිටුවා ඇති බෝගයන්ට හානියක් නොවන පරිදි සත්ත්ව පාලන කටයුතු කරගෙන යාමට වතු කම්කරුවන්හට සහ බාහිර කිරි ගොවීන්ට අවස්ථාවක් ලබාදී ඇත. ඒ තුළින් සමාගමට සෘජු මූල්‍යමය ලාභයක් නොලැබුන ද, වල් මර්ධන කටයුතු ගවයින් මඟින් යම්තාක් දුරට සිදුවීම, පසට නිරන්තරයෙන් ගොම සහ ගව මූත්‍රා එකතුවීම වැනි කටයුතු තුළින් පසෙහි පෝෂක මට්ටම සහ පසෙහි කාබනික මට්ටම ඉහළ යාම පසේ සරුභාවය ඉහළ යාමට හේතු සාධක වේ. එය වක්‍රාකාර ප්‍රතිලාභයක් ලෙස දැක්විය හැකිය.

මීට අමතරව පොල් වගාවට සෘජුවම කාබනික පොහොර යෙදීම, රසායනික වල් නාශක භාවිතය අවම කිරීම, නයිට්‍රජන් තිරකාරක පෙව වැටවල් පවත්වා ගැනීම, පොල් අතු වසුන් යෙදීම, පොල් ලෙලි වසුන් යෙදීම, සහ පියුරේරියා වැනි පෙවීය ආවරණ බෝග වගාව වැනි කරුණු පසෙහි පෙවීය ගුණය ඉහළ යාමට හේතු පාදක වී ඇත.

සේවක අභිප්‍රේරණය වෙනුවෙන් දිරි දීමනා සහිතව ලාභාංශ දීම

වැවිලි සමාගමෙහි අඛණ්ඩ දියුණුව වෙනුවෙන් වටිනාම සම්පත ලෙසින් මානව සම්පත හඳුන්වා දිය හැකිය. මානව සම්පත නිසි ලෙස හැසිරවීමේ දී භෞතික සහ පෙව සම්පත් නිසි ලෙසින් කළමනාකරණය වේ. වාර්ෂිකව සේවකයින්ගේ කාර්ය සාධනය මත සේවක දිරි දීමනා වශයෙන් සහ සේවකයින්ගේ කැපවීම අගය කිරීම වස් බදු පෙර ලාභයෙන් 20% ක ලාභයක් සියලුම සේවකයින් අතර පාදක වර්ෂයේදී ලබාදීමට හැකිවීම රාජ්‍ය සමාගමක් වශයෙන් අප ලැබූ ජයග්‍රහණයකි.

මීට අමතරව පොල් අස්වනු එකතු කිරීමේදී වැටුණු පොල් එකතු කරන වතු කම්කරුවන්ට සහ මුරකරුවන්ට එක් ගෙඩියකට රුපියල් 1.50 ක අමතර දීමනාවක්ද කරනු ලැබීය. අමතරව වතු නිලධාරීන්ට සහ වතු සේවකයින් වෙත ලබා ගනු ලබන අස්වනු ප්‍රමාණය මත මාසිකව 2% ක දිරි දීමනාවක් ද ලබාදීම ද සුවිශේෂී වේ.

වාර්ෂිකව සෑම සේවකයෙකුටම මාසිකව මාළු පොල් දීමනාව ලබාදීම, වතු කම්කරු ප්‍රජාව ද ඇතුළුව සියලුම සේවකයින් රක්ෂණය කිරීම හා රක්ෂණ වන්දි ගෙවීම, අඩු පොළී අනුපාත යටතේ ආපදා ණය ලබාදීම සහ පාදක වර්ෂයේ සිට ආපදා ණය සීමාව ඉහළ නැංවීම, වතු සේවකයින්ගේ වාර්ෂික විනෝද චාරිකාව සඳහා මූල්‍ය අනුග්‍රහය ලබා දීම සහ අනෙකුත් සුභ සාධක ක්‍රියාකාරකම් දැක්විය හැකිය. මෙය මානව සම්පත් කළමනාකරණ උපයාමාර්ග සේවක අභිප්‍රේරණය සඳහා විශාල වශයෙන් දායක වී ඇති අතර, සමාගමේ ඵලදායීතාවය ඉහළ නැංවීම හා සමාගම කෙරෙහි ඇති බැඳියාව වර්ධනය වීමට අදාළ කරුණු හේතු පාදක වී ඇත.

අපගේ සමාජීය වගකීම්

හලාවත වැවිලි සමාගම නිරන්තරයෙන් බාහිර ප්‍රජාව සමඟ සහජීවන සම්බන්ධතා ගොඩනගමින් තම ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලබයි. සමාගමට ඇති ආගමික බැඳීම් මත වාර්ෂිකව වෙහෙර විහාර, සිද්ධස්ථාන මඟින් ඉල්ලුම් කරනු ලබන පහසුකම් සම්පාදනය කිරීම, දුප්පත් පවුල් සඳහා තම නිවෙස් පිළිසකර කරගැනීමේ දී යම් සීමාවන්ට අනුව පොල් ගස් ලබා දීම, ආගමික උත්සව සඳහා විශේෂයෙන් පෙරහැරවල් වෙනුවෙන් කොප්පරා ලබා දීම් පාදක වර්ෂය තුළදී ද අඛණ්ඩව සිදුකරන ලදී.

රාජ්‍ය සම්පත් නිසි ලෙස භාවිතා කරමින් ආර්ථිකමය වශයෙන් පාදක වර්ෂය තුළදී ද ඉහළ ප්‍රගතියක් අත්පත් කර ගැනීමට අප සමත්වීම සුවිශේෂී වේ. සමස්ථ වශයෙන් රටෙහි පොල් නිෂ්පාදනය අඩු මට්ටමක පැවතියද අප විසින් ක්‍රියාත්මක කරනු ලැබූ විධිමත් කළමනාකරණ සැලසුම් හේතුවෙන් ආයතනයේ මූල්‍ය ප්‍රවාහය ශක්තිමත් අයුරින් පවත්වාගෙන යාමට අපට හැකි විය.

හලාවත වැවිලි සමාගම ලැබූ ජයග්‍රහණ

හලාවත වැවිලි සමාගම **ICONIC AWARD** උත්සවය තුළ දී වැවිලි අංශයෙන් ශ්‍රී ලංකාවේ හොඳම වැවිලි සමාගම ලෙසින් (**THE BEST PLANTATION COMPANY**) පාදක වර්ෂයේදී පිදුම් ලැබූ අතර, එය සමාගමෙහි විශිෂ්ඨත්වය මනාවට පිළිඹිබු කරනු ලබන අවස්ථාවක් වන්නේය.







අපගේ ඒකායන අභිලාෂය

හලාවත වැවිලි සමාගම වාර්ෂිකව පෙර වර්ෂයට සාපේක්ෂව මූල්‍යමය වශයෙන් සහ භෞතිකමය වශයෙන් වර්ධනයක් අත්පත් කරගනිමින් ලැබෙන්නා වූ ප්‍රතිලාභ සෘජු සහ වක්‍ර ලෙසින් රටෙහි පාරිභෝගිකයාට ද තුක්ති විඳීමටත් ඒ තුළින් ඔවුන්ගේ ජීවන බරට යම් සහනයක් අපගේ ගුණාත්මක නිෂ්පාදන හරහා ලබාදීම අපගේ ඒකායන අභිලාෂය වේ.

අපගේ විශේෂ අවස්ථාවන්

හලාවත වැවිලි සමාගම විසින් සංවිධානය කරන ලද ලේ දන්දීමේ පුණ්‍ය උත්සවය

















මූල්‍ය සමාලෝචනය

මෙම වාර්ෂික වාර්තාවේ කොටසක් ලෙස ඇතුළත් කර ඇති සමාගමේ මූල්‍ය ප්‍රකාශන, සමාලෝචනයට භාජනය වන වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය තත්ත්වය සහ කාර්ය සාධනය පිළිබඳ පුළුල් දැක්මක් ඉදිරිපත් කරයි. මූල්‍ය සමාලෝචන අංශය මෙම ප්‍රතිඵල පිළිබඳ විශ්ලේෂණාත්මක දළ විග්‍රහයක් සපයන අතර, ප්‍රධාන මූල්‍ය වර්ධනයන්, ප්‍රවණතා සහ සමාගමේ සමස්ත මූල්‍ය තත්ත්වය ඉස්මතු කරයි.

සමාගමේ මූල්‍ය කාර්ය සාධනය සැකවින්

	2024	2023	වෙනස		ප්‍රධාන සාධක
			රු. මිලි.	%	
පොල් ගෙඩි (මිලි.)	10.36	11.73	(1.37)	(11.7%)	වියළි හා අසාමාන්‍ය කාලගුණික තත්ත්වයන් සහ පසුගිය වසරවල පොහොර හිඟය
සාමාන්‍ය පොල් ගෙඩියක ශුද්ධ විකුණුම් මිල (රු.)	82.96	64.20	18.76	29.22%	
සාමාන්‍ය පොල් ගෙඩියක ශුද්ධ විකුණුම් මිල (රු.)	57.82	45.67	12.15	26.6%	පොල් නිෂ්පාදනය අඩුවීම සහ නිෂ්පාදන පිරිවැය ඉහළ යාම.
අයභාරය (රු. මිලි.)	961.59	885.35	76.24	8.6%	ප්‍රධාන වශයෙන් පොල් විකුණුම් මිලෙහි වැඩිවීම
විකුණුම් පිරිවැය (රු. මිලි.)	722.20	657.57	64.63	9.8%	පොල් නිෂ්පාදන පිරිවැය වැඩිවීම සහ තවාන් නිෂ්පාදන පිරිවැය වැඩිවීම.
අනෙකුත් ආදායම් (රු. මිලි.)	72.10	94.01	(21.91)	(23%)	වෙනත් ආදායම් අඩුවීම (සටහන් අංක 21)
පරිපාලන හා පොදු වියදම් (රු. මිලි.)	179.50	205.07	(25.57)	(12.5%)	පරිපාලන වියදම් අඩුවීම.
මූල්‍ය ආදායම් (රු. මිලි.)	118.30	237.39	(119.09)	(50.17%)	පොලී අනුපාත අඩුවීම.
මූල්‍ය පිරිවැය (රු. මිලි.)	78.70	61.65	17.05	27.66%	වාර්ෂික දළ දේශීය නිෂ්පාදිත අවධමනකය මත පදනම්ව රජයේ කල්බදු කුලිය වැඩිවීම.

අයභාරය


සමාලෝචිත 2024 වසරේදී, සමාගම (CPL) රුපියල් මිලියන 961.59 ක අයභාරයක් වාර්තා කළ අතර 2023 දී එය රුපියල් මිලියන 885.35 ක් විය. ඒ අනුව මෙම වසරේ දී රුපියල් මිලියන 76.24 ක වැඩිවීමක් වාර්තා කරයි. (9% ක වැඩිවීමකි). මෙම හිතකර විචලනයට ප්‍රධාන හේතුව වූයේ 2023 දී රුපියල් 64.20 ක් වූ ශුද්ධ විකුණුම් සාමාන්‍යය (NSA) 2024 දී රුපියල් 82.96 දක්වා වර්ධනය වීමයි.


පොල් අංශය මගින් ආදායමට ප්‍රධාන දායකත්වය ලබා දුන් අතර, එය පසුගිය වසරේ රුපියල් මිලියන 770.00 ක සිට රුපියල් මිලියන 868.92 දක්වා 13% ක වැඩිවීමක් පිළිබිඹු කරයි. පොල් වලින් ලැබෙන ආදායම මුළු ආදායමෙන් 90% කි.

ආදායමේ සංයුතිය

	2024 රු. මිලි.	2023 රු. මිලි.
පොල්	868.92	770.00
කජු	41.66	64.05
පශු සම්පත්	23.34	18.72
වෙනත් බෝග හා ව්‍යාපෘති	27.67	32.58
	961.59	885.35

ආදායම් සංයුතිය






පොල් අංශයේ කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂය තුළ සමාගම වාර්ෂික පොල් නිෂ්පාදනය ලෙස පොල් ගෙඩි 10,359,584 ක් වාර්තා කළේය. මෙය පෙර වසරට සාපේක්ෂව 11.67% ක අඩුවීමකි. පසුගිය වසර කිහිපය තුළ පැවති දේශගුණික විපර්යාස සහ පොහොර හිඟය මෙම නිෂ්පාදන අඩුවීම් කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතුවිය.

අස්වනු හිඟයක් පැවතියද, සමාගම පොල් ක්ෂේත්‍රය තුළින් රුපියල් මිලියන 259.20 ක දළ ලාභයක් උපයා ඇත. එය පසුගිය වසරේ වාර්තා වූ රුපියල් මිලියන 212.25 ට සාපේක්ෂව 22% ක ධනාත්මක විචලනයකි. මෙම සාධනීය තත්ත්වය ඇති කරගත හැකි වුයේ මෙම කාලය පුරාම පොල් ගෙඩියක් සඳහා ප්‍රශස්ත ශුද්ධ විකුණුම් සාමාන්‍යයක් පවත්වා ගනිමින් ගෙඩියක මිල රුපියල් 82 කට වඩා වැඩි අගයක් වාර්තා කිරීමෙනි.



දළ ලාභය

සමාගම 2023 වසරේදී වාර්තා කළ රුපියල් මිලියන 227.78 ක දළ ලාභය සමඟ සැසඳීමේදී, මෙම වසර සඳහා රුපියල් මිලියන 239.39 ක ලාභයක් වාර්තා කර ඇති අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව 5%ක වර්ධනයකි.

ආංශික දළ ලාභය

පොල් අංශය ප්‍රධාන දායකත්වය ලබා දෙමින්, පෙර වසරේ ඉපයූ රුපියල් මිලියන 212.25 ට සාපේක්ෂව ප්‍රවර්තන වර්ෂයේදී රුපියල් මිලියන 259.20 ක දළ ලාභයක් උපයා ඇත. කජු අංශය ද කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළ අතර, එහි ලාභය රුපියල් මිලියන 16.83 සිට රුපියල් මිලියන 24.19 දක්වා ඉහළ ගොස් ඇත. පශු සම්පත් අංශයේ මෙහෙයුම් තුළින් ලද දායකත්වය රුපියල් මිලියන 3.84 සිට රුපියල් මිලියන 5.91 ක් දක්වා ඉහළ ගොස් ඇත. කෙසේ වෙතත්, බීජ පැළ සහ තවාන් අංශය 2023 දී වාර්තා කළ රුපියල් මිලියන 7.81 ක අලාභය හා සසඳන විට රුපියල් මිලියන 54.97 ක දළ අලාභයක් වාර්තා කළ අතර, ප්‍රධාන වශයෙන් අලෙවි නොකළ සහ අධික ලෙස වැඩුණු පොල් පැළවල වට්නාකම ගිණුම් වාර්තා වලින් කපා හැරීම හේතුවෙන් මෙම අලාභය වාර්තා විය. අනෙකුත් භෝග සහ ව්‍යාපෘති රුපියල් මිලියන 5.06 ක දායකත්වයක් ලබා දී ඇත. එය පෙර වසරේ රුපියල් මිලියන 2.67 ට වඩා වර්ධනයක් පෙන්නුම් කරයි.

	2024 රු. මිලි.	2023 රු. මිලි.
පොල්	259.20	212.25
කජු	24.19	16.83
පශු සම්පත්	5.91	3.84
බීජ පැළ සහ තවාන්	(54.97)	(7.81)
වෙනත් භෝග හා වගාවන්	5.06	2.67
	239.39	227.78

බීජ පැළ හා තවාන් වල දළ අලාභය

2020 සහ 2022 වර්ෂ වල දී, හලාවත වැවිලි සමාගම තම සෑම වතු කලාපයකම මහා පරිමාණ පොල් පැළ තවාන් ස්ථාපිත කළේය. මෙම මුල පිරීම් වල අරමුණ වූයේ උසස් තත්ත්වයේ පොල් පැළ සඳහා අපේක්ෂිත ඉල්ලුම සපුරාලීමයි. කෙසේ වෙතත් COVID-19 වසංගතයේ අහිතකර බලපෑම් සහ ඉන් පසුව ඇති වූ ආර්ථික අර්බුදය හේතුවෙන් පොල් පැළ සඳහා වෙළඳපොළ ඉල්ලුම සැලකිය යුතු ලෙස පහත වැටිණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සැලකිය යුතු බීජ පැළ ප්‍රමාණයක් අලෙවි නොවී පැවතීම, ඉතිරි පොල් පැළ අධික ලෙස වර්ධනය වීමට හේතු වූ අතර ඒවා රෝපණය කිරීමට නුසුදුසු විය. එම නිසා නිසි ගිණුම්කරණ පිළිවෙත්වලට අනුකූලව, මෙම අධික ලෙස වැඩුණු සහ භාවිතයට නුසුදුසු බීජ පැළවල පොත් වටිනාකම 2024 වාර්ෂික ගිණුම්වලින් ලියා හරින ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, තවාන් ව්‍යාපෘතිය රුපියල් මිලියන 54.97 ක දළ අලාභයක් වාර්තා කළේය.

විකුණුම් පිරිවැය

සමාලෝචිත වර්ෂය සඳහා විකුණුම් පිරිවැය රුපියල් මිලියන 722.20 ක් වූ අතර එය පෙර මූල්‍ය වර්ෂයේ වාර්තා වූ රුපියල් මිලියන 657.57 ට සාපේක්ෂව රුපියල් මිලියන 64.64 ක හෙවත් ආසන්න වශයෙන් 9.8% ක වර්ධනයකි. මෙම වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පොල් අංශයේ නිෂ්පාදන පිරිවැය ඉහළ යාම සහ අධික ලෙස වැඩුණු සහ අලෙවියට නුසුදුසු පොල් තවාන්වල පිරිවැය ගිණුම් වාර්තා වලින් කපා හැරීමයි. එය සමස්ත පිරිවැය ව්‍යුහයට සැලකිය යුතු ලෙස බලපෑවේය.

වෙනත් මෙහෙයුම් ආදායම්

2024 වර්ෂය සඳහා අනෙකුත් මෙහෙයුම් ආදායම රුපියල් මිලියන 72.10 ක් වූ අතර එය 2023 දී රුපියල් මිලියන 94.01 ක් විය. එය පෙර වසරේ සිට ආසන්න වශයෙන් 23% ක අඩුවීමක් පිළිබිඹු කරයි. මෙම පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පොල් ගස් අලෙවියෙන් ලැබුණු ආදායම රුපියල් මිලියන 0.21 කින් අඩුවීම, දැව ගස් අලෙවියෙන් ලැබුණු ආදායම රුපියල් මිලියන 13.97 කින් අඩුවීම

සහ වැව් පතස් පුළුල් කිරීම සහ ඉඩම් පුනරුත්ථාපන කටයුතු වලින් ලැබුණු ආදායම රුපියල් මිලියන 14.05 කින් පහත වැටීමයි. මෙම සාධක වල සාමූහික බලපෑම පෙර වසරට සාපේක්ෂව අනෙකුත් ආදායම්වල අහිතකර විචලනයට දායක විය. අනෙකුත් ආදායම් ප්‍රභවයන් පිළිබඳ වැඩිදුර විස්තර මූල්‍ය ප්‍රකාශනවල අංක 21 සටහනේ දක්වා ඇත.


පරිපාලන හා පොදු වියදම්

2024 වර්ෂය සඳහා පරිපාලන වියදම් රුපියල් මිලියන 179.50 ක් වූ අතර 2023 වර්ෂයේදී එය රුපියල් මිලියන 205.07 ක් විය. එය රුපියල් මිලියන 25.57 ක හෝ ආසන්න වශයෙන් 12.5% ක අඩුවීමක් පිළිබිඹු කරයි. මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආයතනික සමාජ වගකීම් (CSR) වියදම් අඩුවීම සහ 2024 මූල්‍ය වර්ෂය තුළ සමස්ත කාර්යාල වියදම් පහත වැටීමයි.

මූල්‍ය ආදායම

මූල්‍ය ආදායම ප්‍රධාන වශයෙන් කෙටිකාලීන බැංකු තැන්පතු සහ කාර්ය මණ්ඩල ණය වලින් උපයන ලද පොලී ආදායමෙන් සමන්විත වේ. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ මූල්‍ය ආදායම පෙර වසරේ වාර්තා වූ රුපියල් මිලියන 237.39 සිට රුපියල් මිලියන 118.29 දක්වා සැලකිය යුතු ලෙස පහත වැටී ඇති අතර එය ආසන්න වශයෙන් 50.17% ක අඩුවීමක් නියෝජනය කරයි. මෙම තියුණු පහත වැටීමට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ එම කාලය තුළ ස්ථාවර තැන්පතු පොළී අනුපාත සැලකිය යුතු ලෙස පහත වැටීමයි. මූල්‍ය ආදායමේ පහත වැටීම මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ බදු පෙර ලාභය (PBT) කෙරෙහි සෘජුවම බලපා ඇත.

පසුගිය වසර 05 සාරාංශය



මූල්‍ය පිරිවැය


මූල්‍ය වියදම් ප්‍රධාන වශයෙන් JEDB කල්බදු වත්කම්වලට අදාළ පොලී සහ අසම්භාව්‍ය කල්බදු කුලී ගෙවීම් නියෝජනය කරයි. 2024 වර්ෂය සඳහා, JEDB වත්කම්වලට අදාළ මූල්‍ය පිරිවැය රුපියල් මිලියන 72.20 ක් වූ අතර එය පෙර වසරේ රුපියල් මිලියන 55.73 ට සාපේක්ෂව 29.6% ක වැඩිවීමකි.

කල්බදු ගිවිසුමේ නියමයන්ට අනුකූලව, දළ දේශීය නිෂ්පාදිත අවධමනකය මත පදනම් වූ කල්බදු කුලී බැඳීම්වල වාර්ෂික ගැලපීම, මෙම වැඩිවීමට හේතු වී ඇත.

මීට අමතරව, පලෙයි වතුයාය, මුහමාලේ අයනන්කල් වතුයාය, විශ්වලිංගම් වතුයාය සහ කාසිපල්ලයිකානි වතුයාය ඇතුළු JEDB පලෙයි වතුයායේ අත්පත් කරගත් නව කල්බදු වත්කම් සම්බන්ධයෙන් වසර තුළ රුපියල් මිලියන 3.88 ක මූල්‍ය පිරිවැයක් දරන ලදී.

බදු වලට පෙර ලාභය

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, සමාගම පසුගිය වසරේ රුපියල් මිලියන 302.61 ක් වූ බදු පෙර ලාභය (PBT) රුපියල් මිලියන 219.21 ක් ලෙස වාර්තා කළ අතර එය සැලකිය යුතු අඩුවීමක් පිළිබිඹු කරයි. ලාභදායීතාවයේ මෙම පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු සාධක වූයේ මූල්‍ය ආදායමේ සැලකිය යුතු ලෙස පහත වැටීම වන අතර ස්ථාවර තැන්පතු සඳහා ලද පොලී අනුපාතය අඩුවීම එයට හේතු විය. ඊට අමතරව, අධික ලෙස වැඩුණු සහ අලෙවි නොවුණු පොල් තවාන් වල පොත් වටිනාකම ලියහැරීම එම අංශයේ දළ අලාභයට දායක විය. එමෙන්ම අනෙකුත් මෙහෙයුම් ආදායමේ පහත වැටීමද සමාගමේ මූල්‍ය කාර්ය සාධනයට තවදුරටත් බලපාන ලදී. දළ දේශීය නිෂ්පාදිත අවධමනකය මත පදනම්ව වාර්ෂිකව සකස් කරන ලද JEDB කල්බදු වත්කම්වල අසම්භාව්‍ය කල්බදු කුලීවලට අදාළ මූල්‍ය පිරිවැය වැඩිවීම ද සමස්ත ලාභයේ අඩුවීමට දායක විය.



බදු

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, සමාගම රුපියල් මිලියන 34.28 ක වර්ථන බදු ප්‍රතිපාදනයක් සහ රුපියල් මිලියන 323.30 විලම්භිත බදු ප්‍රතිපාදනයක් සිදු කළේය. 2024 මාර්තු 31 වන දින දක්වා, කෘෂිකාර්මික වගා කටයුතුවලින් උපයාගත් ආදායම ආදායම් බද්දෙන් නිදහස්ව පැවතුනි. කෙසේ වෙතත්, 2024 අප්‍රේල් 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි, කෘෂිකාර්මික වගා ආදායම ද වර්තන බදු රෙගුලාසි යටතේ ආදායම් බද්දට යටත් විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2024 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය ප්‍රකාශනවල රුපියල් මිලියන 323.30 ක විලම්භිත බදු

ප්‍රතිපාදනයක් වෙන්කර ඇත. (LKAS 12 - ආදායම් බදු ප්‍රමිතියට අනුකූලව, කෘෂිකාර්මික ගොවිතැන් කටයුතුවලින් පැන නගින බදු අය කළ හැකි තාවකාලික වෙනස්කම් හිණුම්ගත කිරීම සඳහා සමාගම 2024 දෙසැම්බර් 31 වන දිනට විලම්භිත බදු වගකීමක් හඳුනා ගෙන ඇත.)

බදු පසු ලාභ

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, සමාගම රුපියල් මිලියන 138.37 ක බදු පසු අලාභයක් වාර්තා කළ අතර, එයට ප්‍රධාන වශයෙන් රුපියල් මිලියන 323.30 ක විලම්භිත බදු ප්‍රතිපාදනයක් වෙන්කිරීම හේතු විය. මෙය අදාළ බදු රෙගුලාසි සහ හිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සිදු කරන ලද මුදල් නොවන හිණුම්කරණ ගැලපීමකි.

ලාභාංශ

2008 මැයි මාසයේදී හලාවත වැවිලි සමාගමේ (CPL) කළමනාකාරිත්වය රජය විසින් පවරා ගත් දා සිට, සමාගම එහි ස්වර්ණමය කොටස් හිමිකරු වන මහා භාණ්ඩාගාරය වෙත රුපියල් මිලියන 660 ක මුළු ලාභාංශයක් බෙදා හැර ඇත. මෙය 2008 සිට 2023 දක්වා අතර කාලය තුළ උපයාගත් ලාභයට සාපේක්ෂව සැලකිය යුතු ඉහළ ගෙවීමක් වන අතර, භාණ්ඩාගාරය වෙත තම දායකත්වය ලබාදීම සඳහා සමාගමේ ඇති දැඩි කැපවීම පෙන්නුම් කරයි. විශේෂයෙන් 2022 සහ 2023 වසර සඳහා පමණක්, හලාවත වැවිලි සමගම භාණ්ඩාගාරය වෙත රුපියල් මිලියන 215 ක ලාභාංශ මුදලක් ලබා දෙන ලදි. සමුච්චිතව 1992 සිට 2023 අවසානය දක්වා හලාවත වැවිලි සමාගම විසින් භාණ්ඩාගාරය වෙත ගෙවන ලද මුළු ලාභාංශ ප්‍රමාණය රුපියල් මිලියන 822 කි.



මානව සම්පත් සේවාව ඇගයීම

මානව සම්පත ආයතනයේ වටිනාම වත්කම බව හඳුනා ගනිමින්, සමාගම 2024 වර්ෂයේදී සේවකයින් හට කාර්ය සාධන දිරිගැන්වීමක් ලෙස පෙර වසරේ ගෙවන ලද රුපියල් මිලියන 29.54 ට සාපේක්ෂව රුපියල් මිලියන 30.30 ක් ගෙවා ඇත. මෙම වසරේ දිරි දීමනා ගෙවීම එක් එක් සේවක කාර්ය සාධන ඇගයීම් මත පදනම් වූ අතර, කාර්ය සාධනය මත පදනම් වූ දිරි දීමනා ගෙවීමේ සංස්කෘතියක් ඇති කරමින් කැපී පෙනෙන දායකත්වයන් සඳහා ඉහළ ප්‍රතිලාභ ලබා දෙන ලදී.


මීට අමතරව, රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 03/2024 ට අනුව, හලාවත වැවිලි සමාගමේ සියලුම සේවකයින් හට වාර්ෂික ප්‍රසාද දීමනා ලෙස රුපියල් මිලියන 12.96 ක් ගෙවන ලද අතර, පෙර වසරේ ගෙවන ලද මුදල රුපියල් මිලියන 14.64 කි. මෙම ගෙවීම් මඟින් සේවක පිළිගැනීම, අභිප්‍රේරණය සහ මෙම දීමනා ගෙවීම සම්බන්ධව සමාගමේ අඛණ්ඩ කැපවීම පිළිබිඹු වේ.

කොටසක ඉපයීම

සමාලෝචනයට භාජනය වන මූල්‍ය වර්ෂය තුළ, සමාගම පෙර වසරේ ඉපැයූ ධනාත්මක කොටසක ඉපයීම (EPS) වන රුපියල් 11.59 ක වටිනාකමට සාපේක්ෂව, රුපියල් 6.92 ක සෘණ කොටසක ඉපයීම් අගයක් වාර්තා කළේය. මෙම පහත වැටීමට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ සංශෝධිත බදු රෙගුලාසිවලට අනුකූලව සැලකිය යුතු විලම්භිත බදු ප්‍රතිපාදනයක් හඳුනා ගැනීම නිසා හිණුම් වර්ෂය තුළ බදු පසු අලාභයක් වාර්තා වීම නිසාය.

ජංගම අනුපාතය

2024 දී සමාගමේ ද්‍රවශීලතා මට්ටම, පෙර වසරේ පැවති වාර 3.57 ක සිට වාර 7.05 ක් දක්වා වර්ධනය වී ඇත. මේ තුළින් ජංගම වත්කම් වලින් කෙටි කාලීන බැඳීම් පියවීමට සමාගමේ ඇති හැකියාවේ සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරයි.




ස්කන්ධය

2024 මූල්‍ය වර්ෂය අවසන් වන විට සමාගමේ මුළු සංචිත ප්‍රමාණය රුපියල් මිලියන 1,991.51 ක් වූ අතර, පෙර වසරේ එය රුපියල් මිලියන 2,179.60 ක් විය. මෙයට රුපියල් මිලියන 1,623.09 ක රඳවා ගත් ඉපැයීම් (2023: රුපියල් මිලියන 1,844.72) සහ රුපියල් මිලියන 368.41 ක දැව සංචිත සහ වාහන නැවත තක්සේරු කිරීමේ සංචිත (2023: රුපියල් මිලියන 334.88) වලින් සමන්විත වේ. ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් මිලියන 200 ක් ලෙස නොවෙනස්ව පැවතුනි. මුළු සංචිතවල පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ වසර තුළ වාර්තා වූ බදු පසු අලාභයයි. ඉහළ විලම්භිත බදු ප්‍රතිපාදනයක් වෙන්කිරීම මේ සඳහා බලපා ඇත.

රු. මිලි.


	2024	2023
ප්‍රකාශිත ප්‍රාග්ධනය	200.00	200.00
රඳවාගත් ඉපැයුම්	1,623.09	1,844.72
දැව සංචිත සහ වාහන නැවත තක්සේරු සංචිත	368.41	334.88
මුළු ස්කන්ධය	**2,191.50**	**2,379.60**

ස්කන්ධය - 2024




ද්‍රවශීලතා මට්ටම

	2024 රු. මිලි.	2023 රු. මිලි.
මුළු ජංගම වත්කම්	1,318.98	1,456.65
මුළු ජංගම වගකීම්	187.21	408.54
ශුද්ධ කාරක ප්‍රාග්ධනය	1,131.77	1,048 .11
ජංගම අනුපාතය	7.05	3.5 7




2024 දී සමාගමේ ද්‍රවශීලතා මට්ටම සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරයි. මුළු ජංගම වත්කම් රුපියල් මිලියන 1,318.98 ක් වූ අතර, මුළු ජංගම වගකීම් රුපියල් මිලියන 187.21 ක් විය, එහි ප්‍රතිඵලයක් ලෙස ශුද්ධකාරක ප්‍රාග්ධනය රුපියල් මිලියන 1,131.77 ලෙස වාර්තා විය.

2023 දී මුළු ජංගම වත්කම් සහ වගකීම් පිළිවෙලින් රුපියල් මිලියන 1,456.65 ක් සහ රුපියල් මිලියන 408.54 ක් විය. ජංගම වත්කම් අනුපාතය වාර 3.57 ක සිට වාර 7.05 ක් දක්වා සැලකිය යුතු ලෙස වර්ධනය විය. මෙම දියුණුව ශක්තිමත් කෙටිකාලීන මූල්‍ය ස්ථාවරත්වය සහ ජංගම වගකීම් පියවීමේ ධාරිතාවයේ වර්ධනය පිළිබිඹු කරයි.



කොටස් හිමියන්ගේ අරමුදල් අනුපාතය

2024 මූල්‍ය වර්ෂයේදී, හලාවත වැවිලි සමාගම (CPL) කොටස් හිමියන්ගේ අරමුදල් අනුපාතය 73.37% ක් ලෙස වාර්තා කළ අතර එය 2023 දී පැවති 78.08% සිට වසරින් වසරට 6% ක පහත වැටීමක් පිළිබිඹු කරයි.




ජංගම නොවන වත්කම් වල ආයෝජනය

2024 වර්ෂය තුළ සමාගම නව වගා/ යටි වගා, නොමේරූ වගා නඩත්තුව වෙනුවෙන් රු. මිලියන 79.45 (2023: රු. මිලියන 69.38) ආයෝජනය කර ඇති අතර දේපළ පිරියත සහ උපකරණ සඳහා රුපියල් මිලියන 32 (2023: රු. මිලියන 45.51) ආයෝජනය කර ඇත.

2024 වර්ෂයේ ශේෂපත්‍ර දිනට ජංගම නොවන වත්කම්වල ශුද්ධ පොත් වටිනාකම (දේපළ පිරියත සහ උපකරණ, බදු අයිතිය, ජීව විද්‍යාත්මක වත්කම්, කල්බදු දේපළ වැඩිදියුණු කිරීම ආදිය) රු. මිලියන 1,667.93 (2023: රු. මිලියන 1,590.94) වේ.


ස්කන්ධ ප්‍රතිලාභ අනුපාතය (ROE)



2024 දී, හලාවත වැවිලි සමාගම (CPL) (6.05%) ක සෘණ ස්කන්ධ ප්‍රතිලාභයක් (ROE) වාර්තා කළ අතර එය 2023 දී වාර්තා වූ 9.79% ට සාපේක්ෂව සැලකිය යුතු පහත වැටීමකි. මෙම 162% ක අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු සාධක වූයේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය අංක 12 (LKAS 12) - ආදායම් බදු ප්‍රමිතයට අනුකූලව රුපියල් මිලියන 323.3 ක මුදල් නොවන විලම්භිත බදු ප්‍රතිපාදන හඳුනා ගැනීමයි.

මෙම විලම්භිත බදු ප්‍රතිපාදනය මුදල් නොවන ගැලපීමක් වන අතර එය සමාගමේ මෙහෙයුම් මුදල් ප්‍රවාහයට බලනොපාන ගැලපිල්ලක් වේ.

යෙදවූ ප්‍රාග්ධනයට ප්‍රතිලාභ අනුපාතය (ROCE)



2024 මූල්‍ය වර්ෂයේදී, හලාවත වැවිලි සමාගම (CPL) 6.42% ක ප්‍රාග්ධන ප්‍රතිලාභ අනුපාතයක් (ROCE) වාර්තා කළ අතර එය 2023 දී 4.81% සිට 33% ක වර්ධනයක් පෙන්නුම් කරයි.
2024 දී සමාගමේ ප්‍රාග්ධන ප්‍රතිලාභ අනුපාතය (ROCE) හි වැඩිවීමට බලපෑ සාධක වූයේ,

1. මෙහෙයුම් ලාභය වර්ධනය වීම :
අභියෝග මධ්‍යයේ වුවද, සමාගම තම මෙහෙයුම් ලාභය වර්ධනය කර ගැනීමට සමත් වූ අතර, බදු හා පොලී පෙර ලාභය (EBIT) සඳහා ධනාත්මක දායකත්වයක් ලබා දුන්නේය.

2. කාර්යක්ෂම ප්‍රාග්ධන යෙදවුම් :
සමාගම තම ප්‍රාග්ධනය යෙදවුම් ඵලදායී ලෙස කළමනාකරණය කළ අතර, වත්කම් භාවිතය ප්‍රශස්ත කරමින් අනවශ්‍ය ප්‍රාග්ධන වියදම් අඩු කළේය.

මුදල් ප්‍රවාහ

2023 දී වාර්තා වූ රුපියල් මිලියන 65.88 ක වර්ධනයට සාපේක්ෂව, 2024 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හලාවත වැවිලි සමාගමේ ශුද්ධ මුදල් සහ මුදල් සමාන දෑ රුපියල් මිලියන 89.38 ක අඩුවීමක් වාර්තා කළේය. මෙම පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ප්‍රාග්ධන වියදම් හා ලාභාංශ ගෙවීම් ඉහළ යාමයි. වර්ෂයේ ඉපයූ මූල්‍ය ආදායම හා ඵලදායීකාරක ප්‍රාග්ධන කළමනාකරණය මඟින් එය යම්තාක් දුරට සමනය විය.

ශුද්ධ මෙහෙයුම් මුදල් ප්‍රවාහය

හලාවත වැවිලි සමාගමේ, මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය 2023 දී වාර්තාවූ රුපියල් මිලියන 311.83 ක සිට රුපියල් මිලියන 247.38 ක් දක්වා 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේදී පහත වැටී ඇත. මෙහෙයුම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහ වර්ධනය වුවද, ආදායම් බදු ගෙවීම් සහ කල්බදු පොලී ගෙවීම් වැනි ගෙවීම් සඳහා පිටතට ගලායාම් වැඩිවීම හේතුවෙන් මෙම රුපියල් මිලියන 64.45 ක පහත වැටීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

ආයෝජන කටයුතු වෙනුවෙන් මුදල් යෙදවීම

2023 දී රුපියල් මිලියන 107.71 ක මුදල් ගලායාම් වලට සාපේක්ෂව, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ හලාවත වැවිලි සමාගම (CPL) ආයෝජන ක්‍රියාකාරකම් වලින් රුපියල් මිලියන 152.15 ක ශුද්ධ මුදල් පිටතට ගලා යාමක් වාර්තා කළේය. මෙම රුපියල් මිලියන 44.44 ක වැඩිවීම ප්‍රධාන වශයෙන් කෙටිකාලීන ස්ථාවර තැම්පතු සහ ක්ෂේත්‍ර සංවර්ධන වියදම්වල ඉහළ ආයෝජන හේතුවෙන් සිදු වූ අතර, පොල් ගස් විකිණීමෙන් සහ කාර්ය මණ්ඩල ණය අයකර ගැනීමෙන් ලැබෙන ආදායමෙන් අර්ධ වශයෙන් පියවා ගන්නා ලදී.

සමාලෝචනයට භාජනය වන වසර තුළ, හලාවත වැවිලි සමාගම ක්ෂේත්‍ර සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා රුපියල් මිලියන 79.45 ක් ආයෝජනය කළ අතර, එයට නව වගාවන් ස්ථාපිත කිරීම සහ පවතින නොමේරූ වගාවන් කළමනාකරණය කිරීම ඇතුළත් විය. කෘෂිකාර්මික ඵලදායීතාව වැඩි කිරීමට සහ සම්පත් ප්‍රශස්තීකරණයට දායක වන බැවින්, සමාගමේ දිගුකාලීන වර්ධනය සහ තිරසාරභාවය සඳහා මෙම ආයෝජන ඉතා වැදගත් වේ.

දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගැනීම සඳහා සමාගම රුපියල් මිලියන 32.01 ක් වැය කළේය. මෙම ප්‍රාග්ධන වියදම් යටිතල පහසුකම්, යන්ත්‍රෝපකරණ සහ පහසුකම් නඩත්තු කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා අත්‍යාවශ්‍ය වන අතර එමඟින් මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ ධාරිතාව පුළුල් කිරීම සඳහා සහාය වේ.

මූල්‍ය කටයුතු

2024 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හලාවත වැවිලි සමාගමේ මූල්‍ය කටයුතුවලින් රුපියල් මිලියන 184.61 ක ශුද්ධ මුදලක් පිටතට ගලා ගොස් ඇති අතර එය 2023 දී රුපියල් මිලියන 138.23 ක් විය. මෙම රුපියල් මිලියන 46.38 ක වැඩිවීම කෙරෙහි ලාභාංශ ගෙවීම් ඉහළ යාම බලපා ඇති අතර එය පෙර වසරේ රුපියල් මිලියන 130 සිට රුපියල් මිලියන 185 ක් දක්වා වැඩි වී ඇත. ලාභාංශ ගෙවීම් වල වැඩිවීම තුළින් සමාගමේ ස්වර්ණමය කොටස්හිමිකරු වන මහා භාණ්ඩාගාරයට වටිනාකමක් ලබා දීමට ඇති කැපවීම පිළිබිඹු කරයි. ඊට අමතරව, මූල්‍ය කටයුතු යටතේ, සමාගමට වසර තුළ රුපියල් මිලියන 2.48 ක ප්‍රාග්ධන ප්‍රදානයක් ලැබුණු අතර එය ප්‍රාග්ධන වියදම් අරමුණු සඳහා භාවිතා කරන ලදී.

ආයතනික පාලන ප්‍රකාශනය

සීමා සහිත හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය අවංකත්වය, ආයතනික මධ්‍යස්ථභාවය, විනිවිදභාවය හා වගකීම් සහගත බව යන ප්‍රතිපත්ති තුළ ක්‍රියාකරනු ලබයි. මෙය සමාගම සහ සමාගම කෙරෙහි උනන්දුවක් දක්වන පිරිස් සමග ප්‍රබල සම්බන්ධතාවක් ඇති කිරීම සඳහා හේතු වී ඇත. ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන් සහ ආයතනික ස්ථායීතාව මෙන්ම ව්‍යාපාරික වටිනාකම වැඩිවන අයුරින් සකස් කර ඇති ප්‍රතිපත්තීන්, ක්‍රියා පටිපාටින්, ක්‍රියා පිලිවෙත්, නිවැරදි ව්‍යුහයන් සහ තොරතුරු උක්ත සඳහන් සම්බන්ධතාවයන් වඩාත් සවිමත් කිරීම සඳහා හේතු වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ කාර්යය සාධනය සඳහා වගකිව යුතු වන්නා සේම අවසාන වශයෙන් ඒ සම්බන්ධයෙන් වගකීමට බැඳි සිටින්නේය.

වගකීම්

මූලික ප්‍රතිපත්තීන් හා උපායශීලි අරමුණ සකස් කිරීමටත් ඒවා ක්‍රියාවට නැංවීමටත් අධ්‍යක්ෂ මණ්ඩලය බැඳී සිටී. සමාගමේ මූල්‍ය තොරතුරු වල විශ්වාසනියත්වය සහ අභ්‍යන්තරික පාලන ක්‍රමවේදයන්ගේ සාර්ථකත්වය සඳහා ද අවසාන වගකීම් දරන්නා වන්නේ එහි අධ්‍යක්ෂ මණ්ඩලයයි.

සංයුතිය

සභාපති/ප්‍රධාන විධායක නිලධාරි ඇතුළුව 2024 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් 7 දෙනෙකුගෙන් සමන්විත වේ.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසිකව පවත්වනු ලබයි. සමාගමේ උපායශීලී ක්‍රමෝපායන්, වාර්ෂික අයවැය, සියලු කාර්යයන් වල ප්‍රගතිය, ප්‍රාග්ධන හා ප්‍රවර්ථන වියදම් සමාලෝචනයට ලක් කිරීම මෙම රැස්වීමේදී සිදුවේ. සෑම රැස්වීමක් පැවැත්වීමටම සාධාරණ කාලයකට පෙර ඒ හා සම්බන්ධ ලිපි ලේඛන අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයන් හට ලබා දීමට කටයුතු කරනු ලැබේ.

2024 වර්ෂය තුළදී අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් 7ක් පවත්වා ඇත.

විගණන කමිටුව

සමාගමේ විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ.

විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන එච්.ජී. සුමනසිංහ මහතා විගණන කමිටුවේ සභාපතිත්වය උසුලන අතර වර්ෂය තුළ ඇඟයීම් 3 ක් සිදුකර ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරියකු නිරීක්ෂකයෙකු වශයෙන් විගණන කමිටු රැස්වීම් වලට සහභාගි වී ඇත.

සමාගමේ සභාපති/ප්‍රධාන විධායක නිලධාරී, විධායක අධ්‍යක්ෂක, සහකාර සාමාන්‍යාධිකාරී වැවිලි, ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී විමසීම් කරන අවස්ථා වලදී මෙම කමිටු රැස්වීම් වලට සහභාගි වේ.

නීතිමය අවශ්‍යතාවලට අනුකූල වීම

සාංගමික සංස්ථා පත්‍රය, සංගමික ව්‍යවස්ථාවලිය හා රාජ්‍ය ව්‍යාපාර සඳහා බලපවත් වන අනෙකුත් නීති රීති හා රෙගුලාසි වලට අනුකූලව කටයුතු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය හැකි සෑම උත්සාහයක්ම ගනු ලබන බවට සහතික වේ. එමෙන්ම සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම් කරන ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි පිළියෙල කරන බවටත් 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල වන බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරනු ලබයි.

අවධානම් කළමනාකරණය

කෘෂි ව්‍යාපාර සහ කෘෂිකර්මාන්තයට අදාළ කටයුතුවල නියැලී සිටින අප වැනි සංවිධාන සඳහා අවදානම් කළමනාකරණය ඉතා වැදගත් වේ. අප මුහුණ දෙන ප්‍රධාන අභියෝගයක් වන්නේ දේශගුණික විපර්යාසයන්ය. වෙනස්වන කාලගුණික රටා හේතුවෙන් ඇතැම් සාමාන්‍ය කෘෂිකාර්මික භාවිතයන් සැලසුම් කළ පරිදි තවදුරටත් සිදු කළ නොහැකි පරිසරයක් නිර්මාණය වී ඇත. මීට අමතරව, මිල සහ වෙළෙඳපොළ උච්චාවචනයන් ආමන්ත්‍රණය කළ යුතු වැදගත් ගැටළු වේ. සංවිධානයේ දිගුකාලීන තිරසාරභාවය සඳහා මෙම අවදානම් අවම කිරීම අත්‍යවශ්‍ය වේ. එබැවින්, නිසි අවදානම් තක්සේරු කිරීම් සහ අවම කිරීමේ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සංවිධානයේ අඛණ්ඩ සාර්ථකත්වය සඳහා තීරණාත්මක සාධකයක් වේ.

අවදානම් කළමණාකරණ උපාය මාර්ග

අවදානම් සාධකය	අවදානම් තක්සේරුව	අවදානම් අවම කිරීමේ උපාය මාර්ග
දේශගුණික විපර්යාස	දීර්ඝ හා අනපේක්ෂිත නියඟයන් හේතුවෙන් ඇතිවන අහිතකර කාලගුණික තත්ත්වයන් නිසා පොල්, කජු සහ අනෙකුත් බහුවාර්ෂික භෝගවල අස්වැන්න.අනපේක්ෂිත ලෙස උච්චාවචනය වේ. අතිරේකව, වැසි සමයේ අධික වර්ෂාපතනය හේතුවෙන් ඇතිවන ගංවතුර ද කෘෂිකාර්මික භාවිතයන්ට සහ බෝග අස්වැන්නට තර්ජනයක් වේ.	- පොල් ලෙලි වලවල්, වැසි ජලය රැස් කිරීමට කාණු යෙදීම, සහ ග්ලිරිසීඩියා වැනි අඩු සෙවණ ගස් සහ පූරේරියා වැනි ආවරණ භෝග සිටුවීම මගින් පාංශු තෙතමනය සංරක්ෂණය වැඩි කිරීම. - වාරිමාර්ග සහ පාංශු තෙතමනය රඳවා ගැනීම යන දෙකටම සහාය වන පරිදි වැසි ජලය එකතු කිරීමට වැව් ප්‍රතිසංස්කරණය කිරීම. - ශාක ජල අවශ්‍යතා සපුරාලීම සඳහා වාරිමාර්ග පද්ධති ස්ථාපිත කිරීම. - අදාළ රක්ෂණ ආවරණ ලබා ගැනීම.
නිෂ්පාදනයට හානි වීම	අවුරුදු 50 ට වැඩි මේරූ ගස්වලින් ඉහළ ප්‍රතිශතයක් මහලු, අක්‍රිය හෝ පල නොදරන තත්වයට පත්වීම. ගස්වලට හා වගාවට අනපේක්ෂිත රෝග, පළිබෝධ සහ ස්වභාවික හේතු.	- වයස්ගත වූ ගස් වෙනුවට නව වගාවන් සහ යටි වගාවන් ඇති කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. - පොල් ඉඩම්වල සුදුසු අතුරු බෝග හඳුන්වා දීම. - ඒකාබද්ධ පළිබෝධ පාලන උපාය මාර්ග අනුගමනය කිරීම. - පළිබෝධ සහ රෝග පාලනය පිළිබඳව කාර්ය මණ්ඩලය සඳහා නිතිපතා පුහුණු සැසි පැවැත්වීම.
හාණ්ඩ චක්‍රය	පාම් තෙල් වැනි ලාභදායී ආදේශක තිබීම හේතුවෙන් වෙළඳපළ මිල ගණන් සහ ඉල්ලුම උච්චාවචනය වීම, විකිණීමට නොහැකි වූ පොල් අධික වීම නිසා ඒවා නරක් වීමේ අවදානමකට ලක්වීම .	- වතු මට්ටමේ සහ සමාගම් මට්ටමේ පොල් පොළ (ගොවිපල වෙළෙඳපොළ) හරහා පොල් අස්වනු විකිණීම. - පොල් සහ වටිනාකම් එකතු කළ නිෂ්පාදන විකිණීම සඳහා දිස්ත්‍රික් අලෙවි නියෝජිතයන් පත් කිරීම. - විකිණීමට නොහැකි වූ පොල් කොප්පරා බවටත්, පසුව සමාගමේ තෙල්මෝල මගින් පොල් තෙල් බවටත් සැකසීම. - වටිනාකම් එකතු කළ නිෂ්පාදනය සහ අලෙවි කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම.

		- අලෙවිසැල් හරහා පොල් සෘජුවම බෙදා හැරීම සහ විශේෂයෙන් රජයේ නිලධාරීන්ට බෙදා හැරීම.
ණය අවදානම	ගැනුම්කරුවන්ගේ ගෙවීම් ප්‍රමාද වීම හෝ පැහැර හැරීම; දීර්ඝ කාලයක් තිස්සේ ගෙවීමට ඇති හිඟ මුදල්; ගැනුම්කරුවන් ගෙවීමේ නියමයන්ට අනුකූල නොවීම.	- ව්‍යුහාත්මක ක්‍රියා පටිපාටියක් හරහා චකතු කිරීම් සම්පව අධීක්ෂණය කිරීම. - කල් ඉකුත් වූ ගෙවීම් හෝ පැහැර හරින ගැනුම්කරුවන් සම්බන්ධයෙන් මැදිහත් වීම සඳහා බලධාරීන් සම්බන්ධ කර ගැනීම. - රජයේ බදු ගෙවීම් නියමිත වේලාවට පියවීම. - ගැනුම්කරුවන්ගේ ගෙවීම් සම්බන්ධයෙන් පැහැදිලි නීති රීති හඳුන්වා දීම.
කළමනාකරණ පිරිස් (Management Personnel)	අභිප්‍රේරණය නොමැතිකම සහ රැකියාව පිළිබඳ දැනුම නොමැතිකම, එමඟින් දුර්වල ඵලදායිතාව සහ ප්‍රතිදානයන් ඇතිවීම. වඩා හොඳ වැටුප් සහ ඉහළ තනතුරු සඳහා සේවකයින් වෙනත් කර්මාන්ත හෝ වෙනත් ආයතන වෙත පිටව යාම, උසස් අධ්‍යාපනය/රැකියා සඳහා විදේශගත වීම.	- පුහුණු වැඩමුළු සහ ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම. - මූල්‍යමය සහ මූල්‍යමය නොවන දිරිගැන්වීම් සහ අමතර ප්‍රතිලාභ පිරිනැමීම. - නිතිපතා සංවාද හරහා වෘත්තීය සමිති සමඟ සෞඛ්‍ය සම්පන්න සබඳතා පවත්වා ගැනීම. - උසස් අධ්‍යාපනය සඳහා සහාය ලබා දීම සහ අදාළ වන තැන්හි අභ්‍යන්තර අපේක්ෂකයින් ඉහළ තනතුරු සඳහා උසස් කිරීම.
වත්කම් අවදානම	ගින්න,සොරකම, උපකරණ බිඳ වැටීම, ගංවතුර, අකුණු, පළිබෝධ සහ වන සතුන් වැනි ස්වභාවික විපත් වලින් ඇතිවන අවදානම්. අනවසර පාර්ශ්වයන් විසින් ඉඩම් අත්පත් කර ගැනීමට දරන උත්සාහයන්.	- සියලුම වත්කම් සඳහා පුළුල් රක්ෂණ ආවරණ ලබා ගැනීම. - එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට වත්කම් ගෙන යාම සම්බන්ධයෙන් දැඩි ක්‍රියා පටිපාටි අනුගමනය කිරීම. - පිටතින් අපගේ ඉඩම්වලට ගින්න පැතිරීම වැළැක්වීම සඳහා ගිනි බෑවුම් (fire Gaps) ස්ථාපිත කිරීම සහ වෙනත් පූර්වාරක්ෂක පියවරයන්. - නිතර වැළැක්වීමේ, නඩත්තු වැඩසටහන් / ගිනි නිවීමේ අභ්‍යාස ආදිය සිදු කිරීම. - යහපත් කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කිරීම. - සමීක්ෂණ සැලසුම් සකස් කිරීම සහ නීති විරෝධී ඉඩම් අත්පත් කර ගැනීමට එරෙහිව නීතිමය පියවර ගැනීම.

ප්‍රාග්ධන ආයෝජන අවදානම	ප්‍රාග්ධන ආයෝජන වලින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට අපොහොසත් වීම.	- ආයෝජන මත ප්‍රතිලාභය (ROI) සහ ආපසු ගෙවීමේ කාලය සලකා බලා, ප්‍රාග්ධන ආයෝජන සඳහා දැඩි අනුමත කිරීම් සහ ඇගයීම් ක්‍රියා පටිපාටි යෙදීම.
කීර්තිනාම අවදානම	මෙහෙයුම් අසාර්ථක වීම්, විනිවිදභාවය නොමැතිකම හෝ ගුණාත්මක භාවය සම්බන්ධ ගැටළු හේතුවෙන් පාර්ශවකරුවන්ගේ විශ්වාසයට සහ වෙළඳ නාමයේ කීර්ති නාමයට හානි වීම. නිෂ්පාදන පාරිභෝගික හෝ වෙළඳපල ඉල්ලීම් සහ ප්‍රමිතීන් සපුරාලීමට අපොහොසත් වීම. කාර්ය සාධනය, ඉලක්ක සහ ප්‍රමිතීන් පිළිබඳ දැනුම නොමැතිකම.	- පාර්ශවකරුවන් (සේවකයින්, පාරිභෝගිකයින්, නියාමකයින් ආදී) සමඟ ඵලදායී සන්නිවේදනයක් පවත්වා ගැනීම. - නිෂ්පාදන සහ නිෂ්පාදන ක්‍රියාවලියේ ගුණාත්මකභාවය සහ ප්‍රමිතීන් සමඟ අනුකූලතාවය සහතික කිරීම. - සමාගමේ කාර්ය සාධනය අඛණ්ඩව එහි ඉලක්ක සමඟ සමපාත වන බව සහතික කිරීම සඳහා මාසිකව අයවැය ක්‍රියාවලියක් සහ අයවැය පාලන යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම. - සේවා සහ නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා පාරිභෝගික ප්‍රතිපෝෂණ ලබා ගැනීම.
යෙදවුම් ද්‍රව්‍ය අවදානම	රටේ මූල්‍ය අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස පොහොර, ඉන්ධන වැනි අත්‍යවශ්‍ය ද්‍රව්‍ය නොමැති වීම සහ හිඟ වීම.	- කාබනික පොහොර සහ සූර්ය බලය වැනි විකල්ප ද්‍රව්‍ය භාවිතය. - නාස්තිය අවම කිරීම සඳහා යෙදවුම් භාවිතය සමීපව අධීක්ෂණය කිරීම.
සේවකයින්ගේ/ප්‍රජාවගේ ආහාර සුරක්ෂිතතා අවදානම	ජාතික අර්බුද හේතුවෙන් සේවකයින්ට සහ අවට ප්‍රජාවන්ට බලපාන ආහාර හිඟයන් ඇති විය හැකිය.	- කෙටිකාලීන භෝග වගාව සඳහා සේවකයින්ට ඉඩම් කොටස් වෙන් කිරීම සහ බීජ බෙදා හැරීම. - දේශීය ආහාර නිෂ්පාදනයට සහාය වීම සඳහා බාහිර පාර්ශ්වයන්ට ඉඩම් බදු දීම.

විගණන කමිටු රැස්වීම් - 2024

විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයේ උප කමිටුවකි. ඊට විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු ඇතුළත්ය. විධායක නොවන අධ්‍යක්ෂවරුන් අතරින් භාණ්ඩාගාර නියෝජිත විගණන කමිටුවේ සභාපති ලෙස පත් කරනු ලැබේ. සමාගමේ ප්‍රධාන අභ්‍යන්තර විගණක, විගණන කමිටුවේ කැඳවුම්කරු ලෙස කටයුතු කරයි. විගණන කමිටුවේ රැස්වීම් වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් විසින් සකස් කරයි.

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍ර ලේඛයන්ට අනුකූලව, හලාවත වැවිලි සමාගමේ විගණන කමිටුව සඳහා විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු පත් කර ඇත. කමිටුව මනා පළපුරුදු, උගත් ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන්ගෙන් සමන්විත විය. ඊට මුදල් අමාත්‍යාංශයෙන් සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයෙන් පත්කළ අධ්‍යක්ෂවරු දෙපළක්ද ඇතුළත්ය. ඒ අනුව විගණන කමිටුව පහත පරිදි සමන්විත විය.

පී.එච්.ඒ.එස්. විජයරත්න මහතා	-	මුදල් අමාත්‍යාංශය
ලීලානාත් වික්‍රම ආරච්චි මහතා	-	වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
එච්.ඩබ්.ඩබ්. රත්නපාල මහතා		

විගණන කමිටුව සඳහා ඉහත සාමාජිකයින්ට අමතරව, ජාතික විගණන කාර්යාලයේ නියෝජිතයෙකු ද කමිටු රැස්වීමට නිරීක්ෂකයෙකු ලෙස සහභාගී විය. ජාතික විගණන කාර්යාලය සහ අභ්‍යන්තර විගණන අංශය නිකුත් කළ විගණන වාර්තා විගණන කමිටුවේදී සාකච්ඡා කළ අතර ඊට සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය ද කමිටුවට කැඳවන ලදී.

සමාගමේ විගණන කමිටුව මාර්ගෝපදේශකයෙකු ලෙස හලාවත වැවිලි සමාගමේ කළ කාර්යයන් කිහිපයක් පහත පරිදිය.

- සමාගමේ අභ්‍යන්තර විගණන අංශයේ වගකීම් තීරණය කිරීම සහ වාර්ෂික විගණන සැලැස්ම සමාලෝචනය
- සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය කිරීම සහ ඇගයීම
- පිරිවැය ඵලදායීතාවය සඳහා කාර්ය සාධනය සමාලෝචනය කිරීම සහ වියදම් කළමනාකරණය
- බාහිර විගණකවරුන් සමඟ සම්බන්ධ වී විගණකාධිපතිගේ කළමනාකරණ ලිපි පිළිබඳ පසු විපරම් කිරීම
- චක්‍රලේඛ, නීති රීති සහ රෙගුලාසි සම්පාදනය කර ඇත්දැයි සොයා බැලීම
- ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල දැයි මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම
- මූල්‍ය විනය ශක්තිමත් කිරීමට අභ්‍යන්තර / බාහිර විගණන වාර්තා, කළමනාකරණ ලිපි සමාලෝචනය කිරීම
- රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිර්දේශ, උපදෙස් ක්‍රියාත්මක කිරීම සහ සමාලෝචනය
- වාර්ෂික වාර්තාවට ඇතුළත් කිරීම සඳහා විගණන කමිටුවේ නිර්දේශ ලබා දීම

විගණන කමිටුව 2024 වාර්ෂික විගණන වැඩසටහන සමාලෝචනය කර විගණකාධිපති වාර්තා සහ අභ්‍යන්තර විගණන වාර්තා ද සාකච්ඡා කරන ලදී. සමාගමේ අභ්‍යන්තර පාලන ක්‍රියා පටිපාටි ශක්තිමත් කිරීම සඳහා විගණන වාර්තාවල සඳහන් යෝජනා සහ නිර්දේශ කෙරෙහි විගණන කමිටු සාමාජිකයින්ගේ විශේෂ අවධානයක් යොමු විය. තවද කමිටුව විසින් සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය කැඳවා එක් එක් දෙපාර්තමේන්තු වල ප්‍රගතිය සාකච්ඡා කළ අතර, 2024 ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාගමේ එක් එක් වතු කලාප වල කෘෂිකාර්මික කටයුතුවල ප්‍රගතිය කෙරෙහි ද විශේෂ අවධානයක් යොමු කරන ලදී.



පී.එච්.ඒ.එස්. විජයරත්න
සභාපති
විගණන සහ කළමනාකරණ කමිටුව
හලාවත වැවිලි සමාගම

අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන හා විගණකාධිපති වාර්තාව ඇතුළත් වාර්ෂික වාර්තාව හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි.

නෛතික තත්වය

සීමාසහිත හලාවත වැවිලි සමාගම 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ (සමාගම 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ යළි ලියාපදිංචි කරන ලදි.) සහ 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හා ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්ථනය කිරීමේ පනත අනුව ශ්‍රී ලංකාවේ සංස්ථාගත කළ වගකීමෙන් සීමාසහිත සමාගමක් වේ.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය හලාවත, පුත්තලම් පාර, අංක 165 යන ලිපිනයේ පිහිටා ඇති අතර කොළඹ කාර්යාලය කොළඹ 02, වොක්ෂෝල් වීදිය, අංක 55/75, යන ලිපිනයෙහි පිහිටා ඇත. වතුයායන් පුත්තලම, කුරුණෑගල සහ ගම්පහ යන වැවිලි දිස්ත්‍රික්ක වල පිහිටා ඇත.

පහත සඳහන් ආකාරයට වතු කලාප 08 ක් යටතේ පාලනය කෙරේ.

- පලුගස්වැව වත්ත
- හලාවත වතු කලාපය
- තම්බපණ්ණි වතු කලාපය
- මංගලවිළිය වතු කලාපය
- දිවුලපිටිය වතු කලාපය
- මාදම්පේ වතු කලාපය
- බිංගිරිය වතු කලාපය
- නිකවැරටිය වතු කලාපය

තවද හලාවත වැවිලි සමාගම තම ව්‍යාපාර කටයුතු පුළුල් කිරීම යටතේ වසර 30 ක කාලයක් සඳහා වතු කලාප කිහිපයක් කල්බදු පදනම යටතේ ලබා ගෙන ඇත.

එලෙස නව කල්බදු ගිවිසුමට අදාළ වතු කලාප වන්නේ පලෙයි, මුහමලෙයි, අයනන්කායි, විසුවලින්ගම් සහ කාසිපල්ලයිකානි වතු කලාප වේ.

ප්‍රධාන ක්‍රියාකාරකම්

හලාවත වැවිලි සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් ලෙස පොල්, කජු සහ වෙනත් කෘෂි භෝග වගා කිරීම, අනෙකුත් කෘෂි නිෂ්පාදනය, පශු සම්පත් හා ඒවා අලෙවි කිරීම දැක්විය හැක.

මූල්‍ය වාර්ථා

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRSs/LKASs) අනුව, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ලද සමාගමෙහි මූල්‍ය වාර්තා වාර්ෂික වාර්තාවෙහි පිටු අංක 41 සිට 84 දක්වා ඇතුළත් කර ඇත.

විගණන වාර්තා

සමාගමේ මූල්‍ය වාර්තා මත විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණන වාර්තාව පිටු අංක 37 සිට 40 දක්වා පිටු තුළ අන්තර්ගතව ඇත.

ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදා ගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 46 සිට 59 දක්වා සඳහන්ව ඇති අතර, පසුගිය වසර හා සංසන්දනය කිරීමේදී ගිණුම්කරණ ප්‍රතිපත්ති වල වෙනසක් සිදු කර නොමැත.

අඛණ්ඩ පැවැත්ම

සමාගමේ කටයුතු පුරෝකථනය කළ හැකි අනාගතයක් දක්වා ඉදිරියට පවත්වා ගෙන යාම සඳහා ප්‍රමාණවත් තරම් සම්පත් සමාගම සතුව ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත්ව ඇත. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන "අඛණ්ඩ බව" යන සංකල්පය මත සකසා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය

2024 වර්ෂයේ සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය සංක්ෂිප්තව පහත පරිදි වේ.

පසුගිය අධ්‍යක්ෂ මණ්ඩලය

ආර්.ඩබ්.එම්.ජේ.එස්.ආර්.පෙරේරා මහතා (2019/12/31 සිට 2024/11/22)	සභාපති/ප්‍රධාන විධායක නිළධාරී
පී.එච්.ඒ.එස්.විජයරත්න මහතා (2023/12/28 සිට)	අධ්‍යක්ෂ/මහා භාණ්ඩාගාර නියෝජිත
අරුණි ශානිකා රණසිංහ මහත්මිය (2022/10/26 සිට2024/04/09)	අධ්‍යක්ෂ
එල්.වික්‍රම ආරච්චි මහතා (2024/04/09 සිට 2024/08/08)	අධ්‍යක්ෂ
කේ.එල්.විජේසිරි මහතා (2024/03/01 සිට 2025/02/11)	අධ්‍යක්ෂ
එච්.වී.ඩබ්.රත්නපාල මහතා (2024/03/01 සිට 2025.02.11)	අධ්‍යක්ෂ
ඩබ්.ආර්.පී.ජයරත්න මහතා (2024/03/01 සිට 2025/02/11)	අධ්‍යක්ෂ
කේ.පී.එස්.ඩබ්.බණ්ඩාර මහතා (2024/03/01 සිට 2025/02/11)	අධ්‍යක්ෂ
එස්.අබේකෝන් මහතා (2024/03/01 සිට 2025/02/11)	අධ්‍යක්ෂ

වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලය

චන්දන දිසානායක මහතා (2024/11/25 සිට)	සභාපති/ප්‍රධාන විධායක නිළධාරී
අරුණි ශානිකා රණසිංහ මහත්මිය (2025/01/15 සිට)	අධ්‍යක්ෂ
පී.වී.ආර්.එස්.කුමාර මහතා (2025/02/11 සිට)	අධ්‍යක්ෂ
ඩබ්.සිරිවර්ධන මහතා (2025/02/11 සිට)	අධ්‍යක්ෂ
ඩිලූෂ ප්‍රනාන්දු මහතා (2025/02/11 සිට)	අධ්‍යක්ෂ
ජේ.එම්.සී.කේ.එස් ජයසිංහ මහතා (2025/02/11 සිට)	අධ්‍යක්ෂ
ඒ.ආර්.කේ.කුමාර මහතා (2025/02/11 සිට)	අධ්‍යක්ෂ

විගණන කමිටුව

පහත සඳහන් අධ්‍යක්ෂවරුන් විගණන කමිටුව නියෝජනය කළ අතර වසර තුළ ඇගයීම් 1 ක් සිදු කර ඇත.

විගණන කමිටුව - 2024

පී.එච්.ඒ.එස්.විජයරත්න මහතා	සභාපති
එච්.වී.ඩබ්.රත්නපාල මහතා	සාමාජික
අරුණි ශානිකා රණසිංහ මහත්මිය	සාමාජික
රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව	සාමාජික

කාර්යය සාධනය

වර්ෂය තුළ සමාගමේ කාර්ය සාධනය පිළිබඳව සහ වැදගත් කළමනාකරණ සහ සංවර්ධන වැඩසටහන් පිළිබඳව විශ්ලේෂණයක් සභාපතිතුමාගේ සමාලෝචනය තුළ පිටු අංක 03 සිට 04 දක්වාත්, කළමනාකරණ හා මූල්‍ය සමාලෝචනය යටතේ පිටු අංක 09 සිට 26 දක්වාත් අන්තර්ගත වේ.

මූල්‍ය කාර්යසාධනය

අයභාරය

සමාලෝචනයට ලක්වන වර්ෂයේදී, හලාවත වැවිලි සමාගම (CPL) රුපියල් මිලියන 961.59 ක අයභාරයක් අත්කර ගත් අතර එය 2023 දී රුපියල් මිලියන 885.35 සිට 9% ක වර්ධනයකි. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පොල් ගෙඩියක ශුද්ධ විකුණුම් සාමාන්‍යය (NSA) සැලකිය යුතු ලෙස ඉහළ යාමයි, එය 2023 දී රුපියල් 64.20 සිට 2024 දී රුපියල් 82.96 දක්වා වැඩි විය. පොල් අංශය සමාගමෙහි ආදායමට ප්‍රධාන දායකත්වය ලබා දෙමින් රුපියල් මිලියන 868.92 ක අදායමක් ඉපයූ අතර එය පෙර වසරේ රුපියල් මිලියන 770 සිට 13% ක වැඩිවීමකි.
ආදායමේ සංයුතිය මූල්‍ය ප්‍රකාශනවල 19 වන සටහනේ දක්වා ඇත.

අනෙකුත් මෙහෙයුම ආදායම්

සමාලෝචිත වර්ෂයේදී, හලාවත වැවිලි සමාගමෙහි අනෙකුත් මෙහෙයුම් ආදායම රුපියල් මිලියන 72.09 ක් වූ අතර එය 2023 දී වාර්තාවූ රුපියල් මිලියන 94.01ක සිට ආසන්න වශයෙන් 23% ක අඩුවීමකි. මෙම පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පොල් ගස් අලෙවියෙන් ලැබුණු ආදායම රුපියල් මිලියන 0.21 කින් අඩුවීම, දැව ගස් අලෙවියෙන් ලැබුණු ආදායම රුපියල් මිලියන 13.97 කින් පහත වැටීම සහ වැව් පස් ඉවත් කිරීම සහ ඉඩම් පුනරුත්ථාපන කටයුතුවලින් ලැබුණු ආදායම රුපියල් මිලියන 14.05 කින් පහත වැටීමයි. මෙම සාධක සාමූහිකව පෙර වසරට සාපේක්ෂව අනෙකුත් ආදායම්වල අහිතකර විචලනයට දායක විය. අනෙකුත් ආදායම් ප්‍රභවයන් පිළිබඳ වැඩිදුර තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල අංක 21 සටහන තුළ දක්වා ඇත.

මූල්‍ය ආදායම

සමාලෝචනයට ලක්වන වර්ෂය සඳහා මූල්‍ය ආදායම රුපියල් මිලියන 118.30 ක් වූ අතර එය 2023 දී රුපියල් මිලියන 237.39 ක් වූ අතර එය ආසන්න වශයෙන් 50.16% ක අඩුවීමක් පිළිබිඹු කරයි. මෙම තියුණු අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ එම කාලය තුළ ස්ථාවර තැන්පතු පොලී අනුපාතවල සැලකිය යුතු අඩුවීම් ය.

මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචනයට ලක් වූ වර්ෂය තුළ සමාගම, පෙර වර්ෂයේ රුපියල් මිලියන 302.61 ට සාපේක්ෂව, රුපියල් මිලියන 219.21 ක බදු පෙර ලාභයක් (PBT) වාර්තා කළේය, එය සැළකිය යුතු අඩුවීමක් පෙන්නුම් කරයි. ලාභදායීත්වයේ මෙම පහත වැටීමට ප්‍රධාන හේතුව වූයේ ස්ථාවර තැන්පතු මත අඩු පොලී අනුපාත හේතුවෙන් මූල්‍ය ආදායමේ සැලකිය යුතු අඩුවීමකි. මීට අමතරව, අධි වර්ධිත සහ නොවිකුණූ පොල් පැළ තවාන් වටිනාකම පොත්වලින් කපා හැරීම (write-off) එම අංශයේ දළ පාඩුවකට හේතු විය. අනෙකුත් මෙහෙයුම් ආදායමේ අඩුවීමක් ද සමාගමේ මූල්‍ය කාර්ය සාධනයට බලපෑවේය. දළ දේශීය නිශ්පාදන අවධමකය (GDP Deflector) මත පදනම්ව වාර්ෂිකව ගණනය කරන ලද, ජන වසම කල්බදු වත්කම් (Leasehold Assets) මත ඇතිවන විලම්භිත බදු කුලී (Contingent Lease Rentals) හා සම්බන්ධ මූල්‍ය පිරිවැය (Finance Cost) වැඩිවීම ද සමස්ත ලාභය අඩුවීමට දායක විය.

බදු පසු ලාභය / (පාඩුව)

සමාලෝචනයට ලක් වූ වර්ෂය තුළ සමාගම රුපියල් මිලියන 138.37 ක බදු පසු පාඩුවක් වාර්තා කළේය. මෙය ප්‍රධාන වශයෙන් රුපියල් මිලියන 323.30 ක් වන කල් තබන ලද බදු ප්‍රතිපාදනයක් (deferred Tax Provision) හඳුනා ගැනීම හේතුවෙනි. මෙය අදාළ බදු රෙගුලාසි සහ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සිදු කරන ලද මුදල් නොවන ඇතුළත් කිරීමකි (non-cash Entry). සංශෝධිත බදු නීති අනුව, 2024 මාර්තු 31 දක්වා බදුවලින් නිදහස් කර තිබූ කෘෂි වගා

කටයුතු වලින් ලැබෙන ආදායම, 2024 අප්‍රේල් 1 දින සිට බදු අය කළ හැකි විය. ඒ අනුව, LKAS 12 - ආදායම් බදු අවශ්‍යතාවලට අනුකූලව, කෘෂි වගා මෙහෙයුම් වලින් පැන නගින බදු අය කළ හැකි තාවකාලික වෙනස්කම් මත අපේක්ෂිත අනාගත බදු බලපෑම පිළිබිඹු කිරීම සඳහා සමාගම 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල කල් තබන ලද බදු වගකීමක් (deferred Tax Liability) හඳුනා ගත්තේය.

මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ විස්තර සමස්ත ආදායම් ප්‍රකාශනයේ (Statement of Comprehensive Income) දක්වා ඇත.

ස්ථාවර වත්කම්

2024 වර්ෂය තුළ සමාගම නව/යථි වගාවන් සඳහා සහ නොමේරූ වගාවන් කළමනාකරණය සඳහා රුපියල් මිලියන 79.45 ක් (2023 රුපියල් මිලියන 69.38 ක්) ආයෝජනය කර ඇති අතර, දේපල, පිරියත සහ උපකරණ සඳහා රුපියල් මිලියන 32.1 ක් (2023: රුපියල් මිලියන 45.51 ක්) ආයෝජනය කර ඇත. 2024 වර්ෂයේ ශේෂ පත්‍ර දිනය වන විට ජංගම නොවන වත්කම්වල (දේපල, පිරියත සහ උපකරණ, බදු දීමේ අයිතිය, පෙව විද්‍යාත්මක වත්කම්, බදු දීමේ දේපල වැඩිදියුණු කිරීම් ආදිය) ශුද්ධ පොත් වටිනාකම (Net Book value) රුපියල් මිලියන 1,667.93 ක් (2023: රුපියල් මිලියන 1,590.94 ක්) විය. ජංගම නොවන වත්කම් පිළිබඳ විස්තර විගණිත මූල්‍ය ප්‍රකාශනවල සටහන් 04-08 සහ 11.1 හි දක්වා ඇත.

කෙටි කාලීන ආයෝජන

2024 දෙසැම්බර් 31 වන විට සමාගමේ කෙටි කාලීන ආයෝජන රුපියල් මිලියන 1,094.48 ක් වූ අතර, එය පෙර වර්ෂයේ රුපියල් මිලියන 1,090.24 ට සාපේක්ෂව සුළු වැඩිවීමකි. මෙම වැඩිවීම මෙහෙයුම් අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් පවත්වා ගනිමින් ප්‍රශස්ත ප්‍රතිලාභ සහතික කිරීම සඳහා ද්‍රවශීල වත්කම් කළමනාකරණය කිරීමේ සමාගමේ උපාය මාර්ගික ප්‍රවේශය පිළිබිඹු කරයි. මීට අදාළ සවිස්තරාත්මක තොරතුරු සඳහා, මූල්‍ය ප්‍රකාශනවල 12 වන සටහන බලන්න.

සංචිත

2024 දෙසැම්බර් 31 වන විට, හලාවත වැවිලි සමාගමෙහි (CPL) හි මුළු සංචිත ප්‍රමාණය රුපියල් මිලියන 1,991.51 ක් වූ අතර, එය 2023 දී වාර්තා වූ රුපියල් මිලියන 2,179.60 ට සාපේක්ෂව අඩුවීමකි. මෙම අඩුවීමට ප්‍රධාන හේතුව වූයේ රඳවාගත් ඉපැයීම්වල (retained Earnings) අඩුවීමයි, එය රුපියල් මිලියන 1,844.72 සිට රුපියල් මිලියන 1,623.10 දක්වා අඩු වූ අතර, එයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ රුපියල් මිලියන 323.30 ක විලම්භිත බදු ප්‍රතිපාදනයක් හඳුනා ගැනීමයි. මෙම මුදල් නොවන ගැලපීම 2024 අප්‍රේල් 1 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධිත බදු නීතිවලට අනුකූලව සිදු කරන ලදී.

බදුකරණය

ආදායම් බදු පිළිබඳ සවිස්තරාත්මක ප්‍රකාශයක් හා සමාගමට අදාළ වන අනුපාත, ගිණුම්කරණ ලාභ, බදු අය කළ හැකි ලාභ සමඟ සැසඳුම් ප්‍රකාශය, මූල්‍ය ප්‍රකාශනවල 24 වන සටහනේ පිටු අංක 77 හී ඉදිරිපත් කර ඇත.

ප්‍රකාශිත ප්‍රාග්ධනය

2024 දෙසැම්බර් 31 දිනට සමාගමේ මුළු ප්‍රකාශිත ප්‍රාග්ධනය සාමාන්‍ය කොටස් 20,000,001 කින් සමන්විත රුපියල් 200,000,010 ක් වන අතර, එයට එක් ස්වර්ණමය කොටසක් ද ඇතුළත් වේ. වර්ෂය තුළ කොටස් වෙන් කිරීම් (Share allotments) සිදු කර නොමැත.

ප්‍රාග්ධන බැඳීම් හා අසම්භාව්‍ය වගකීම්

අසම්භාව්‍ය වගකීම් සහ ප්‍රාග්ධන බැඳීම් පිළිබඳ විගණනය කරන ලද මූල්‍ය වාර්තා සටහන් අංක 28 තුළ අනාවරණය කර ඇත.

මූල්‍ය වාර්තාව ඉදිරිපත් කරන දිනට පසු සිදුවීම්

මූල්‍ය වාර්තා සටහන් අංක 25.2 තුළ හෙලිදරව් කර ඇති කරුණු හැර සමාගම කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් සිදු කල හැකි ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම් හඳුනාගෙන නොමැත.

අධ්‍යක්ෂකවරුන්ගේ බැඳීම්

සමාගමෙහි ගිණුම් වාර්තා සටහන් අංක 26 හි දක්වා ඇති කරුණු හැර අධ්‍යක්ෂවරුන්ගේ වෙනත් සෘජු හෝ වක්‍ර බැඳීම් සමාගම සමඟ නොමැත.

අධ්‍යක්ෂකවරුන්ගේ කොටස් හිමිකම

සමාගමේ කිසිම අධ්‍යක්ෂවරයෙක් හෝ ඔහුගේ / ඇයගේ කාලාත්‍රයෙකු සමාගමේ කොටස් හිමිකමක් දරන්නේ නැත.

සේවා නියුක්තිය

සමාගමේ තිරසාර උන්නතිය සඳහා රජයේ නීති වලට අනුකූලව කටයුතු කරන අතර සේවකයින් සම්බන්ධයෙන් පුහුණුව, උසස්වීම්, විනයානුකූල තීරණ ආදි කරුණු සම්බන්ධව සියලුම සේවකයින්ට කුසලතාව පදනම්ව එක හා සමාන අවස්ථාවන් සලසනු ලබයි. එසේම සමාගම සේවකයන්ට සම තැන පදනම මූලික කර ගනිමින් සෑම සේවා නියුක්තිකයෙකු හටම ලිංග භේදය, ජාති භේදය, ආගම, විවාහක තත්වය, දේශපාලන පසු බිම හෝ කායික දුබලතාවයන් නොසලකා සම අවස්තාවන් ලබා දීමට කටයුතු කරනු ලබයි.

ව්‍යවස්ථාපිත ගෙවීම්

සමාගම විසින් ශේෂ පත්‍ර දිනට ගෙවිය යුතු සියලුම බදු, ගාස්තු, සියලු දායක මුදල් සහ සමාගමේ සේවකයින්ට අදාලව සේවකයන් වෙනුවෙන් ගෙවිය යුතු බදු, අනෙකුත් ව්‍යවස්ථාපිත ගෙවීම් හා සමාගම විසින් ගෙවිය යුතු ගෙවීම් ගෙවා ඇති බවට හෝ ගෙවීම් සිදුකිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇති බවට අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ දැනීම අනුව තහවුරු කරනු ලබයි.

විගණකවරු

2024 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති විසින් විගණනය කර ඇති බව වාර්තා කිරීමට අපි සතුටු වෙමු. විගණන මතය ඇතුළත් ස්වාධීන විගණකාධිපති වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 37 සිට 40 දක්වා ඉදිරිපත් කර ඇත.

සත්‍ය හා සාධාරණ විගණන මතය මඟින් සමාගමේ පාරදෘශ්‍යභාවය, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීම සහ ඵලදායී අභ්‍යන්තර පාලනයන් පිළිබඳ කැපවීම පිළිබිඹු කරයි. මෙම මතය සමාලෝචනයට ලක් වූ වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල විශ්වසනීයත්වය සහ නිරවද්‍යතාව අවධාරණය කරයි.

වාර්ෂික මහා සභා රැස්වීම

වාර්ෂික මහා සභා රැස්වීම 2025 ජුනි 30 වන දින පෙ.ව. 10.00 ට අංක 165, පුත්තලම පාර, හලාවත පිහිටි හලාවත වැවිලි සමාගමේ ප්‍රධාන කාර්යාලයේ හිදී පැවැත්වීමට නියමිතය.

මහා සභා රැස්වීමේ නිවේදනය සහ පෙරකලාසි පෝරමය පිටු අංක 86 සහ 87 යටතේ අමුණා ඇත.

මෙම වාර්තාව හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය
වෙනුවෙන් අත්සන් කරන ලදි.

.....
චන්දන දිසානායක
සභාපති/ ප්‍රධාන විධායක නිළධාරී

.....
කෝපරේට් ඇඩ්වයිසරි සර්විස් (පුද්) සමාගම
ලේකම්වරු - හලාවත වැවිලි සමාගම
කොළඹ

අධ්‍යක්ෂ මණ්ඩල වගකීම් පිළිබඳ ප්‍රකාශය

2017 අංක 07 දරණ සමාගම් පනත යටතේ සමාගමේ මූල්‍ය වාර්තාකරණය පිළිබඳව වගකීම හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තහවුරු කරයි. සමාගමේ විගණක වන විගණකාධිපතිතුමාගේ වගකීම පිළිබඳ සිය වාර්තාවෙන් සංක්ෂිප්තව දක්වා ඇත.

මෙම වාර්තාවේ ඇතුළත් කර ඇති 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සකස් කර ඇති අතර 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාර තොරතුරු වීමගින් දක්වා ඇත.

සමාගම සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව ක්‍රියාත්මක කර ඇති බවටත් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාළ සියලු ගිණුම්කරණ ප්‍රමිතීන් භාවිතා කළ බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වේ. මෙම ප්‍රමිතීන්ගෙන් ප්‍රමාණාත්මකව වෙනස් වන අවස්ථා ඇතොත්, වීවා නිසි ආකාරයෙන් අනාවරණය කර ඇති අතර ඊට හේතු පැහැදිලි කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා භාවිත කරන ලද විනිශ්චයන් සහ ඇස්තමේන්තු සාධාරණ හා විචක්ෂණශීලි වෙයි. සමාගම තම මූල්‍ය තත්ත්වය ප්‍රමාණවත් නිරවද්‍යතාවයන් හා සාධාරණ ලෙස නිරූපණය කිරීම සඳහා නිසි ලෙස මූල්‍ය වාර්තා පවත්වාගෙන යාමේ වගකීම පිළිබඳ අධ්‍යක්ෂවරු සහතික වේ. වාර්ෂික වාර්තාවේ දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන මඟින් සමාගමේ කාර්යයන් පිළිබඳ සත්‍ය හා සාධාරණ මතයක් අන්තර්ගත වන බවට ද අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රකාශ කර සිටී.

සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධති පිළිබඳව සමස්ථ වගකීම අධ්‍යක්ෂවරු වෙත පැවරේ. ප්‍රමාණාත්මක අවප්‍රකාශ හා වංචා වලක්වාලන අභ්‍යන්තර පාලන ක්‍රමවේද පවතින බව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරමින් ඔවුන් විසින් ස්ථාපිත කරන ලද අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ගෙන් සමන්විත අභ්‍යන්තර පිරික්සුම්, අභ්‍යන්තර විගණන, මූල්‍ය හා වෙනත් පාලන ක්‍රමවේදයන් මඟින් ගණුදෙනු නිසි අධිකාරියට අනුව සිදු වන බවට හා නිසි පරිදි වාර්තා වන බවටත් සියලු වත්කම් ආරක්ෂා විය හැකි ප්‍රමාණාත්මක අවප්‍රකාශ හා වංචා වලක්වා හෝ සාධාරණ කාලයක් තුළ දැන ගැනීමට හැකි වන පරිදි සකසා ඇති බව සනාථ කරයි.

ඉදිරි වසර ගණනාවක් පුරා අඛණ්ඩව පවත්වා ගෙන යාමට අවශ්‍ය සම්පත් ප්‍රමාණාත්මකව ඇති බව අධ්‍යක්ෂවරුන්ගේ මතය වන අතර මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී අඛණ්ඩ පැවැත්ම නොවෙනස්ව අනුගමනය කරනු ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුවට අවශ්‍ය පරීක්ෂණයන් හා සමාලෝචනයන් කිරීමට සියලුම තොරතුරු සහ සහය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දී ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් සියලුම මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය වාර්තා, අදාළ දත්ත සමඟ පරීක්ෂා කර ඔවුන්ගේ නිදහස් අදහස් පළ කර ඇති අතර, වීම වාර්තාද වාර්ෂික වාර්තාව තුළ ඇතුළත් කර ඇත.

සමාගම විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන දිනට ගෙවීමට නියමිත දන්නා සියලුම බදු හා සමාගමේ සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු ගෙවීම් සහ සමාගම විසින් ගෙවිය යුතු අනෙකුත් ව්‍යවස්ථාපිත ගෙවීම් ගෙවා අවසන් කර ඇති හෝ ගෙවීම් සිදු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති බවට හෝ අධ්‍යක්ෂවරුන් සහතික වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

සිමාසහිත කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (පුද්)
සමාගම ලේකම්වරු, හලාවත වැවිලි සමාගම

එන්ඩබ්ලිව්සීජේ/කේආර්/එෆ්/සීපීඑල්/එෆ්ඒ/2024/01 2025 ජූනි 20 දින

සභාපති
හලාවත වැවිලි සමාගම

හලාවත වැවිලි සමාගමෙහි 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

හලාවත වැවිලි සමාගමෙහි 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සමාගමේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමාගමේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.
මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාලව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2024 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

■ වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

■අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

■ භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

■සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

■ මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1. 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2. අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුයාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් හෝ පොදු විශේෂ විධිවිධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව

නීතිරීති / විධානයට යොමුව	**නිරීක්ෂණය**
2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.6	ඡේදය චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.

2.2.3. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව

2.2.4. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර, සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාල නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) සමාගම සතු පොල් ඉඩම්වල ඵලදාව අඩු බැවින් බනිජ වැලි මිශ්‍ර පස් ඉවත් කර පොල් පැල සිටුවා භූමිය සංවර්ධනය කිරීමට අදාලව සභාපතිවරයා ඉදිරිපත් කළ ව්‍යාපෘති යෝජනාවක් අනුව, මුක්කුතොඩුවාව වතු යායෙහි වැලි ඉවත් කිරීමේ අදියර 1 හා 2 ව්‍යාපෘති පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුට පවරා 2021 වර්ෂයේ ආරම්භ කර ක්‍රියාක්මක කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය අනුමත කළ රාජ්‍ය ආයතනවලට අනුමැතිය ලබා දීමේදී විධිමත් අධ්‍යයනයක් සිදු කර තිබුණ බව හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී විධිමත් අධීක්ෂණයක් සිදු කළ බව විගණනයට නිරීක්ෂණය නොවීම හා භූමියෙන් ඉවත් කර රැගෙන යන පස් ප්‍රමාණය තහවුරු කර ගැනීම ඇතුළු ව්‍යාපෘතිය අධීක්ෂණ කටයුතු සඳහා විධිමත් අභ්‍යන්තර පාලනයක් ස්ථාපිත කර නොතිබුණු අතර, සවිකර තිබුණු CCTV පද්ධතිය තුළද මසක කාලසීමාවක දත්ත පමණක් ගබඩා වී තිබුණි. ව්‍යාපෘතියේ අදියර 1 හා 2 යටතේ කොන්ත්‍රාත්කරුවන් ඉවත් කරගත් පස් කියුබ් 11,792.2 ක් වෙනුවෙන් සමාගම රු. මිලියන 84.5ක් අයකර ගෙන තිබුණද, පාංශු පැතිකඩ මිනුම් වාර්තා අනුව බනිජ වැලි මිශ්‍ර පස් කියුබ් 71,888 ක් භූමියෙන් ඉවත් කර ගෙන තිබුණි.

කෙසේ වුවද, වැඩිපුර ඉවත් කරගත් බනිජ වැලි මිශ්‍ර පස් කියුබ් 60,095.8 හා ඊට අදාල සියයට 50 ක අධිභාරය ද සමඟ රු. මිලියන 650.55 ක් අයකර ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි. භූමියෙන් පස් ඉවත් කර වසර 4 ක් පමණ ගතවී තිබුණද, භූමිය සංවර්ධනය කර පොල් පැල සිටුවීමට සමාගම පියවර ගෙන නොතිබුණ බව ද විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් 2023 පෙබරවාරි 29 දින හලාවත වැවිලි සමාගමට පවරා දී තිබුණ කිලිනොච්චි දිස්ත්‍රික් පලෙයි ප්‍රදේශයේ ඉඩමේ තොට්ටම් වැව ඉදිකිරීමට අදාලව කොන්ත්‍රාත්කරු විසින් 2023 මාර්තු 01 දින සිට 2024 ඔක්තෝබර් 30 දින දක්වා වැලි කියුබ් 11,556 ක් ඉවත් කර ගැනීම වෙනුවෙන් රු.මිලියන 15.6 ක මුදලක් කොන්ත්‍රාත්කරුගෙන් සමාගම ලබාගෙන තිබුණි.

එහෙත් වැලි ඉවත් කිරීමේ අවස්ථාවන් ආරක්ෂිත කැමරා පද්ධතියක් මගින් අධීක්ෂණය කළද එහි තොරතුරු ගබඩාකර නොතිබීම හා ඉවත් කරන ලද වැලි ප්‍රමාණය පිළිබඳව වෘත්තීය දැනුමක් සහිත නිලධාරීන් ලවා පාංශු පැතිකඩ මැනුම් වාර්තා ලබාගෙන තක්සේරු කර නොතිබුණි. එමගින් සත්‍ය වශයෙන් ඉවත් කළ වැලි කියුබ් ප්‍රමාණය සහ සමාගමට ලබා දුන් මුදලේ නිරවද්‍යතාවය තහවුරු කරගත නොහැකි විය.

(ඇ) ජාතික පොල් වගා කිරීමේ දිනය වෙනුවෙන් 2023 වර්ෂයේදී පලෙයි වතුයායට අයත් අක්කර 20 ක පමණ භූමියක් සංවර්ධනය කර පොල් වගා කිරීම සඳහා ක්‍රියාත්මක කර තිබුණු වැඩසටහනට සමගාමීව පවත්වන ලද සමාරම්භක උත්සවය වෙනුවෙන් ඉඩම් සැකසීම, වැටවල් සැකසීම, ඉන්ධන හා වෙනත් වියදම්, උපකරණ මිලදී ගැනීම, ආහාර හා නවාතැන් පහසුකම් සැපයීම වෙනුවෙන් රු.5,190,532 ක වියදමක් හලාවත වැවිලි සමාගම විසින් දරා තිබුණද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් දරා තිබුණු උක්ත වියදම නිෂ්කාර්ය වී තිබුණි.

(ඈ) සමාගමට අයත් පතස් 12 ක වැලි, මඩ සහිත පස් අලෙවි කිරීමට 2021 වර්ෂයේ සිට 2025 වර්ෂය තෙක් කඩින් කඩ ගිවිසුම් අළුත් කරමින් කොන්ත්‍රාත් ලබා දී තිබුණි. එහිදී ගිවිසුම්ගත කැණීම් ප්‍රමාණය කියුබ් 65,526 ක් හා අපේක්ෂිත ආදායම රු.මිලියන 76.767ක් විය. කෙසේ වෙතත්, 2025 මැයි 21 දිනට කියුබ් 22,692ක් සඳහා ලැබී තිබුණු ආදායම රු.මිලියන 31.12 ක් බව නිරීක්ෂණය විය. කැණීම් කර තිබූ සත්‍ය කියුබ් ප්‍රමාණය පිළිබඳව තහවුරු කර ගැනීම සඳහා තාක්ෂණික වාර්තා විගණනයට ඉදිරිපත් නොවීම මත ඉවත් කර ගත් පස් කියුබ් ප්‍රමාණයේ නිවැරදිතාවය විගණනයට තහවුරු නොවීය. එක් එක් වතු කලාපවල මඩ සහිත පස් හා වැලි කියුබ් එකක විකුණුම් මිල රු.670 හා රු.5020 අතර පරාසයක පැවතුණ ද කියුබ් එකක මිල තීරණය කළ පදනම විගණනයට අනාවරණය නොවීය. තවද, පතස් කැණීම් සිදු කිරීමට කොන්ත්‍රාත් ලබාදීම 2019 වර්ෂයේ සිටම සිදු වී තිබූ අතර විගණිත දින වන විටද කඩින් කඩ ගිවිසුම් දීර්ඝ කර කැණීම් සිදු කිරීමට අවසර ලබා දී තිබුණ ද පස් හෝ වැලි කියුබ් එකක මිල වර්තමාන වෙළඳපල මිල සමඟ ගැලපීම් කර වෙනස් කිරීමට ද කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඉ) සමාලෝචිත වර්ෂයේ වැලි විකිණීමට අදාළව ඉන්වොයිස් නිකුත් කිරීමේ දී එකතු කළ අගය මත බදු (VAT) රු. මිලියන 1.8 ක් කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර නොතිබුණ අතර එම බදු මුදල සමාගම විසින් ගෙවා තිබුණි.

(ඊ) මංගලවළිය වතු කලාපයට අයත් සිනසෝල වත්තේ පිහිටි වැව ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත්තුව වසර තුනකට ආසන්න කාලයක් ගතවන තෙක් අඩක් හෝ අවසන් කිරීමට නොහැකි වීම මත එහි ගිවිසුම අවලංගු කර කාර්යසාධන ඇපකරයේ රු.1,000,000 ක මුදලින් රු.900,000 ක් නැවත කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. මෙම ප්‍රදේශයේ රැඳී තිබුණ ජලයද එහි බැම්ම කැඩී තිබීම මත ප්‍රතිසංස්කරණ කටයුතු නිසියාකාරව සිදු නොවීම හේතුවෙන් ජලය ඉවතට ගලා යමින් පැවතුණු බව නිරීක්ෂණය විය.

2.3. වෙනත් කරුණු

(අ) සමාගමේ නිෂ්පාදනයන්හි ආදායම හා විකුණුම් පිරිවැය සැසඳීමේදී විකුණුම් පිරිවැය ආදායමෙන් සියයට 50 ට වඩා වැඩි ප්‍රතිශතයක් පවතින අයිතම 08 ක් පැවතුණි. එය සියයට 54 ක සිට 1253 අතර පරාසයක විය. අයිතම 03 ක විකුණුම් පිරිවැය, ආදායම ඉක්මවා තිබුණ අතර තවදුරටත් පිරිවැය අඩුකර නිෂ්පාදන ලාභදායී තත්ත්වයකට ගෙන ඒමට සමාගම විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2010 වර්ෂයේදි සමාගම විසින් ජනතා වතු සංවර්ධන මණ්ඩලය, ඇල්කඩුව වැවිලි සමාගම, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සමාගම, රාජ්‍ය සම්පත් ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය හා රබර් නිෂ්පාදන අපනයන සංස්ථාව යන ආයතන 05 කට ලබාදී තිබූ රු. මිලියන 105 ක ණය මුදල හා ඒ සඳහා වූ රු.මිලියන 91.5 ක පොලිය ද සහිතව එකතුව රු. මිලියන 196.5 ක් සමාලෝචිත වර්ෂය අවසානයට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ජී.එච්.ඩී. ධර්මපාල
විගණකාධිපති (වැඩබලන)

(මෙය ඉංග්‍රීසි භාෂාවෙන් නිකුත් කරන ලද වාර්තාවේ සිංහල පරිවර්ථනයකි.)

හලාවත වැවිලි සමාගම
විස්තීරණ ආදායම් ප්‍රකාශනය

දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා	සටහන්	2024	2023
		රු.	රු.
ආදායම	19	961,593,165	885,350,241
විකුණුම් පිරිවැය	20	(722,205,190)	(657,567,338)
දළ ලාභය		239,387,975	227,782,903
ජීව විද්‍යාත්මක වත්කම්වල සාධාරණ වටිනාකම මත ලාභ/අලාභ	7.3	47,618,767	10,145,544
වෙනත් මෙහෙයුම් ආදායම් සහ ප්‍රතිලාභ	21	72,094,993	94,014,156
පරිපාලන සහ අනිකුත් වියදම්	22	(179,497,864)	(205,069,246)
මෙහෙයුම් තුළින් ජනනය වූ ලාභය		179,603,872	126,873,356
මූල්‍ය ආදායම	23	118,297,996	237,386,004
මූල්‍ය වියදම	23.1	(78,695,020)	(61,652,953)
බදු පෙර ලාභය		219,206,847	302,606,407
බදු වියදම් (වෙන් කිරීම්)/ නැවත මාරු කිරීම්	24	(357,581,903)	(70,868,847)
වර්ෂය සඳහා ලාභය		(138,375,056)	231,737,560
වෙනත් විස්තීර්ණ ආදායම්			
නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් ආයුගණක ලාභය/(අලාභය)	16	(13,490,348)	(21,265,292)
වත්කම් නැවත තක්සේරු කිරීම මත කල් දැමූ බදු ගැලපීම		(6,230,688)	(923,148)
වර්ෂයට මුළු විස්තීර්ණ ආදායම බදු පසු		(158,096,092)	209,549,120
කොටසක ඉපැයුම	25.1.2	(6.92)	11.59

වරහන් තුළ ඇත්තේ අඩු කිරීමිය.

පිටු අංක 46 සිට 84 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශනවලම කොටසක් වේ.

හලාවත
2025 මාර්තු 07 වන දින

(මෙය ඉංග්‍රීසි භාෂාවෙන් නිකුත් කරන ලද වාර්තාවේ සිංහල පරිවර්ථනයකි.)

හලාවත වැවිලි සමාගම
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනට	සටහන	2024	2023
		රු.	රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
ජනවසම වතුවල හිස් භූමි වල කල්බදු හිමිකම	04	101,054,986	105,374,496
ජනවසම කල්බදු දේපල පිරියත හා උපකරණ හිමිකම			
(භාවිතයට ගැනීමට අයිතියක් ඇති ඉඩම් කල්බදු පෙව හිමිකම් හැර)	05	769,468	769,468
ජනවසම වතු යායන් වල පෙව වත්කම් වල කල්බදු හිමිකම	05.1	24,652,692	27,162,119
කල්බදු දේපල සංවර්ධනය	6	1,123,389,973	1,073,815,205
පෙව වත්කම් පශු සම්පත්	7.1	27,356,775	25,544,815
පාරිභෝජ්‍ය පෙව වත්කම්	7.2	179,127,287	139,297,920
සින්නක්කර දේපල, පිරියත හා උපකරණ හිමිකම	08	193,357,895	201,427,046
වෙනත් මූල්‍ය වත්කම්	11.1	18,220,532	17,550,384
		1,667,929,607	1,590,941,452
ජංගම වත්කම්			
ධාරක ජීව විද්‍යාත්මක වත්කම් වල ඇති ඵලදාව	9.1	33,852,934	25,993,440
තොග	9.2	76,577,005	148,934,886
විකිණීම සඳහා තබා ඇති වත්කම්	9.3	16,004	16,004
වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ	10	91,453,072	139,052,094
ලැබිය යුතු ආදායම් බදු		737,324	
රාජ්‍ය ව්‍යවසායන් වලට සපයන ලද මූල්‍ය පහසුකම්	11		
වෙනත් මූල්‍ය වත්කම්	11.1	8,045,509	7,300,268
වෙනත් ජංගම වත්කම්		1,321,706	1,316,343
කෙටිකාලීන ආයෝජන	12	1,094,477,282	1,090,243,489
මුදල් හා බැංකු ශේෂයන්		12,501,332	43,794,899
		1,318,982,168	1,456,651,425
මුළු වත්කම්		2,986,911,775	3,047,592,877
ස්කන්ධය හා වගකීම්			
ප්‍රාග්ධනය හා සංචිත			
කොටස් ප්‍රාග්ධනය	13	200,000,010	200,000,010
රඳවා ගත් ඉපැයීම		1,623,093,272	1,844,717,949
ප්‍රත්‍යාගණන සංචිත (දැව ප්‍රත්‍යාගණනය සහ මොටර් රථ ප්‍රත්‍යාගණනය)		368,412,899	334,884,314
මුළු ස්කන්ධය		2,191,506,181	2,379,602,273
ජංගම නොවන වගකීම් සහ විලම්භිත ආදායම්			
විලම්භිත බදු බැරකම	14	329,623,171	93,175
විලම්භිත ආදායම් - ප්‍රදාන හා අධාර	15	11,967,009	10,088,526
විශ්‍රාමික ප්‍රතිලාභ පාරිතෝෂිත බැඳීම්	16	112,425,621	92,025,543
කල්බදු ගිවිසුම් යටතේ ඇති බැඳියාවන් - ජනවසම	17	154,178,498	157,243,235
		608,194,299	259,450,479
ජංගම වගකීම්			
වෙළඳ හා අනෙකුත් ගෙවීමට ඇති දෑ	18	184,146,558	360,835,121
ගෙවිය යුතු ආදායම් බදු	-		44,768,673
කල්බදු ගිවිසුම යටතේ ඇති බැඳියාවන් - ජනවසම	19	3,064,737	2,936,331
		187,211,295	408,540,125
මුළු ස්කන්ධය සහ වගකීම්		2,986,911,775	3,047,592,877

වරහන් තුළ ඇත්තේ අඩු කිරීමය.

පිටු අංක 46 සිට 84 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශනවලම කොටසක් වේ.

සනාථ කිරීම

2007 අංක 7 දරණ සමාගම් පනතේ විධිවිධාන වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශය පිලියෙල කර ඇති බව සහතික කරමි.

.....

ආර්.එම්.ආර්.බී. රත්නායක මහතා
සහකාර සාමාන්‍යාධිකාරී මූල්‍ය

මූල්‍ය වාර්තා සැකසීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. හලාවත වැව්ලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් තබනු ලැබේ.

.....

චන්දන දිසානායක මහතා
සභාපති/ප්‍රධාන විධායක නිලධාරී

.....

අරුණි චිස් රණසිංහ මහත්මිය
අධ්‍යක්ෂ

හලාවත
2025 මාර්තු 07 වන දින

(මෙය ඉංග්‍රීසි භාෂාවෙන් නිකුත් කරන ලද වාර්තාවේ සිංහල පරිවර්ථනයකි.)

හලාවත වැවිලි සමාගම
ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

සටහන්	කොටස් ප්‍රාග්ධනය රු.	දැව සංචිත රු.	නැවත තක්සේරු කළ සංචිත රු.	සමුච්චිත ලාභය රු.	එකතුව රු.
2023 ජනවාරි 01 වන දිනට ශේෂය	200,000,010	223,499,152	97,961,638	1,833,592,353	2,355,053,153
2022 සඳහා ලාභාංශ				(125,000,000)	(125,000,000)
2023 වසර සඳහා අතුරු ලාභාංශ				(60,000,000)	(60,000,000)
වර්ෂයේ ලාභය				231,737,560	231,737,560
වෙනත් විස්තීර්ණ අදායම්	-		-	(22,188,440)	(22,188,440)
දැව සංචිතයට මාරු කිරීම් (7.2)	-	14,346,672		(14,346,672)	-
විලම්භීත බදු ගැලපුම මොටර් රථ නැවත තක්සේරු කිරීමේ සංචිතයට මාරු කිරීම			(923,148)	923,148	
2023 දෙසැම්බර් 31 වන දිනට ශේෂය	200,000,010	237,845,824	97,038,490	1,844,717,949	2,379,602,273
2023 සඳහා අවසන් ලාභාංශය				(30,000,000)	(30,000,000)
වර්ෂයේ ලාභය			-	(138,375,056)	(138,375,056)
වෙනත් විස්තීර්ණ අදායම්			-	(19,721,036)	(19,721,036)
දැව සංචිතයට මාරු කිරීම් (7.2)		39,759,273		(39,759,273)	-
විලම්භීත බදු ගැලපුම මොටර් රථ නැවත තක්සේරු කිරීමේ සංචිතයට මාරු කිරීම			(6,230,688)	6,230,688	-
මුළු විස්තීර්ණ ආදායම්	200,000,010	277,605,098	90,807,802	1,623,093,272	2,191,506,181
2024 දෙසැම්බර් 31 වන දිනට ශේෂය	200,000,010	277,605,098	90,807,802	1,623,093,272	2,191,506,181

වරහන් තුළ ඇත්තේ අඩු කිරීමිය.

පිටු අංක 46 සිට 84 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශනවලම කොටසක් වේ.

හලාවත
2025 මාර්තු 07 වන දින

(මෙය ඉංග්‍රීසි භාෂාවෙන් නිකුත් කරන ලද වාර්තාවේ සිංහල පරිවර්ථනයකි.)

හලාවත වැවිලි සමාගම
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2024	2023
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ / (යෙදවූ) මුදල් ප්‍රවාහය		
බදු පෙර ලාභය	219,206,847	302,606,407
ගැලපීම්:		
- ක්ෂයවීම්/ක්‍රමක්ෂයවීම්	70,390,555	64,398,037
- ප්‍රදාන සඳහා වූ ක්‍රමක්ෂයවීම්	(604,017)	(554,766)
- මූල්‍ය වියදම්	78,695,020	61,652,953
- මූල්‍ය ආදායම්	(118,297,996)	(237,386,004)
- නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය හා වෙන්කිරීම්	20,062,472	17,718,645
- දේපල පිරියත හා උපකරණ අපහරණය කිරීමෙන් ලත් ලාභය	-	(18,280)
- ජීව විද්‍යාත්මක වත්කම් සාධාරණ අගය මත ලාභ/(අලාභ)	(47,618,767)	(10,145,544)
- දැව ගස් විකිණීමෙන් ලද ලාභය	853,095	(13,120,109)
- පොල් ගස් විකිණීමෙන් ලද ලාභය	(22,934,948)	(23,143,644)
- සේවක දිරි දීමනා සඳහා වෙන් කිරීම්	42,849,206	42,495,327
- ප්‍රාග්ධන වත්කම් සඳහා හානි දීමනාව	-	3,657,714.76
- නොනිමි වැඩ පිටතට ගලා යාම සහ වෙනත් ගැලපීම්	6,200,946	298,023
	248,802,413	208,458,759
වෙනස්වීම්		
- තොගවල වැඩිවීම්/(අඩුවීම්)	72,357,882	46,353,395
- කිරි පශු සම්පත්	(1,811,960)	234,285
- වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ	7,943,257	(1,711,944)
- වෙනත් ජංගම වත්කම්	(5,362)	(89,885)
- වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ	(11,346,066)	7,751,553
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය	**315,940,163**	**260,996,163**
- රාජ්‍ය කල්බදු මත ගෙවූ පොලිය	(72,200,322)	(48,773,567)
- නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් ගෙවීම්	(13,152,742)	(16,766,357)
- මූල්‍ය වියදම් ගෙවීම්	(47,551)	(50,728)
- මූල්‍ය ආදායම් ලැබීම්	135,347,584	216,189,231
- අදායම් බදු ගෙවීම්	(74,150,333)	(34,602,322)
- කාර්ය මණ්ඩලයට සහ සේවකයින්ට දිරි දීමනා	(55,044,533)	(93,000,000)
- දැවමය ගස් විකිණීමෙන් ලද මුදල්	10,684,417	27,837,885
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	247,376,684	311,830,306
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය		
- දේපල පිරියත හා උපකරණ විකතු කිරීමෙන්	(32,005,943)	(45,509,472)
- ක්ෂේත්‍ර සංවර්ධන වියදම්	(79,454,711)	(69,376,432)
- පොල් ගස් විකිණීමෙන් ලද මුදල්	22,934,948	23,143,644
- සේවක ණය ප්‍රදානයන්	(12,873,000)	(9,381,800)
- සේවක ණය අය කර ගැනීම්	11,457,611	8,500,922
- කෙටි කාලීන ආයෝජන	(62,318,886)	(15,144,708)
- දේපල පිරියත හා උපකරණ අලෙවියෙන් ලද මුදල්	111,031	53,291
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය	(152,148,949)	(107,714,556)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මූල්‍ය ප්‍රවාහය		
- ලාභාංශ ගෙවීම්	(185,000,000)	(130,000,000)
- රජයේ හිඟ කල්බදු වාරික ගෙවීම	(2,088,896)	(9,099,533)
- ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රදාන ලැබීම්	2,482,500	867,481
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය	(184,606,396)	(138,232,052)
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම්/ (අඩුවීම)	(89,378,661)	65,883,699
වසර ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ වල වටිනාකම (සටහන අ)	602,479,421	536,595,722
වසර අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ වල වටිනාකම (සටහන ආ)	513,100,760	602,479,421
සටහන අ		
මුදල් හා මුදල් වලට සමාන දෑ වසර ආරම්භයේ		
- කෙටි කාලීන ආයෝජන	558,684,521	469,246,687
- මුදල් හා බැංකු ශේෂය	43,794,899	67,349,035
	602,479,421	536,595,722
සටහන ආ		
මුදල් හා මුදල් වලට සමාන දෑ වසර අවසානයේ		
- කෙටි කාලීන ආයෝජන	500,599,427	558,684,521
- මුදල් හා බැංකු ශේෂය	12,501,332	43,794,899
	513,100,760	**602,479,421**

වරහන් තුළ ඇත්තේ අඩු කිරීමය.
පිටු අංක 46 සිට 84 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශනවලම කොටසක් වේ.

හලාවත
2025 මාර්තු 07 වන දින

(මෙය ඉංග්‍රීසි භාෂාවෙන් නිකුත් කරන ලද වාර්තාවේ සිංහල පරිවර්ථනයකි.)

1 සංස්ථාපිත තොරතුරු

1.1 වාර්ථාකරන ස්ථිතිය

1.1.1 පිහිටුවීම සහ නෛතික ආකෘතිය

සීමාසහිත හලාවත වැවිලි සමාගම 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ (සමාගම 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ යළි ලියාපදිංචි කරන ලදි.) සහ 1987 අංක 23 දරණ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ විධි විධානයන්ට අනුව ශ්‍රී ලංකාවේ සංස්ථාගත කළ වගකීමක් සහිත සීමාසහිත සමාගමක් වේ.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය හලාවත, පුත්තලම් පාර, අංක 165 යන ලිපිනයේ පිහිටා ඇති අතර වතුයායවල් පුත්තලම, කුරුණෑගල සහ ගම්පහ යන වැවිලි දිස්ත්‍රික්ක වල පිහිටා ඇත.

1.1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

පොල් වගා කිරීම, කොප්පරා නිෂ්පාදනය හා අමු පොල් හා කොප්පරා අලෙවිය මඟින් ආදායම් ඉපයීම වසර තුළ සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් විය.

1.1.3 පරිපාලකය සහ අවසන් පරිපාලකය

සමාගමේ පරිපාලකය වනුයේ ශ්‍රී ලංකා රජයයි.

1.2 නිකුත් කිරීම සඳහා බලය දීමේ දිනය

2023 මාර්තු මස 31 වන දින දරණ අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව අනුව 2025 මාර්තු මස 07 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා හලාවත වැවිලි සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය ලබා දෙන ලදි.

2. සකස් කිරීමේ පදනම

2.1 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශනය

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිතීන් පිළිබඳ 1995 අංක 15 දරණ පනත යටතේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය (CASL) විසින් නිකුත් කරන ලද ගිණුම්කරණ ප්‍රමිත (SLFRS/LKAS) සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධාන වලට අනුකූලව සකසා ඇත.

2.2 ඇගයීම් පදනම

මූල්‍ය ප්‍රකාශනවල අංක 04, 05 සහ 06 දරණ සටහන්වල විස්තර කර ඇති පරිදි ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් වනම්, ජනවසම කල්බදු ගිවිසුම් යටතේ ඇති කල්බදු වත්කම් හැරුණු කොට වෛතිහාසික පිරිවැය පදනම මත මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. සුදුසු පරිදි විශේෂ ප්‍රතිපත්ති ඉදිරි සටහන්වල විස්තර කර ඇති අතර, මූල්‍ය ප්‍රකාශන තුළ උද්ධමනීය සාධක සඳහා ගැලපීමක් සිදු කර නැත.

2.3 භාවිතා කරන සහ ඉදිරිපත් කරන මුදල් ඒකකය

සමාගමේ භාවිතා කරන මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් මඟින් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති සියලු මූල්‍ය තොරතුරු ආසන්න රුපියලේ අගයට දක්වා ඇත.

2.4 ඇස්තමේන්තු හා විනිශ්චයන් භාවිතා කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් වලට අනුකූලවන පරිදි මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අදාළ කර ගනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තා කර ඇති වත්කම්, බැරකම්, ආදායම් සහ වියදම් යනාදියට බලපාන ඇස්තමේන්තු විනිශ්චය සහ උපකල්පිතයන් තීරණය කිරීමට කළමනාකරණයට සිදු වේ. විනිශ්චයන් හා ඇස්තමේන්තු පදනම් වී ඇත්තේ වාතාවරණ යටතේ සාධාරණ වන බවට විශ්වාස කරන අපේක්ෂාවන් ඇතුළු වෛතිහාසික අත්දැකීම් හා අනෙක් සාධක මත පදනම්වය. එබැවින් සත්‍ය අත්දැකීම් සහ ප්‍රතිඵල මෙම විනිශ්චයන් හා ඇස්තමේන්තු වලට වඩා වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු හා පාදක වූ උපකල්පන පවත්නා පදනම මත සමාලෝචනය කර ඇත. ඇස්තමේන්තු සංශෝධනය වීම කාලපරිච්ඡේදයට හා අනාගත කාල වකවානුවට බලපාන්නේ නම් වීම කාලපරිච්ඡේදය තුළ ගිණුම්කරණ ඇස්තමේන්තු සංශෝධනය ද සිදු කරනු ලැබේ.

2.5 අඛණ්ඩ පැවැත්ම

ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සමාගමේ හැකියාව සමාගමේ කළමනාකාරිත්වය විසින් ඇගයීමට ලක් කර ඇති අතර නුදුරු අනාගත කාලයක් දක්වා ව්‍යාපාර කටයුතු අඛණ්ඩව කර ගෙන යාමට අවශ්‍ය සම්පත් සමාගමට තිබෙන බවට සෑහීමකට පත්විය. තවද ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව කර ගෙන යාමේ සමාගමේ හැකියාව කෙරෙහි සැලකිය යුතු තරමේ සැකයක් ඇති කළ හැකි කිසියම් වැදගත් අවිනිශ්චිතතාවන් පිළිබඳව කළමනාකාරිත්වයට වාර්තා වී නොමැත. අඛණ්ඩ බව පිළිබඳ සංකල්පය පදනම්ව මූල්‍ය ප්‍රකාශන පිලියෙල කරනු ලැබේ.

2.6 සංසන්දනාත්මක තොරතුරු

ආයතනයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව පවත්වා ගෙන යන අතර ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීම්වලට ගැලපෙන පරිදි අවශ්‍ය අවස්ථාවලදී පෙර වර්ෂයේ සංඛ්‍යා නැවත පිළියෙල කර ඇත.

2023 දෙසැම්බර් 31න් අවසන් වන වසර සඳහා අලෙවි අයභාරය හා විකුණුම් පිරිවැය සැසඳුම

	2023 අලෙවි අයභාරය	2023 විකුණුම් පිරිවරය සැසඳුම
2023 වර්ෂයේ පෙර වාර්තා වී තිබූ වටිනාකම	899,693,759	671,910,856
පොල් අලෙවිය මත ගෙවන කොමිස් ගැලපුම (මීට පෙර අයභාරයට හර කර ඇත.)	13,321,145	13,321,145
අංශ අතර අලෙවිය හා මිළ දී ගැනීම	(27,664,664)	(27,664,664)
සකස් කළ අලෙවි අයභාරය / 2023 වර්ෂය සඳහා විකුණුම් පිරිවැය	**88 5,350,241**	**657,567,338**

2.7 වාර්තාකරණ දිනයෙන් පසු හටගත් සිද්ධීන්

වාර්තාකරණ දිනයෙන් පසු හටගත් සියලුම ප්‍රමාණාත්මක සිද්ධීන් සැලකිල්ලට ගෙන ඇති අතර සුදුසු අවස්ථාවලදී මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම හෝ අනාවරණය කිරීම සිදු කර ඇත.

3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

3.1 වත්කම් හා ඒවායේ අගය කිරීම් සඳහා පදනම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කළ වත්කම් යනු මුදල් හා සමාගමේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතු අතරතුර දී හෝ වාර්තා කරන දිනයේ සිට වසරක කාල පරිච්ඡේදයක් ඇතුළත යන දෙකෙන් අඩු කාලය තුළ මුදල් බවට පත් කරනු ලබන වත්කම් වේ. වාර්තා කරන දිනයේ සිට වසරක කාලයකට වඩා වැඩි කාල පරිච්ඡේදයක් සඳහා සමාගමට රඳවා ගැනීමට සිදුවන වත්කම් ජංගම නොවන වත්කම් වේ.

3.1.1 දේපළ, පිරියත හා උපකරණ

3.1.1.1 හඳුනා ගැනීම සහ ඇගයීම

යම් වත්කමක පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි වන්නේ නම් හා වත්කම සම්බන්ධයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒමේ භව්‍යතාවයක් පවතී නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනී.
දේපළ, පිරියත හා උපකරණ ඒවායේ පිරිවැය මත (හෝ කල්බදු හිස් ඉඩම් නම් ඒවායේ තක්සේරු වටිනාකමට) සමුච්චිත ක්ෂය වෙන් කිරීම් හා අපහරණයන් සිදුවී ඇත්නම් එහි අලාභය අඩු කිරීමෙන් පසු දක්වයි.

(අ) සන්තක දේපළ

දේපළ, පිරියත හා උපකරණ ඒවා අත්පත් කර ගැනීමේ දී දැරූ සෘජු පිරිවැයයි. සමාගම විසින් ඉදිකරන ලද වත්කමක් නම් එම වත්කම අදාළ කාර්යයට සුදුසු තත්ත්වයට ගෙන ඒම දක්වා දැරූ සියලු පිරිවැය, එනම් ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය හා ඒ සඳහා සෘජුව දායක විය හැකි වෙනත් වියදම් ඇතුළත් වේ. උපකරණ ක්‍රියාකාරිත්වයට අදාළව මිලදී ගත් මෘදුකාංග අදාළ උපකරණයේ අඛණ්ඩ ක්‍රියාවලියේ කොටසක් ලෙස ප්‍රාග්ධනිත කර ඇත.

දේපළ, පිරියත හා උපකරණවල යම් කිසි සුවිශේෂ කොටස් යම් කාල සීමාවලදී මාරු කිරීම් සිදුකරන අවස්ථාවලදී පිළිවෙලින් එම කොටස් ඵලදායී ආයු කාලයක් හා ක්ෂය කළ හැකි තනි ඒකක වශයෙන් සලකා කටයුතු කරයි. එසේම

සැලකිය යුතු අන්දමින් පරීක්ෂණයක් පවත්වනු ලබන අවස්ථාවලදී හදුනා ගැනිමේ නිර්ණායකයන් සපුරා ඇත්නම් එහි පිරිවැය දේපල, පිරියත හා උපකරණ වල ප්‍රතිෂ්ඨාවක් ලෙස ධාරණ අගයට එකතු කිරිමක් ලෙස හදුනා ගනු ලැබේ. අනිකුත් සියලුම අලුත්වැඩියා හා නඩත්තු විස්තීරණ ප්‍රකාශනයේ වියදම් ලෙස දැක්වේ. නොනිමි ප්‍රාග්ධනය, ඊට අදාළ වත්කම් වලට මාරු කරනු ලබන්නේ එහි ප්‍රථම භාවිතයේදී හෝ වත්කම් ක්‍රියාත්මක කරන අවස්ථාවේදීමය. ප්‍රාග්ධන නොනිමි වැඩ පළමු උපයෝජනයේ දී හෝ වත්කම ආරම්භ කරන වේලාවේ දී එක් එක් වත්කම් ගිණුම්වලට මාරු කරනු ලැබේ.

යම් සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් වත්කමේ ධාරණ අගය අයකර ගැනීමේ හැකියාවක් නොමැති බව හැගෙන අවස්ථා වලදී, හානිකරණය හේතුවෙන් එම දේපල, පිරියත හා උපකරනය ධාරණ අගය යළි සමාලෝචනය කරනු ලබයි.
සියලු මෝටර් රථ පසුකාලීනව එනම් 2020 දෙසැම්බර් 31 ප්‍රත්‍යාගණිත දිනට සාධාරණ අගයට ප්‍රත්‍යාගණනය කර ඇත.

ප්‍රත්‍යාගණනය අගය වැඩි වීම් වෙනත් විස්තීරණ ආදායම් යටතේ හඳුනාගෙන වත්කම් ප්‍රත්‍යාගණන සංචිත ශීර්ෂය යටතේ ස්කන්ධයෙහි සමූචය කර ඇත. කෙසේ වෙතත් ඊට පෙර එම වත්කමෙහි වියදමක් ලෙස හඳුනාගත් ප්‍රත්‍යාගණන අඩුවීමක් ප්‍රතිවර්ත්‍ය කරනු ලබන අවස්ථාවලදී එම ප්‍රමාණයට ප්‍රත්‍යාගණනය වැඩිවීම ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනී. ප්‍රත්‍යාගණනය අඩුවීමක් වියදමක් ලෙස හඳුනාගනු ලබයි. කෙසේ වෙතත් ප්‍රත්‍යාගණනය අඩු වීමක් එම වත්කම සම්බන්ධයෙන්ම පෙර පැවති ප්‍රත්‍යාගණන අතිරික්තයක අගය නොඉක්මවන ප්‍රමාණයම වෙනත් විස්තීරණ ආදායම තුළ හඳුනාගනු ලබයි.

වත්කමක ධාරණ අගයෙන් සමුචිත ක්ෂය අඩු කළ ශුද්ධ අගය වත්කමෙහි ප්‍රත්‍යාගණිත දිනට ප්‍රත්‍යාගණිත වටිනාකමින් ප්‍රතිස්ථාපනය කරනු ලබයි. වත්කම් උපලබ්ධි කරන විට එම වත්කමට අදාළ ප්‍රත්‍යාගණන සංචිත රඳවාගත් ඉපැයීම් වලට මාරු කල යුතුය.

තක්සේරු දෙපාර්තුමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද තක්සේරු වාර්තාවට අනුව 2020 දෙසැම්බර් 31 දිනට මෝටර් රථ ප්‍රත්‍යාගණනය පහත පරිදි වේ.

විස්තරය	2020.12.31 දිනට ශුද්ධ ධාරණ අගය (රු.)	2020.12.31 දිනට ප්‍රත්‍යාගණිත වටිනාකම (රු.)	ප්‍රත්‍යාගණිත ලාභ (රු.)
මෝටර් රථ (ප්‍රත්‍යාගණිත)	4,987,021.00	103,875,000.00	98,887,979.00

ප්‍රත්‍යාගණනය කර ඇති ඉහත වත්කම් වල 2021 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 8 තුළ ඉදිරිපත් කර ඇත.

කෙසේ වෙතත් තක්සේරු කරනු ලැබූ දිනය වන විට පහතින් සඳහන් මෝටර් රථ අලුත්වැඩියා කරමින් පැවති බැවින් තක්සේරු දෙපාර්තුමේන්තුව විසින් එම මෝටර් රථ තක්සේරු කර නොමැත. එම නිසා එම මෝටර් රථ 2020.12.31 දිනට පිරිවැයෙන් සමුචිත ක්ෂය අඩුකල වටිනාකමට ගෙන ඇත.

මෝටර් රථ අංකය	කාණ්ඩය	පිරිවැය (රු.)	සමුචිත ක්ෂය (රු.)	2020.12.31 දිනට ශුද්ධ වටිනාකම (රු.)
ශ්‍රී 6018	අත් ට්‍රැක්ටර්	41,500.00	41,499.00	1/=
NW SC 1607	අත් ට්‍රැක්ටර්	104,000.00	103,999.00	1/=
36 ශ්‍රී 5418	ට්‍රැක්ටර්	1,661,995.70	1,304,777.00	357,218.70
36 ශ්‍රී 3033	ට්‍රැක්ටර්	467,739.46	467,737.46	2/=
NW RV 0245	ට්‍රැක්ටර් ට්‍රේලරය	152,375.00	152,374.00	1/=
NW UZ 3922	මොටර් සයිකල්	148,925.00	148,924.00	1/=
NW UZ 3655	මොටර් සයිකල්	148,925.00	148,924.00	1/=

(ආ) කල්බදු වත්කම්

මූල්‍ය කල්බදු යටතේ ලබාගත් දේපළ, පිරියත හා උපකරණ(බදු ගත් භාණ්ඩය හිමිකර ගැනීමෙන් සමාගමට අවධානමක් හෝ වාසියක් සෘජුවම ලැබෙන්නේ නම්) ඒවායේ සාධාරණ වටිනාකම හා අවම කල්බදු ගෙවීම් වල කල්බද්ද ආරම්භයේ තීරණය කරන ලද වර්තමාන වටිනාකමට සමාන අගයන්ගෙන් අඩු අගය මත ප්‍රාග්ධනීතකරණය කර සමාගම විසින් එම වත්කම් භාවිතා කිරීමට අපේක්ෂා කරන කාලපරිච්ඡේදය පුරා ක්‍රමක්ෂය කර දක්වයි.

බදුකරුට ගෙවීමට ඇති ප්‍රාග්ධන වටිනාකමට සමාන ප්‍රමාණය වගකීම් ලෙස පෙන්වා ඇත. එක් එක් මූල්‍ය වර්ෂයේදී ගෙවන බදු වාරිකය තුළ අන්තර්ගත පොළී ප්‍රමාණය එක් එක් වර්ෂයේ වියදමක් ලෙස විස්තීරණ ආදායම් ප්‍රකාශනය තුළ දක්වයි. මෙයින් එකම අනුපාතයක් යටතේ සෑම වර්ෂයක් අවසානයේම පවතින බදු වගකීම් ශේෂයට පොළී ගණනය වීම සිදුවේ.

බදු දේපළ වැඩි දියුණු කිරීම සඳහා කරනු ලබන වියදම් ප්‍රාග්ධනීකරණය කර ඉතිරි බදු කාලය හෝ ඇස්තමේන්තු කරන ලද ඵලදායී ජීවිත කාලය හෝ යන දෙකෙන් අඩු කාල පරිච්ඡේදය තුළ ක්ෂය කරනු ලබයි.

3.1.1.2 පසුකාලීන පිරිවැය

දේපළ , පිරියත හෝ උපකරණයක කොටස් ප්‍රතිස්ථාපනය කිරීමේදී දරණ පිරිවැය එම කොටස පවත්වාගෙන යන ප්‍රමාණය, එම කොටසෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා එනු ඇති බව සහ එය විශ්වාසනීය ලෙස මැනීමට හැකි නම් එය වත්කමක් ලෙස හඳුනා ගනු ලබයි. මෙලෙස ප්‍රතිෂ්ඨාපනය කරන ලද කොටස් වල ධාරණ අගය පහත දක්වා ඇති ප්‍රති හදුනාගැනීම් ප්‍රතිපත්තීන්ට අනුව ප්‍රති හදුනාගැනීම් සිදුකරනු ලබයි. දේපළ , පිරියත සහ උපකරණ වලට දෛනිකව කරන නඩත්තු පිරිවැය වර්ෂයේ ලාභ හෝ පාඩු ලෙස හඳුනා ගැනේ.

3.1.1.3 හඳුනා ගැනීම් ඉවත් කිරීම

දේපළ , පිරියත හා උපකරණ බැහැර කිරීමේ දී හෝ භාවිතයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ නැතැයි හැගෙන අවස්ථාවලදී එය වත්කමක් ලෙස හඳුනා නොගනී. ඒ තුළින් ලැබෙන ලැබීම් හා පාඩු , ලාභ හෝ පාඩු වශයෙන් සළකන අතර ප්‍රතිලාභ අයහාරය ලෙස වර්ගීකරණය නොකරයි.

3.1.1.4 ක්ෂයවීම සහ ක්‍රමක්ෂය

(අ) ක්ෂයවීම්

ක්ෂය විස්තීරණ අදායම් ප්‍රකාශය තුළ හඳුනා ගන්නා අතර දේපළ, පිරියත හා උපකරණ සරල මාර්ග ක්‍රමය මත පදනම්ව ඒ එක් එක් දේපළ, පිරියත හා උපකරණවල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා ක්ෂය ගණනය කරනු ලැබේ. වර්තමානයේ ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය සංසන්දනාත්මකව පහත පරිදි වේ.

	වසර ගණන	අනුපාතිකය (%)
ගොඩනැගිලි	40	2.50
පිරියත හා යන්ත්‍ර සූත්‍ර	15	6.67
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	10	10.00
මෝටර් රථ	05	20.00
උපකරණ	08	12.50
ස්ථිර ඉඩම් සංවර්ධනය	30	3.33
වැටවල්	03	33.33
ජල සැපයුම	20	5.00

වත්කම් ක්ෂයවීම එය භාවිතය සඳහා ගත් අවස්ථාවේ ආරම්භ වී එය අලෙවිය සඳහා තබා ඇති බවට හෝ වත්කමක් ලෙස හදුනා නොගන්නා බවට වර්ගීකරණය කර ඇති දිනයේ දී අවසන් වේ. ක්ෂය ක්‍රමය ඵලදායී ජීවිත කාලය හා ශේෂ වටිනාකම් වාර්තා කරන දිනයේ දී අවශ්‍ය වන්නේ නම් නැවත තක්සේරු කරනු ලබයි.

(ආ) ක්‍රමක්ෂය

කල්බදු කාලය අවසන් වීමත් සමගම නිශ්චිතවම වත්කමේ හිමිකරු වන බව දැක්වූ විට හැරෙන්නට කල්බදු යටතේ ඇති වත්කම් කල්බදු කාලය හෝ ඵලදායී ආයු කාලය යන දෙකෙන් කෙටි කාලය තුළ ක්‍රමක්ෂය කරනු ලබයි. ජනවසමෙන් බදු ගත් වත්කම්වල බදු කාලය 2045 න් අවසන් වනු ඇත.

ජනවසම වෙතින් අත්කර ගත් කල්බදු වත්කම්වල බදු අයිතිය ඉතිරි බදු කාලය සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය යන දෙකෙන් අඩු කාලය තුළ සමාන කොටස් වලින් ක්‍රමක්ෂය කරනු ලබන අතර වර්තමාන ඇස්තමේන්තු කල ඵලදායී ජීවිත කාලය සංසන්දනාත්මකව පහත දැක්වෙන පරිදි වේ.

	වසර ගණන	අනුපාතිකය %
හිස් ඉඩම් සඳහා කල් බදු අයිතිය	53	1.89
ඉඩම් වැඩි දියුණු කිරීම	30	3.33
වෙනත් පවරා ඇති වත්කම්	30	3.33
ගොඩනැගිලි	25	4.00
යන්ත්‍ර සූත්‍ර	15	6.67
ජල සැපයුම	20	5.00

3.1.2 ජීව විද්‍යාත්මක වත්කම්

3.1.2.1 නොමේරූ හා මේරූ වගාවන්

(අ) නිශ්චල කල්බදු හිමිකම ඇති පෙව වත්කම් (නොමේරූ හා මේරූ වගා)

වැවිලි වතු පෞද්ගලීකරණය කරන අවස්ථාවේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ UITF රීති නියමයන්ට අනුව ජනවසම වතුයායවල මූල්‍ය කල්බදු යටතේ නිශ්චල කල්බදු හිමිකම ඇති පෙව වත්කම් (නොමේරූ හා මේරූ වගාවන්) 1992 ජුනි 11 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සමාගමේ හිණුම්වලට ගෙන ඇත.

කල්බදු හිමිකම ඇති පෙව වත්කම් සරල මාර්ග පදනම යටතේ විස්තීරණ මූල්‍ය ප්‍රකාශනය තුළ වර්තමාන සහ ඇස්තමේන්තු කල ඵලදායී ජීවිත කාලය පුරා සංසන්දනාත්මකව පහත සඳහන් ආකාරයට ක්‍රමක්ෂය කර ඇත.

	වසර ගණන	අනුපාතිකය (%)
මේරූ වගාව	30	3.33

(ආ) කල්බදු දේපළ සංවර්ධනය කිරීම (නොමේරූ හා මේරූ වගා)

වගා කරන කාලය තුළ වීනම්, භූමිය සකස් කිරීම, පුනරුත්ථාපනය, අලුත් වගා කිරීම, නැවත වගා කිරීම, අන්තර් වගා කිරීම් සහ නව වගා සඳහා පොහොර යෙදීම ආදියේ සිට අස්වැන්න නෙළීම දක්වා (වගා කර ඇති ප්‍රදේශ වසර 8 කට පසු මේරූ තත්ත්වයට පත් වන තුරු) වූ පිරිවැය නොමේරූ වගා යටතට ගැනේ. මෙම නොමේරූ වගා සෘජු පිරිවැය සහ අන්තර්ග්‍රහනය කරන ලද පොදු කාර්යය පිරිවැය වලින් සමන්විත වේ. පවත්වාගෙන යන ජීව විද්‍යාත්මක වත්කම් (උදා: පොල්) වෙනුවෙන් දරණ ලද වියදම ඵලදරණ බවට පත් වන වර්ෂයේදී මේරූ වගාවන්ට මාරු කරනු ලබයි.

කල්බදු ඉඩම් සංවර්ධනය ක්ෂයවීම් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සරල මාර්ග පදනමට අනුකූලව බදු කාලය අවසන් වීමට ඇති කාලය හෝ සංවර්ධනයේ ඵලදායී ආයු කාල සීමාව හෝ, දෙකෙන් අඩු එක ලෙස හඳුනා ගනු ඇත.

වර්ෂය තුළ මේරූ වගා බවට පත්වන වගාවන් වීවා නොමේරූ වගා ලෙස පැවති කාලය තුළ වී වෙනුවෙන් දරණ ලද වියදම් වර්ෂය අවසානයේදී මේරූ වගා වෙත මාරු කර එහි ඵලදායී ජීවන කාලය පුරා පහත පරිදි ක්ෂය කරනු ලබයි.

නොමේරූ වගා කාලය වර්තමාන හා විස්තීර්ණ ඇස්තමේන්තුගත ඵලදායී ආයු කාලය පහත පරිදි වේ.
(ඵලදායී ආයු කාලය නොමේරූ කාලයෙන් පසුව ගණනය කරනු ලබයි)

	නොමේරූ කාලය වසර ගණන	ආයු කාලය වසර ගණන	ක්ෂයවීම අනුපාතය(%)
පොල්	08	50	2%
කජු	08	25	4%
ඩ්‍රෑගන් ෆෘට්	03	20	5%
කුරුඳු	04	20	5%
ගම්මිරිස්	06	20	5%
රඹුටන්	06	20	5%
අඹ	05	20	5%

(ඇ) පාරිභෝජ්‍ය පෙව වත්කම්

පාරිභෝජ්‍ය පෙව වත්කම් යටතේ ගැනෙන දැව ගස් මූලික ප්‍රභව හඳුනා ගැනීමේදී මිනුම් කරන අතර එක් එක් වාර්තා කරන කාල සීමාව අවසානයේ ශ්‍රී ලංකා හිණුම්කරණ ප්‍රමිත 41 අනුව විකිණීමේ පිරිවැය අඩු කොට සාධාරණ අගයට ගණනය කරයි. දැව ගස් වල සාධාරණ වටිනාකම වර්තමාන දැව වල ගණන් හා වීම දැව ගස් පරිනත තත්ත්වයට පත් වූ විට වීම දැව ගස් වලින් අපේක්ෂා කරන දැව පරිමාව සැලකිල්ලට ගනිමින් වට්ටම් කළ මුදල් ප්‍රවාහ ක්‍රමය (DFC) යොදා ගෙන ගණනය කරනු ලබයි.

නොමේරූ ගස් වල පිරිවැය සාධාරණ අගයට ආසන්න අගයක් ලෙස සලකා කටයුතු කරනු ලබයි. මෙම ගණනය කිරීම සුදුසුකම්ලත් ස්වාධීන තක්සේරුකරුවෙකු විසින් කරනු ලබයි.

පාරිභෝජ්‍ය පෙව වත්කම් මූලික/ප්‍රථම හදුනාගැනිමේදී හදුනාගනු ලබන ලාභ හෝ අලාභ සහ ඉන් පසුව එම වත්කම් වල සාධාරණ අගය වෙනස් වීම හේතු කොට ගෙන ඇතිවන්නා වූ කාලච්ඡේදයට අදාල විස්තීරණ ආදායම් ප්‍රකාශ තුළ හදුනා ගනු ලබයි.

මේ හා සම්බන්ධ අනෙකුත් සියලුම උපකල්පන ගිණුම් සටහන් අංක 7.2 හි දක්වා ඇත.

වට්ටම් කළ මුදල් ප්‍රවාහ ක්‍රමය/ ආකෘතිය (DFC) තුළ අවධානය යොමු කොට ඇති ප්‍රධාන විචල්‍යයන්.

විචල්‍ය	**විස්තරය**
මුදල් ඒකකය	ශ්‍රී ලංකා රුපියල්
දැව පරිමාව	උස හා වට ප්‍රමාණය භෞතිකව තහවුරු කර ගැනිමෙන් හා විවිධ භූගෝලීය ප්‍රදේශයන් තුළ එක් එක් දැව වර්ගයෙහි වර්ධනය සැලකිල්ලට ගනිමින් ඇස්තමේන්තු සිදු කරයි. මෙහිදි දැව හෙළීමට අදාළ බලපවත්වනු ලබන සියලුම ව්‍යවස්ථාපිත විධි විධාන සැලකිල්ලට ගනු ලබයි.
ආර්ථික ඵලදායී කාලය	සමාගමේ වන වගා සැලසුම අනුව එක් එක් දැව විශේෂයන් හි සමාන්‍ය ආයු කාලය තීරණය කරනු ලබයි.
විකුණුම් මිල	ශ්‍රී ලංකාවේ පවතින වෙළඳපොළ මිල අනුව ඇස්තමේන්තු සිදු කෙරේ. මෙහිදි දැව ගස් විකුණුම් තත්ත්වයට පත්කිරීම සඳහා සම්පූර්ණ කළ යුතු සියලුම අවශ්‍යතා පිළිබඳව සලකා බලයි.
වට්ටම් අනුපාතය	අනාගත මුදල් ප්‍රවාහයන් පහත දැක්වෙන වට්ටම් අනුපාතයන් අනුව වට්ටම් ගත කෙරේ. - අස්වැන්න නෙලන වයස අවුරුදු 5 හෝ 5 ට අඩු 10% - අස්වැන්න නෙලන වයස අවුරුදු 6 ත් 15 ත් අතර නම් 11% - අස්වැන්න නෙලන වයස අවුරුදු 15 වැඩිනම් 12%

3.1.2.2 ගව පශු සම්පත

ගව පශු සම්පත් මනිනු ලබන්නේ ඒවායේ සාධාරණ අගයෙන් විකුණුම් පිරිවැය අඩු කිරීමෙනි. ජාතික පශු සම්පත් මණ්ඩලය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයට අනුව පශු සම්පත් සාධාරණ අගය තීරණය කරනු ලැබේ.

3.1.3 විකිණීමට ඇති ජංගම නොවන වත්කම්

අඛණ්ඩ භාවිතයට වඩා මූලිකව විකිණීම තුළින් අයකර ගැනීමට බලාපොරොත්තු වන ජංගම නොවන වත්කම් විකිණීම සඳහා වෙන්කර ඇති දෑ ලෙස වර්ගීකරණය කෙරේ. විකිණීමට තබා ඇති වත්කම් ඒසේ කිරීමට ආසන්නතම අවස්ථාවේ ඒවායේ ධාරණ අගය හෝ සාධාරණ වටිනාකමින් විකුණුම් වියදම් අඩු කර ලැබෙන අගය යන දෙකෙන් අඩු අගයසේ සැලකේ. පවතින තත්ත්වයෙන්ම විකිණීමේ ඉහළ සම්භාවිතාවක් ඇති ජංගම නොවන වත්කම් විකිණීමට ඇති දෑ ලෙස වර්ගීකරණය කරනු ඇත.
"විකිණීමට වෙන්කර ඇති දෑ" ලෙස වර්ගීකරණය කළ දේපළ, පිරියත හෝ උපකරණ ක්ෂය කිරීමට හෝ ක්‍රමක්ෂය කිරීමකට භාජනය නොවේ.

3.1.4 තොගය

තොග පිරිවැය හා ඇස්තමේන්තු ගත ශුද්ධ උපලබ්ධි වටිනාකම මත යල්පැනුම් හා මන්දගාමීව අලෙවි වන ද්‍රව්‍ය සඳහා අවශ්‍ය වෙන් කිරීම් සිදු කිරීමෙන් පසුව අගයන්ගෙන් අඩු අගය මත ගණනය කර දක්වා ඇත. ශුද්ධ උපලබ්ධි අගය යනු උපලබ්ධි පිරිවැය ප්‍රතිපාදන සලසා හා/හෝ දැනට පවත්නා තත්ත්වයෙන් විකිණිය හැකි තත්ත්වයට පරිවර්තන සිදු කර සමාන්‍ය ව්‍යාපාරික ක්‍රමවේදය අනුව තොග විකිණිය හැකි මිල ගණන්ය.

තොගය වර්තමාන ස්ථානයට සහ තත්ත්වයට රැගෙන ඒම සඳහා දැරූ පිරිවැය පහත දැක්වෙන සූත්‍රය භාවිතා කර ගණනය කරනු ලැබේ.

පාරිභෝජන සහ අමතර ද්‍රව්‍ය යෙදවුම්	පෙර ලැබීම් පෙර නිකුත් පදනම මත සත්‍ය පිරිවැය
පැළ තවාන් සහ බෝග වැවීම	සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය පිරිවැය හා සෘජුව ආරෝපණය කළ හැකි පොදු කාර්යය පිළිබඳ යෝග්‍ය සමානුපාතික පිරිවැය.
නෙලාගත් අස්වැන්න	ජීව විද්‍යාත්මක වත්කම් වලින් නෙළා ගත් කෘෂි නිෂ්පාදන ඒවායේ සාධාරණ වටිනාකමින් විකුණුම් වියදම් අඩු කර නෙළාගත් අවස්ථාවේ අගය කරයි. අර්ධ නිමි සහ නිමි කෘෂිකාර්මික තොග අගය කිරීමේදී කෘෂි නිෂ්පාදනවල සාධාරණ වටිනාකමට පරිවර්තනය කිරීමේ පිරිවැය එකතු කර අගය කරයි.
පශු සම්පත්	කිරි පශු සම්පත් තොග මනිනු ලබන්නේ සාධාරණ වටිනාකමින් විකුණුම් වියදම් අඩු කිරීමෙනි. කිරි පශු සම්පතේ සාධාරණ වටිනාකම ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය නිකුත් කරනු ලබන චක්‍රලේඛ අනුව තීරණය කරනු ලැබේ.

3.1.4.1 ධාරක ජීව විද්‍යාත්මක වත්කම් වල වැඩෙන නෙළාගත හැකි අස්වනු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක (LKAS) 41 ට අනුව සමාගම ධාරක ජීව විද්‍යාත්මක වත්කම් වල වැඩෙන කෘෂි නිශ්පාදන සාධාරණ අගයට විකුනුම් පිරිවැය අඩුකර හඳුනා ගනී. සෑම ගිණුම්කරණ කාලපරිච්ඡේද අවසානයේදී එම කෘෂි නිශ්පාදනයේ සාධාරණ අගයෙහි වෙනස් වීම් ලාභ/අලාභ තුළ හඳුනා ගනී.

මෙම අරමුණින් එක් එක් බෝග කාණ්ඩයට අදාළ නෙළීමට ඇති කෘෂි නිශ්පාදන අස්වනු ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා අවසන් වරට අස්වනු නෙලූ දිනයේ සිට එක් අස්වනු චක්‍රයක් පමණක් සැලකිල්ලට ගනු ලබයි. තවද එම අස්වනු චක්‍රයෙන් ලැබෙන අස්වැන්නෙන් 50% පමණක් අගය කිරීම සඳහා සලකා බලනු ලබයි. සමාගම විසින් නෙළීමට ඇති කෘෂි නිශ්පාදන අගය කිරීම සඳහා පහත සඳහන් මිල සම්කරණය භාවිතා කරනු ලබයි.

පොල්

සාධාරණ වටිනාකම - (අස්වනු නෙළීම් පිරිවැය, ප්‍රවාහනය වැනි දෑ)

3.1.5 මූල්‍ය උපකරණ

3.1.5.1 හඳුනා ගැනීම සහ මූලික මිනුම්

වෙළඳ ලැබිය යුතු දේ මුලින්ම හඳුනාගනු ලබන්නේ ඒවායෙහි ආරම්භයේදීය. අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් මුලින්ම හඳුනාගනු ලබන්නේ සමාගම එම උපකරණයෙහි ගිවිසුම්ගත විධි විධාන වල පාර්ශවකරුවෙකු වන විටදීය.

මූල්‍ය වත්කමක් (එය සැළකිය යුතු මූල්‍ය දායකත්වයන් නොමැති වෙළඳ ලැබිය යුතු දෙයක් නොවන විට) හෝ මූල්‍ය වගකීමක් මුලින්ම මනිනු ලබන්නේ සාධාරණ අගය සමඟ වන අතර, FVTPL නොවන අයිතමයක් සඳහා එය අත්පත් කර ගැනීමට හෝ නිකුත් කිරීමට සෘජුවම ආරෝපනය වන ගණුදෙනු පිරිවැයෙන් වේ. සැළකිය යුතු මූල්‍ය දායකත්වයක් උපාංගයක් නොමැති වෙළඳ ලැබිය යුතු දෑ ආරම්භයේදී මනිනු ලබන්නේ ගණුදෙනුවෙහි මිළටය.

3.1.5.2 වර්ගීකරණය සහ පසුකාලීන මැනීම

3.1.5.2.1 මූල්‍ය වත්කම්

i) ප්‍රතිපත්තිය 2018 ජනවාරි 1 දින සිට අදාල වේ.

මූල්‍ය වත්කමක ආරම්භක හඳුනා ගැනීම සිදු කරනුයේ, ක්‍රමක්ෂය පිරිවැය; FVOCI - ණය ආයෝජනය; FVOCI - ස්කන්ධ ආයෝජනයත හෝ FVTPL අනුව මැන වර්ගීකරණය කිරීමෙනි.

මූල්‍ය වත්කම් ඒවායෙහි හඳුනාගැනීමට පසුව ප්‍රතිවර්ගීකරණය නොකරන විටදී සමාගම මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීම සඳහා ඔවුන්ගේ ව්‍යාපාරික ආකෘතිය වෙනස් නොකරන්නේ නම්, එම අවස්ථාවේදී බලපෑමට ලක්වූ සියලුම මූල්‍ය වත්කම් ව්‍යාපාර ආකෘතියේ වෙනස්වීමෙන් පසු වළඹෙන ප්‍රථම වාර්තාකරණ කාල පරිච්ඡේදයේ පළමුවන දිනයේ ප්‍රතිවර්ගීකරණය කරනු ලැබේ.

මූල්‍ය වත්කමක් පහත සඳහන් කොන්දේසි දෙකම සපුරාලන්නේ නම් සහ එය FVTPLහි නම්කර නොමැති නම් ක්‍රමක්ෂය පිරිවැයෙන් මනිනු ලැබේ;

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා වත්කම් තබාගැනීම අරමුණු කරගත් ව්‍යාපාර ආකෘතියක් තුළ එය පවත්වනු ලැබේ, සහ

- එහි ගිවිසුම්ගත කොන්දේසි මඟින් නිශ්චිත දිනයන්හි මුදල් ප්‍රවාහයන්ට හුදෙක්ම බලපානු ලබන්නේ ගෙවිය යුතු මුල් මුදල සහ මුල් මුදල සඳහා වන පොළී මුදල් වේ.

පහත සඳහන් කොන්දේසි දෙකම සපුරාලන්නේ නම් සහ එය FVTPL හි නම්කර නොමැති නම්, ණය ආයෝජනයක් FVOCI යටතේ මනිනු ලැබේ.

- එය පවත්වනු ලබන්නේ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සහ මූල්‍ය වත්කම් විකිණීම යන දෙකෙන් අරමුණු සාක්ෂාත් කරගනු ලබන ව්‍යාපාරික ආකෘතියක් තුළ, සහ

- එහි ගිවිසුම්ගත නියමයන් මඟින් නිශ්චිත දිනයන්හි මුදල් ප්‍රවාහයන් සඳහා හුදෙක්ම බලපානු ලබන්නේ ගෙවිය යුතු මුල් මුදල සහ මුල් මුදල සඳහා වන පොළී මුදල් වේ.

වෙළඳාම සඳහා රඳවාගෙන නොමැති ස්කන්ධ ආයෝජනයක් ආරම්භක හඳුනා ගැනීම මත, OCI හි ආයෝජනයේ සාධාරණ අගයෙහි පසු කාලීන වෙනස්කම් ඉදිරිපත් කිරීමට සමාගම විසින් වෙනස් කළ නොහැකි ලෙස තෝරාගත හැකිය. මෙම තෝරා ගැනීම සිදුකරනු ලබන්නේ ආයෝජන - අනුව - ආයෝජන පදනම මතය.

ඉහත විස්තර කර ඇති පරිදි ක්‍රමක්ෂය පිරිවැයෙන් හෝ FVOCI අනුව මනිනු ලැබ වර්ගීකරණය නොකරන ලද සියලුම මූල්‍ය වත්කම් FVTPL අනුව මනිනු ලැබේ. සියලුම ව්‍යුත්පන්න මූල්‍ය වත්කම් මෙයට ඇතුළත් වේ. ආරම්භක හඳුනා ගැනීම මත, සමූහය විසින් අවලංගු කළ නොහැකි ලෙස මූල්‍ය වත්කම් නම් කරනු ලැබිය හැකිය. එසේ නොමැති නම්, ක්‍රමක්ෂය පිරිවැයෙන් හෝ FVOCI අනුව හෝ FVTPL අනුව මැනිය යුතු අවශ්‍යතා සපුරාලන විටදී, සමාගම විසින් එසේ කිරීමෙන් පැන නැඟිය හැකි ගිණුම්කරණ නොගැලපීම් ඉවත් කිරීම හෝ සැළකිය යුතු ලෙස අඩු කිරීම සිදු කරයි.

අ) ව්‍යාපාර ආකෘති ඇගයීම:

මූල්‍ය වත්කම් කළඹ මට්ටමක් ලෙස පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර ආකෘතියේ අරමුණු ඇගයීම සමාගම විසින් සිදු කරනු ලබන්නේ මෙමඟින් ව්‍යාපාරය කළමනාකරණය කරන ආකාරය සහ කළමනාකරණයට තොරතුරු සපයන ආකාරය මනාව පිළිබිඹු කරන බැවිනි. සළකා බැලූ තොරතුරුවලට ඇතුළත් වන්නේ,

- කළඹ සඳහා ප්‍රකාශිත ප්‍රතිපත්ති හා අරමුණු සහ එම ප්‍රතිපත්ති ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම. මෙයට ගිවිසුම්ගත පොළී ආදායම් උපයා ගැනීම සඳහා කළමනාකාරිත්වයේ උපාය මාර්ග යොමුවී තිබීම, විශේෂිත පොළී අනුපාත පැහැකඩක් පවත්වා ගැනීම, මූල්‍ය වත්කම්වල කාල සීමාව අදාළ වගකීම්වල කාලයට ගැලපීම හෝ අපේක්ෂිත මුදල් පිටතට ගලායෑම හෝ වත්කම් විකිණීමෙන් මුදල් ප්‍රවාහයන් සාක්ෂාත් කර ගැනීම යන කරුණු ඇතුළත් වේ.

- කළඹෙහි ක්‍රියාකාරිත්වය ඇගයීමට ලක්කර සමාගමේ කළමනාකාරිත්වයට වාර්තා කරන්නේ කෙසේද?

- ව්‍යාපාර ආකෘතියේ කාර්ය සාධනයට බලපාන අවදානම් (සහ ව්‍යාපාර ආකෘතිය තුළ ඇති මූල්‍ය වත්කම්) සහ එම අවදානම් කළමනාකරණය කරන්නේ කෙසේද?

- පූර්ව කාල පරිච්ඡේදයන්හි මූල්‍ය වත්කම් විකිණීමේ වාර ගණන, පරිමාව සහ වේලාවල එවැනි විකුණුම් සඳහා හේතුව සහ අනාගත විකුණුම් ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාව.

සමූහයේ වත්කම් අඛණ්ඩව හඳුනාගැනීමට අනුකූලව ප්‍රතිහඳුනාගැනීම සඳහා සුදුසුකම් නොලබන ගණුදෙනුවල මූල්‍ය වත්කම් තෙවන පාර්ශවයකට පැවරීම මෙම අරමුණු සඳහා විකුණුම් ලෙස නොසැළකේ.

වෙළඳාම සඳහා තබා ඇති හෝ කළමනාකරණය කරනු ලබන සහ සාධාරණ අගයක් මත කාර්ය සාධනය ඇගයීමට ලක් කරන මූල්‍ය වත්කම් FVTPL මනිනු ලැබේ.

ආ) පසු කාලීන මිනුම් සහ ලාභ සහ අලාභ

FVTPL හි මූල්‍ය වත්කම්	මෙම වත්කම් පසුකාලීනව සාධාරණ අගයකින් මනිනු ලැබේ. ඕනෑම පොළියක් හෝ ලාභාංශ ආදායමක් ඇතුළුව ශුද්ධ ප්‍රතිලාභ සහ අලාභ, ලාභය හෝ අලාභය ලෙස හඳුනා ගැනේ.
ක්‍රමක්ෂය පිරිවැයට වූ මූල්‍ය වත්කම්	මෙම වත්කම් පසුකාලීනව සඵල පොළී ක්‍රමය භාවිතා කර ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ලැබේ. හානිකරණ අලාභ හේතුවෙන් ක්‍රමක්ෂය පිරිවැය අඩුවේ. පොළී ආදායම සහ හානිකරණය, ලාභය හෝ අලාභය ලෙස හඳුනාගෙන ඇත. ප්‍රතිහඳුනාගැනීමෙන් ලැබෙන ඕනෑම ලාභයක් හෝ අලාභයක්, ලාභය හෝ අලාභය ලෙස හඳුනා ගැනේ.
FVOCI හි ණය ආයෝජන	මෙම වත්කම් පසුකාලීනව සාධාරණ අගයකින් මනිනු ලැබේ. සඵල පොළී ක්‍රමය භාවිතා කර ගණනය කරනු ලබන පොළී ආදායම සහ හානිකරණය, ලාභය හෝ අලාභය ලෙස හඳුනාගැනේ. අනෙකුත් ශුද්ධ ප්‍රතිලාභ සහ අලාභ, OCIහි හඳුනාගෙන ඇත. ප්‍රති හඳුනාගැනීමේදී OCIහි එකතුවී ඇති ප්‍රතිලාභ සහ අලාභ, ලාභය හෝ අලාභය ලෙස ප්‍රති වර්ගීකරණය කෙරේ.
FVOCI හි ස්කන්ධ ආයෝජන	මෙම වත්කම් පසුකාලීනව සාධාරණ අගයකින් මනිනු ලැබේ. ලාභාංශ පැහැදිලිවම ආයෝජන පිරිවැයෙන් කොටසක් අයකර ගැනීමක් නියෝජනය නොකරන්නේ නම් ලාභාංශ, ලාභයේ හෝ අලාභයේ ආදායමක් ලෙස හඳුනා ගැනේ. අනෙකුත් ශුද්ධ ප්‍රතිලාභ සහ අලාභ OCI හි හඳුනාගෙන ඇති අතර, ඒවා කිසි විටකත් ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය නොකෙරේ.

3.1.5.2.2 මූල්‍ය වගකීම්

i) වර්ගීකරණය, පසුකාලීන මිනුම් සහ ප්‍රතිලාභ හා අලාභ

මූල්‍ය වගකීම් **FVTPL** හි ක්‍රමක්ෂය පිරිවැය අනුව මනිනු ලැබේ. මූල්‍ය වගකීමක් **FVTPL** හි වර්ගීකරණය කර තිබෙන විට එය වෙළඳාම සඳහා රඳවාගෙන ඇති ලෙසට වර්ගීකරණය කර ඇත්නම්, එය ව්‍යුත්පන්නයක් හෝ මූලික හඳුනා ගැනීම මත එය නම්කර ඇත. **FVTPL** හි මූල්‍ය වගකීම් කිසියම් පොළී වියදම් ඇතුළුව ශුද්ධ ප්‍රතිලාභ සහ අලාභ සාධාරණ අගයකින් මනිනු ලබන අතර, ලාභය හෝ අලාභය ලෙසට හඳුනා ගෙන ඇත. වෙනත් මූල්‍ය වගකීම් පසුකාලීනව සඵල පොළී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ලැබේ. පොළී වියදම් සහ විදේශ විනිමය ප්‍රතිලාභ සහ අලාභ, ලාභය හෝ අලාභය ලෙස හඳුනා ගැනේ. ප්‍රති හඳුනාගැනීමෙන් ලැබෙන ඕනෑම ලාභයක් හෝ අලාභයක්, ලාභය හෝ අලාභය තුළද හඳුනා ගැනේ.

3.1.5.3 ප්‍රතිහඳුනාගැනීම

3.1.5.3.1 මූල්‍ය වත්කම්

මූල්‍ය වත්කම් වලින් ලැබෙන මූල්‍ය ප්‍රවාහයන් සඳහා වන ගිවිසුම්ගත අයිතිවාසිකම් කල් ඉකුත්වූ විට හෝ මූල්‍ය වත්කම් වල හිමිකාරිත්වයෙහි සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැළකිය යුතු ලෙස මාරු කරනු ලබන ගණුදෙනුවකදී ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් ලැබීමේ අයිතිය මාරු කරන විට හෝ සමාගම විසින් එහි හිමිකාරිත්වයෙහි සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැළකිය යුතු ලෙස මාරු කිරීම හෝ රඳවා ගැනීම සිදු නොකරන අතර, මූල්‍ය වත්කම් පාලනය කිරීම ද රඳවා නොගන්නා විට සමාගම විසින් මූල්‍ය වත්කම් ඉවත් කිරීම සිදු කරනු ලැබේ.

සමාගම සිය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි වත්කම් ලෙසට හඳුනා ගෙන මාරු කරන ලද ගණුදෙනුවලට ඇතුළත් කරන නමුත් මාරු කරන ලද වත්කම් වල සියලු අවදානම් සහ ප්‍රතිලාභ සියල්ලම රඳවා ගනී. මෙම අවස්ථාවලදී වත්කම් මාරු කරනු ලැබේ. මෙම අවස්ථාවලදී, මාරු කරන ලද වත්කම් ඉවත් කිරීම සිදු කරනු නොලැබේ.

3.1.5.3.2 මූල්‍ය වගකීම්

ගිවිසුම්ගත බැඳීම් නිදහස් කරන විට හෝ අවලංගු කරන විට හෝ කල් ඉකුත්වූ විට සමාගම මූල්‍ය වගකීමක් ඉවත් කරනු ලබයි. මූල්‍ය වගකීමක නියමයන් වෙනස් කරන විට සහ වෙනස් කරන ලද වගකීම්වල මුදල් ප්‍රවාහයන් සැළකිය යුතු ලෙස වෙනස් වන විටද සමාගම මූල්‍ය වගකීමක් ඉවත් කරන අතර, එම අවස්ථාවේදී වෙනස් කරන ලද නියමයන් මත පදනම්වූ නව මූල්‍ය වගකීමක් සාධාරණ අගයකින් හඳුනාගනී.

මූල්‍ය වගකීමක් ඉවත් කිරීමේදි, නිරුද්ධවූ ධාරණ අගය සහ ගෙවූ ප්‍රතිශ්ධාව අතර වෙනස (මාරු කරන ලද උපකල්පිත යම් මුදල් නොවන වත්කම් හෝ වගකීම් ඇතුළුව) ලාභය හෝ අලාභය ලෙස හඳුනාගැනේ.

3.1.5.4 හිලව් කිරීම

සමාගමට දැනට මුදල් හිලව් කිරීමට නීත්‍යානුකූලව බලාත්මක අයිතියක් තිබීම සහ එය ශුද්ධ පදනමක් මත පියවා දැමීමට හෝ වත්කම සාක්ෂාත් කර ගැනීමට සහ වගකීම එකවර පියවීමට අදහස් කරන්නේ කවර දිනකදී ද, එදිනට මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් පියවා ඇති අතර, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ශුද්ධ මුදල ඉදිරිපත් කර ඇත.

3.1.5.5 හානිකරණය - මූල්‍ය වත්කම්

ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්

3.1.5.5.1 මූල්‍ය උපකරණ සහ ගිවිසුම් වත්කම්

වෙළඳ ලැබිය යුතු දේ සඳහා වන අලාභ දීමනා සැම විටම මනිනු ලබන්නේ ජීවිත කාලීන අපේක්ෂිත ණය අලාභයට (ECL) සමාන මුදලකටය.

මූලික හඳුනා ගැනීමෙන් පසු මූල්‍ය වත්කමක ණය අවදානම සැළකිය යුතු ලෙස වැඩිවී තිබේද යන්න තීරණය කිරීමේ දී සහ ECL තක්සේරු කිරීමේ දී සමාගම අනවශ්‍ය පිරිවැයක් හෝ උත්සාහයක් නොමැතිව අදාළ සහ ලබාගත හැකි සාධාරණ සහ සහාය තොරතුරු සළකා බලයි. සමාගමේ ඓතිහාසික අත්දැකීම් මත පදනම්ව සහ දැනුවත් ණය තක්සේරුව සහ ඉදිරි දැක්ම තොරතුරු ඇතුළුව ප්‍රමාණාත්මක හා ගුණාත්මක තොරතුරු සහ විශ්ලේෂණය මෙයට ඇතුළත් වේ.

නියමිත දිනට දින 365කට වඩා කල් ඉකුත්වී ඇත්නම් මූල්‍ය වත්කමක ණය අවදානම සැළකිය යුතු ලෙස වැඩිවී ඇති බවට සමාගම උපකල්පනය කරයි.

මූල්‍ය වත්කමක පැහැර හැරීමක් ඇති බවට සමාගම සළකනුයේ :

- ණයගැතියා හට සමාගමෙන් කිසිදු උපකාරයක් නොමැතිව සමාගම වෙත සිය ණය බැඳීම් සම්පූර්ණයෙන්ම ගෙවීමට අපහසු වනවිට, සමාගමට සුරකුම් උපලබ්ධි කිරීම වැනි ක්‍රියා රාශියක් ගැනීමට සිදුවේ. (කිසියම් දෙයක් රඳවාගෙන ඇත්නම්) හෝ

- මූල්‍ය වත්කම දින 180කට වඩා කල් ඉකුත්වීම.

ජීවිත කාලය පුරාවට ඇති ECL යනු මූල්‍ය උපකරණයක අපේක්ෂිත ආයු කාලය පුරාවටම සිදුවිය හැකි සියලු පැහැර හැරීමේ සිදුවීම්වල ප්‍රතිඵලයක් වන ECL ය.

මාස 12 ක ECL යනු ECL හි කොටසක් වන වාර්තා කළ දිනට පසුව වන මාස 12 ක් තුල සිදුවිය හැකි පැහැර හැරීම් සිදුවීම් වේ(හෝ උපකරණයේ අපේක්ෂිත ආයු කාළය මාස 12ට වඩා අඩුනම්, කෙටි කාලයක්).

ECL තක්සේරු කිරීමේදී සළකා බැලිය හැකි උපරිම කාල සීමාව වන්නේ සමාගම ණය අවදානමට අනාවරණය වන උපරිම ගිවිසුම් කාලයයි.

3.1.5.5.2 ECL මැනීම

ECL යනු ණය අලාභ පිළිබඳ - සම්භාවිතාවයෙහි බර තැබූ තක්සේරුවකි. ණය අලාභ මනිනු ලබන්නේ සියලුම මුදල් හිඟයන්හි වර්තමාන අගය ලෙසටය. (එනම්, ගිවිසුමට අනුකූලව අස්තිත්ත්වය විසින් ඇති කරන මුදල් ප්‍රවාහයන් සහ සමාගම ලැබීමට අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් අතර වෙනසයි).

ECL වට්ටම් කරනු ලබන්නේ මූල්‍ය වත්කම් වල සඵල පොළී අනුපාතයටය.

3.1.5.5.3 ණය - හානිවූ මුල්‍ය වත්කම්

සෑම වාර්තාකරණ දිනයකදීම, සමාගම විසින් මූල්‍ය වත්කම් ධාරණය කරනුයේ ක්‍රමක්ෂය පිරිවැය යටතේ ද සහ FVOCIහි ණය සුරකුම් පත් හානිවූ ණය අනුවද යන්න තක්සේරු කරනු ලැබේ. මූල්‍ය වත්කම්වල ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයට අහිතකර ලෙස බලපාන සිදුවීම් එකක් හෝ කීපයක් සිදුවූ විට මූල්‍ය වත්කමක් "හානිවූ ණය" ලෙස සැළකේ.

මූල්‍ය වත්කමක් හානිවූ ණයක් බවට පත්වී ඇති බවට පහත දැක්වෙන දත්ත නිරීක්ෂණය කිරීමෙන් හැකිවේ.

- ණය ගැනුම්කරුගේ හෝ නිකුත් කරන්නාගේ සැළකිය යුතු මූල්‍ය දුෂ්කරතා
- පැහැර හැරීම හෝ දින 180කට වඩා කල් ඉකුත්වීම වැනි ගිවිසුම් කඩ කිරීම.
- සමාගම වෙනත් ආකාරයකින් නොසළකන කොන්දේසි මත සමාගම විසින් ණයක් හෝ අත්තිකාරමක් ප්‍රතිව්‍යුහගත කිරීම.
- ණය ගැනුම්කරු බුන්වත් භාවයට පත්වීම හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට ඇතුළුවීමට ඉඩ ඇතිබව හෝ
- මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් ආරක්ෂාවීම සඳහා ක්‍රියාකාරී වෙළඳපළෙන් අතුරුදහන් වීම.

3.1.5.5.4 මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කිරීමේදී ECL සඳහා දීමනාවක් ඉදිරිපත් කිරීම

ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ලබන මූල්‍ය වත්කම් සඳහා වන අලාභ දීමනාව වත්කම් වල දළ ධාරණ අගයේ ප්‍රමාණයෙන් අඩුකරනු ලැබේ.

3.1.5.5.5 ලියාහැරීම්

මූල්‍ය වත්කමක් සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක් අයකර ගැනීමේ සාධාරණ අපේක්ෂාවක් සමාගමට නොමැති විට මූල්‍ය වත්කමක දළ ධාරණ අගය ලියා හරිනු ලැබේ. එක් එක් ගණුදෙනුකරුවෙකුගෙන්, සමාන වත්කම් අයකර ගැනීමේ ඓතිහාසික අත්දැකීම් මත පදනම්ව මූල්‍ය වත්කම් දින 180ක් ඉක්මවා කල් ඉකුත්වූ විට දළ ධාරණ අගය ලියා හැරීමේ ප්‍රතිපත්තියක් සමාගම සතුව ඇත. ආයතනික ගණුදෙනුකරුවන් සඳහා, අයකර ගැනීම පිළිබඳ සාධාරණ අපේක්ෂාවක් තිබේද යන්න මත පදනම්ව, ලියාහැරීමේ කාලය හා මුදල සම්බන්ධයෙන් සමාගම විසින් තනි තනිව තක්සේරුවක් සිදුකරයි. ලියා හරින ලද මුදලින් සැළකිය යුතු අයකිරීමක් සමාගම අපේක්ෂා නොකරයි. කෙසේ වෙතත්, ගෙවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා සමාගමේ ක්‍රියා පටිපාටි වලට අනුකූලවීම සඳහා ලියා හරින ලද මූල්‍ය වත්කම් තවදුරටත් බලාත්මක කිරීමේ ක්‍රියාකාරකම් වලට යටත් විය හැකිය.

3.2.1 මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු සහ ප්‍රතිපත්ති

සමාගමේ ප්‍රධාන මූල්‍ය වගකීම් සමන්විත වන්නේ වෙළඳාම සහ වෙනත් ගෙවිය යුතු දේ, සහ ගෙවිය යුතු ආදායම් බදු වලිනි. මෙම මූල්‍ය වගකීම්වල ප්‍රධාන අරමුණ වන්නේ සමාගමේ මෙහෙයුම් සඳහා මුදල් යෙදවීමයි. සමාගමට රාජ්‍ය ව්‍යවසායයන් සහ වෙළඳාම හා වෙනත් ලැබිය යුතු දේ සහ එහි මෙහෙයුම් වලින් සෘජුව ලැබෙන මුදල් සහ කෙටිකාලීන තැන්පතු සඳහා ණය ලබාදී ඇත. ඒ අනුව සමාගම එහි මූල්‍ය උපකරණ භාවිතා කරමින් ණය අවදානම, ද්‍රවශීලතා අවදානම, විනිමය අවදානම සහ පොළී අනුපාත අවදානමට නිරාවරණයවී ඇත. ඉහත සඳහන් එක් එක් අවදානම් වලට සමාගම නිරාවරණය වීම, සමාගමේ අරමුණ, අවදානම් මැනීම සහ කළමනාකරණය කිරීම සඳහා ප්‍රතිපත්ති සහ ක්‍රියාවලියක් පිළිබඳ තොරතුරු මෙම සටහන මඟින් ඉදිරිපත් කෙරේ.

3.2.1.1 ණය අවදානම

ණය අවදානම යනු ගණුදෙනුකරුවෙකු හෝ මූල්‍ය උපකරණයක පාර්ශවකරුවෙකු එහි ගිවිසුම්ගත බැඳීම් ඉටු කිරීමට අපොහොසත් වුවහොත් සමාගමට මූල්‍යමය අලාභයක් වීමේ අවදානමක් ඇතිවන අතර, ප්‍රධාන වශයෙන් ඒවා පැන නඟින්නේ සමාගමට ලැබිය යුතු ගණුදෙනුකරුවන්ගෙනි.

3.2.1.2 ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කමක් ලබාදීමෙන් පියවා ඇති මූල්‍ය වගකීම් හා බැඳීම් ඉටු කිරීමේදී සමාගමට දුෂ්කරතා ඇතිවීමේ අවදානමයි.

ද්‍රවශීලතාවය කළමනාකරණය කිරීම සඳහා සමාගමේ ප්‍රවේශය වන්නේ, පිළිගත නොහැකි අලාභයන් හෝ සමාගමේ කීර්තිනාමයට හානියක් නොවී, සාමාන්‍ය හා ආතති තත්ත්වයන් යටතේ නියමිත වේලාවට එහි වගකීම් සපුරාලීමට ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් ඇති බව සහතික කිරීමයි.

3.2.2 සේවක ප්‍රතිලාභ

(අ) නිර්වචිත දායක සැලසුම් - අර්ථ සාධක අරමුදල සහ භාරකාර අරමුදල

නිර්වචනය කරන ලද දායක සැලැස්ම යනු පශ්චාත් රැකියා සැලැස්මක් වන අතර, ඒ යටතේ අස්තිත්ත්වයක් විසින් වෙනත් අස්තිත්ත්වයකට ස්ථාවර දායක මුදල් ගෙවන අතර, ඊට වැඩි මුදලක් ගෙවීමට නීතිමය හෝ ව්‍යුහාත්මක බැඳීමක් නොමැත. සියලුම සේවකයින් ආවරණය වන අර්ථසාධක සහ භාරකාර අරමුදල් සඳහා වන දායකත්වය සේවකයින් විසින් සේවා සපයනු ලබන කාල පරිච්ඡේදයන්හිදී ලාභ සහ අලාභයෙහි වියදමක් ලෙස හඳුනාගෙන ඇත.

සමාගම එවැනි සේයකයින්ගේ වීකාබද්ධ වැටුපෙන් 12% ක් සේවක අර්ථ සාධක අරමුදලට (EPF) සහ එම සේවකයින්ගේ වීකාබද්ධ වැටුපෙන් 3% ක් සේවක භාරකාර අරමුදලට දායකවේ.

(ආ) නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම

නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිර්වචනය කරන ලද දායක සැලැස්මක් හැරුණු විට ඇති පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මකි. නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය තීරණය වන්නේ ආයු ගණන තක්සේරු කිරීම් භාවිතා කරමිනි. ආයු ගණන තක්සේරුවට වට්ටම් අනුපාත, අනාගත වැටුප් වැඩිවීම් සහ කාර්ය මණ්ඩල පිරිවැටුම පිළිබඳ උපකල්පන ඇතුළත්වේ. එම බැඳීම්වල ඇති දිගුකාලීන ස්වභාවය නිසා එවැනි ඇස්තමේන්තු සැළකිය යුතු අවිනිශ්චිතතාවයකට යටත්වේ. ඇස්තමේන්තුවල භාවිතාවන ප්‍රධාන උපකල්පන පිළිබඳ විස්තර සටහන 16 හි අඩංගුවේ.

ලංකා බැංකුවේ ඇති ස්ථාවර තැන්පත් මඟින් අරමුදල් වෙන් කර ඇත.

3.3 විලම්බිත ආදායම්

ප්‍රදාන සහ සහනාධාර

ප්‍රදානය ලැබෙන බවට සහ අමුණා ඇති සියලුම කොන්දේසි වලට අනුකූලවීම පිළිබඳව සාධාරණ සහතිකයක් ලැබීම අනුව රජයේ ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ. ප්‍රදානය වියදම් අයිතමයකට සම්බන්ධ වූ විට, එය ප්‍රදාන ලබාදීමට අදහස් කරන පිරිවැයට ක්‍රමානුකූල පදනමක් මත ගැලපීමට අවශ්‍ය කාලසීමාව තුළ ආදායමක් ලෙස හඳුනාගැනේ. ප්‍රදානය වත්කමකට සම්බන්ධ වනවිට, එය විලම්භිත ආදායමක් ලෙස හඳුනාගෙන අදාළ වත්කම්වල අපේක්ෂිත ඵලදායී ජීවිත කාලයට සමාන ප්‍රමාණයකින් ආදායමට මුදාහරිනු ලැබේ.

දේපල, පිරියත සහ උපකරණ වලට අදාළ ප්‍රදාන මුලින් විලම්භිත කරන අතර, අදාළ දේපල, පිරියත සහ උපකරණ වල ඵලදායී ජීවිත කාලයට සමානව ක්‍රමානුකූල පදනමක් මත ආදායමට වෙන්කරනු ලැබේ.

වත්කම්, ඒවායෙහි ඵලදායී ජීවිත කාලය තුළ හෝ කල් ඉකුත් නොවූ කල්බදු කාලසීමාව තුළ යන ඒවායින් අඩු ප්‍රමාණයට පහත පරිදි ක්‍රම ක්ෂය කර ඇත.

ගොඩනැගිලි	වසර 40 යි
ජල සම්පාදන	වසර 20 යි
මෝටර් රථ	වසර 05 යි
ලී බඩු සහ සවිකිරීම්	වසර 10 යි
උපකරණ	වසර 08 යි

3.4 ආදායම් සහ වියදම්

ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ අරමුණ සඳහා වියදම් ශ්‍රිතය අනුගමනය කරනු ලබන්නේ, එමඟින් සමාගමෙහි කාර්ය සාධනයේ මූලිකාංගයන් සාධාරණ ප්‍රමාණයෙන් ඉදිරිපත් කරන බැවිනි.

3.4.1 ආදායම් හඳුනාගැනීම

SLFRS 15 මඟින් කොපමණ ප්‍රමාණයකින්, කවදා ආදායම හඳුනාගෙන තිබේද යන්න තීරණය කිරීම සඳහා පුළුල් රාමුවක් සපයයි. එමඟින් LKAS 18 ආදායම්, LKAS 11 ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සහ අදාළ අර්ථ නිරූපනයන් ආදේශ කළේය. SLFRS 15 යටතේ ගණුදෙනුකරුවෙකු විසින් භාණ්ඩ හෝ සේවාවල පාලනය ලබාගත් විට අදායම් ලෙස හඳුනාගැනේ. පාලනය පැවරීමේ වේලාව තීරණය කිරීමේදී කාලයත් සමඟ - විනිශ්චය අවශ්‍යවේ.

ගණුදෙනුකරුවෙකු සමඟ ඇතිකර ගෙන ඇති ගිවිසුමක දක්වා ඇති ප්‍රතිඥාව මත පදනම්ව ආදායම මනිනු ලැබේ. අස්තිත්ත්වයක් විසින් භාණ්ඩ හෝ සේවා පාරිභෝගිකයෙකුට පවරන විට හෝ ලැබිය යුතු යැයි සමාගම අපේක්ෂා කරන ප්‍රමාණයට ආදායම හඳුනාගනී. ආදායම ප්‍රධාන වශයෙන් සමන්විත වන්නේ පොල් සහ කොප්රා අලෙවියෙනි.

2018 ජනවාරි1 දින සිට බලපැවැත්වෙන SLFRS 15 ට අනුව, සමාගම විසින් ආදායම හඳුනා ගැනීම සඳහා මූලධර්ම මත පදනම් වූ පියවරයන් පහක ආකෘතියක් අනුගමනය කරයි. ඒ අනුව, ආදායම හඳුනාගනු ලබන්නේ පහත සඳහන් සියලු නිර්නායක සපුරා ඇති විට පමණි.

- ගිවිසුමෙහි පාර්ශවයන් ගිවිසුම/මි අනුමත කර ඇති බව;
- මාරු කළයුතු භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් එක් එක් පාර්ශවයේ අයිතිවාසිකම් හඳුනා ගැනීමට අස්තිත්ත්වයට හැකිබව;
- පැවරිය යුතු භාණ්ඩ හෝ සේවා සඳහා වන ගෙවීම් නියමයන් අස්තිත්ත්වයට හඳුනාගත හැකිබව;
- ගිවිසුමට වාණජමය හරයක් ඇතිබව;
- පාරිභෝගිකයා වෙත මාරුකරනු ලබන භාණ්ඩ හෝ සේවාවන් සඳහා ලැබිය යුතු ප්‍රතිශ්ධාව රැස් කිරීමට අස්තිත්ත්වයට හැකියාව ඇතිබව.

SLFRS 15 අදාළ කර ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් සමාගමේ මූල්‍ය ප්‍රකාශයට සැළකිය යුතු බලපෑමක් ඇති නොවේ.

අ) දේපල, පිරියත සහ උපකරණ අයිතමයක් බැහැර කිරීමේදී ලැබෙන ප්‍රතිලාභ හෝ අලාභ තීරණය වන්නේ දේපල, පිරියත සහ උපකරණ වල ශුද්ධ විකුණුම් ඉපැයීම් ඒවායෙහි ධාරණ අගයත් සමඟ සසඳා ආදායම් ප්‍රකාශ තුළ හඳුනා ගැනීමෙනි.

ආ) වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනාගැනේ.

3.4.2 වියදම්

ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී සහ දේපල, පිරියත සහ උපකරණ කාර්යක්ෂමව පවත්වාගෙන යාමේදී දරණු ලබන සියලු වියදම් වර්ෂය සඳහා වූ ලාභය/(අලාභය) ලඟාකර ගැනීමේදී ආදායමෙන් අයකෙරේ.

3.5 ආදායම් බදු

ආදායම් බදු වියදම වර්තමාන සහ විලම්භිත බද්දෙන් සමන්විත වේ. ස්කන්ධය ලෙසට හඳුනාගන්නා අවස්ථාවේදී, ස්කන්ධයට සෘජුව අදාළව හඳුනා ගන්නා අයිතමයන් හැර, ආදායම් බදු වියදම ලාභයෙන් හෝ අලාභයෙන් හඳුනාගනු ලැබේ.

අ) ප්‍රවර්තන බදු

වර්තමාන බද්ද යනු වර්ෂය මත ගෙවිය යුතු අපේක්ෂිත බද්ද වන අතර, වාර්තා කරන දිනට පනවන ලද බදු අනුපාත සහ ඊට පෙර වර්ෂ වලට අදාළව ගෙවිය යුතු බදු සංශෝධන භාවිතා කෙරේ.

ආදායම් බදු සඳහා ප්‍රතිපාදන පදනම්වී ඇත්තේ මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර ඇති පරිදි ආදායම් හා වියදම් යන මූලිකාංග මත වන අතර, දේශීය ආදායම් පනතේ විධි විධාන වලට අනුකූලව ගණනය කරනු ලැබේ.

ආ) විලම්බිත බදු

ශේෂපත්‍ර ක්‍රමය භාවිතා කරමින් විලම්භීත බදු හඳුනාගෙන ඇති අතර, වත්කම් හා වගකීම්වල මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා වන ධාරණ අගය සහ බදුකරණ අගය සඳහා භාවිතා කරන අගය අතර ඇති තාවකාලික වෙනස්කම් වේ. පහත දැක්වෙන තාවකාලික වෙනස්කම් සඳහා විලම්භීත බද්ද හඳුනාගනු නොලැබේ. ව්‍යාපාර සංයෝජනයක් නොවන සහ ගිණුම්කරණයට හෝ බදු ගෙවිය හැකි ලාභයට බලපානු නොලබන වත්කම් හෝ වගකීම් මුලින් හඳුනා ගැනීමේදී, සහ අනාගතයේදී ආපසු හැරවිය නොහැකි තරමට වන පරිපාලිත සමාගම්වල ආයෝජන සම්බන්ධ වෙනස්කම්ය. මෙයට අමතරව, කීර්ති නාමයේ මූලික හඳුනා ගැනීම මත පැන නඟින බදු අයකළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා විලම්භීත බද්ද හඳුනාගෙන නොමැත. විලම්භීත බද්ද මනිනු ලබන්නේ වාර්තා කරන දිනයට බලාත්මක කර ඇති හෝ සැළකිය යුතු ලෙස බලාත්මක කරන ලද නීති මත පදනම්ව ආපසු හැරවීමේදී තාවකාලික වෙනස්කම් වලට අදාළවනු ඇතැයි අපේක්ෂා කරන බදු අනුපාතයන් මතය. වර්තමාන බදු වත්කම් සහ වගකීම් හිලව් කිරීම සඳහා නිත්‍යනුකූලව බලාත්මක කළහැකි අයිතියක් තිබේනම්, විලම්භීත බදු වගකීම් සහ වත්කම් හිලව් කරනු ලබන අතර, ඒවා එකම බදු අධිකාරිය විසින් එකම බදු අයකළ හැකි අස්තිත්ත්වයක් මත අයකරනු ලබන ආදායම් බදු හා සම්බන්ධ වේ.

විලම්භීත බදු වත්කමක් හඳුනාගනු ලබන්නේ තාවකාලික වෙනස උපයෝගී කරගත හැකි, අනාගත බදු අයකළ හැකි, ලාභ ලබාගත හැකි තරමට පමණි. විලම්භීත බදු වත්කම් සෑම වාර්තාකරණ දිනයකදීම සමාලෝචනය කෙරෙන අතර, හඳුනාගනු ලබන අදාළ බදු ප්‍රතිලාභය තවදුරටත් සිදුවිය නොහැකි බව සාක්ෂාත් වන විට එම ප්‍රමාණයෙන් ඒවා අඩු කරනු ලැබේ.

ඒකාබද්ධ ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස පරිපාලිතයන්හී සහ ආශ්‍රිතයන්හී ලාභාංශ ආදායම මත රඳවාගෙන ඇති බදු අදාළ ලාභාංශ ගෙවීමේ වගකීම හඳුනාගත් අවස්ථාවේදීම හඳුනාගනු ලැබේ.

3.7 බණ්ඩ වාර්තාකරණය

සමාගමේ විවිධ ව්‍යාපාරික බණ්ඩ සඳහා බණ්ඩ තොරතුරු සපයනු ලැබේ. ව්‍යාපාරික බණ්ඩනය තීරණය කිරීම වැවිලි වත්කම් ස්ථානගතවී ඇති භූගෝලීය ප්‍රදේශ මත පදනම්ව ඇත. මූල්‍ය ප්‍රකාශවල 27 වන සටහනෙහි බණ්ඩ වල ක්‍රියාකාරකම් විස්තර කර ඇති අතර, වැවිලි කර්මාන්තයේ භූගෝලීය ප්‍රදේශ පහත පරිදිවේ.

සමූහ I වතුයායයන්	**සමූහ II වතුයායයන්**
හලාවත වතු කලාපය	බිංගිරිය වතු කලාපය
පලුගස්වැව වතුයාය	දිවුලපිටිය වතු කලාපය
තම්බපණ්ණි වතු කලාපය	මාදම්පේ වතු කලාපය
මංගලවිලිය වතු කලාපය	නිකවැරටිය වතු කලාපය

04. ජනවසම ඉඩම් වල කල්බදු අයිතිය

		2024 රු.	2023 රු.
ජනවසම ඉඩම් වල කල්බදු අයිතිය	04.1	54,857,770	57,540,567
ජනවසම පලෙයි ඉඩම් වල කල්බදු අයිතිය	04.2	46,197,216	47,833,929
		101,054,986	105,374,496

04.1 ජනවසම ඉඩම් වල කල්බදු අයිතිය

සියලු වතු වලට අදාළ වසර 53 කාලයක් සඳහා කල්බදු ගිවිසුම් අත්සන් කර ඇත. මෙම සියලු කල්බදු 1992 ජුනි 11 දින එනම්, සමාගම ආරම්භක දිනයේ සිට බලපැවැත්වෙන ලෙස ක්‍රියාත්මක වේ. මෙම සියලු වතු වලට අදාල කල්බදු අයිතිය 1992 ජුනි 11 දින සමාගම පිහිටුවන ලද අවස්ථාවේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ හදිසි කරුණු කාර්යය බලකාය මේ සම්බන්ධයෙන් ලබා දෙන නියමයන්ට හා විධිවිධානයන්ට අනුව සමාගමේ පොත් වලට ගෙන ඇත. මේ සඳහා 1995 මාර්තු 08 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මෙම හිස් ඉඩම් සමාගම පිහිටු වීමට පෙර විශේෂඥ ඩී. ආර් වික්‍රමසිංහ සැකසු වටිනාකම මත ප්‍රති ඇගයීමට තීරණය කර ඇත.

1992 ජුනි මස 11 දින මෙම වත්කම් ශේෂ පත්‍රයට ගෙන වසර 53 ක් පුරා සමාන වටිනාකමින් ක්‍රමක්ෂය කරනු ලැබේ. වාර්තාකරන දිනට ඉතිරි කල්බදු කාලය වසර 20.5 ක් වේ.

	දළ පවත්වාගෙනයාමේ අගය		
	දිනට 31.12.2024 රු.	එකතු කිරීම්/ (ඉවත් කිරීම්) රු.	දිනට 31.12.2023 රු.
හිස් ඉඩම්වල කල්බදු අයිතිය	142,188,257	-	142,188,257

	ක්‍රමක්ෂය			
	දිනට 31.12.2024 රු.	වර්ෂය තුළ/ ඉවත්කිරීම් රු.	වසර සඳහා රු.	දිනට 01.01.2024 රු.
හිස් ඉඩම්වල කල්බදු අයිතිය	87,330,487	-	2,682,797	84,647,690

	පවත්වාගෙන යාමේ අගය	
	දිනට 31.12.2024 රු.	දිනට 31.12.2023 රු.
හිස් ඉඩම්වල කල්බදු අයිතිය	54,857,770	57,540,567

04.2 හිස් ඉඩම් වල කල්බදු අයිතිය ජනවසම පලෙයි වත්ත

(අ) පලෙයි වතු කලාපය වසර 30ක කාලයක් සඳහා කල්බදු ගිවිසුමට එලඹී ඇත. පලෙයි වත්තේ කල්බදු අයිතිය 2023 පෙබරවාරි 09 දිනට සමාගමේ පොත් වලට ගෙන ඇත. මෙම වත්කම 2023 පෙබරවාරි 09 දිනට ශේෂ පත්‍රයට ගෙන වසර 30ක කල්බදු කාලය පුරා සමාන අගයන්ගෙන් ක්‍රමක්ෂය කරනු ලබයි.

(ආ) මුනමලෙයි අයියන්කල් වත්ත, විසුවලිංගම් තොට්ටම් වත්ත සහ කාසිපල්ලයිකානි වත්ත වන වතු සඳහා වසර 30ක කල්බදු ගිවිසුමට එලඹී ඇත. මෙම සියලු ඉඩම් වල කල්බදු අයිතිය 2023 අප්‍රේල් 26 දිනට සමාගමේ පොත්වලට ගෙන ඇත.
මෙම වත්කම් 2024 අප්‍රේල් 26 දිනට ශේෂ පත්‍රයට ගෙන වසර 30ක් පුරා සමාන අගයන්ගෙන් ක්‍රමක්ෂය කරනු ලබන අතර වාර්තාකරන දිනට ඉතිරිව ඇති කාලය වසර 28ක් හා මාස 4කි.

කෙසේ වෙතත් මෙම වත්කම් පවරණ අවස්ථාව වන විට ගිණුම් වාර්තා වලට ගැනීම සඳහා එහි පොත් අගයක් නොපැවතුණි. එම නිසා පලෙයි, මුනමලෙයි අයියන්කල්, විසුවලිංගම් තොට්ටම් වතුවල සහ කාසිපල්ලයිකානි වතු වල හිස් ඉඩම් වල වටිනාකම කල්බදු කුලිය හා 12.5% ක අනාගත වට්ටම් අනුපාතය පදනම් කර ගනිමින් තක්සේරු කරන ලදී.

	දළ පවත්වාගෙන යාමේ අගය	
	2024 රු.	2023 රු.
වර්ෂය ආරම්භයට	49,101,423	-
එකතු කිරීම්		49,101,423
වර්ෂය අවසානයට	49,101,423	49,101,423

	ක්‍රමක්ෂය		
	දිනට 31.12.2024 රු.	වර්ෂය සඳහා රු.	දිනට 01.01.2024 රු.
හිස් ඉඩම් වල කල්බදු අයිතිය	2,904,207	1,636,713	1,267,494

	පවත්වාගෙන යාමේ අගය	
	දිනට 31.12.2024 රු.	දිනට 31.12.2023 රු.
හිස් ඉඩම් වල කල්බදු අයිතිය	46,197,216	47,833,929

05. ජනවසම වතුවල නිශ්චල කල්බදු වත්කම්

(භාවිතයට අයිතිය ඇති ඉඩම් සහ කල්බදු පෙළඹ වත්කම් හැර)

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හදිසි කරුණු කාර්ය සාධක බලකායේ (UITF) නියමයට අනුව මෙම වතුවල ඇති මූල්‍ය කල්බදු යටතේ ඇති සියලුම නිශ්චල දේපල අතීතයේ සිට බලපවත්වන පරිදි 1992 ජුනි 22 වන දින සිට ක්‍රියාත්මක වන සේ සමාගමේ පොත් වලට ගෙන ඇත. වත්කම් ජනවසම පොත්වල සටහන් වටිනාකම් මත සමාගම ආරම්භ කළ දිනට පොත් වලට ගැනීමට 1995 මාර්තු 08 පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත. මෙම වත්කම් 1992 ජුනි 11 දින ශේෂ පත්‍රයට ගෙන ඇති අතර නිශ්චල වත්කම් හා ක්‍රමක්ෂය 2024 දෙසැම්බර් 31 වන දිනට පහත දක්වා ඇත.

තක්සේරුවේදි	**ඉඩම් සංවර්ධනය රු.**	**වෙනත් අයිති වූ වත්කම් රු.**	**ගොඩනැගිලි රු.**	**යන්ත්‍ර සුත්‍ර රු.**	**ජල සැපයුම් රු.**	**2024 රු.**	**2023 රු.**
ප්‍රාග්ධනිත වටිනාකම	841,193	1,002,944	25,356,498	530	4,026,236	31,227,401	31,227,401
ක්‍රමක්ෂය වීම							
ජනවාරි 01 දා ට	71,725	1,002,944	25,356,498	530	4,026,236	30,457,933	30,457,933
වර්ෂයට ක්‍රමක්ෂය වීම	-	-	-	-	-	-	-
දෙසැම්බර් 31 ට	71,725	1,002,944	25,356,498	530	4,026,236	30,457,933	30,457,933
පවත්වාගෙන යන වටිනාකම	**769,468**	**-**	**-**	**-**	**-**	**769,468**	**769,468**

05.1 කල්බදු යටතේ ඇති පෙළව වත්කම් (ජනවසම)

	2024 රු.	2023 රු.
5.1.1 ජනවසම ඉඩම් වල කල්බදු අයිතිය	7,163,374	9,051,201
5.1.2 ජනවසම පලෙයි ඉඩම් වල කල්බදු අයිතිය	17,489,318	18,110,918
	24,652,692	27,162,119

5.1.1 කල්බදු යටතේ ඇති පෙළව වත්කම් (ජනවසම)

ප්‍රත්‍යාගණනය	2024 රු.	2023 රු.
මේරු වගාවන්	77,848,235	78,277,446
ඉවත් කිරීම් සඳහා කරන ලද ගැලපීම්	(529,596)	(429,211)
	77,318,640	**77,848,235**
ජනවාරි 01 දා ට	68,797,035	67,338,419
වර්ෂයට ක්‍රමක්ෂය වීම	1,887,827	1,887,827
ඉවත් කිරීම් සඳහා කරන ලද ගැලපීම්	(529,596)	(429,211)
දෙසැම්බර් 31 දා ට	**70,155,266**	**68,797,035**
පවත්වාගෙන යන වටිනාකම	**7,163,374**	**9,051,201**

වතු කල්බදු යටතේ සමාගමට භාර දෙන අවස්ථාවේ නොමේරු වගාවන් සඳහා කළ ආයෝජනය (1992-06-11 දිනට ප්‍රත්‍යාගනිත) නොමේරු වගා ලෙස දක්වා ඇති අතර වාර්තා කරන දින වන විට ඒවා සියල්ල මේරු වගාවන්ට මාරු කර ඇත. තවද, සමාගම මේරු සහ නොමේරු වගාවන් වෙනුවෙන් සිදු කළ ආයෝජනයන් කල්බදු දේපල සංවර්ධන සටහන් අංක 6 යටතේ දක්වා ඇත. මෙම මේරු/නොමේරු වගාවන් LKAS 41 කෘෂිකාර්ම නියමයන් යටතේ පෙළව වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත.

5.1.2 හිස් ඉඩම් වල කල්බදු අයිතිය ජනවසම පලෙයි වත්ත

පලෙයි වතු කලාපයේ ධාරක ජීව විද්‍යාත්මක වත්කම් (මේරු වගා) 2023 පෙබරවාරි 09 දින සිට ජනවසම හා හලාවත වැවිලි සමාගම කල්බදු අත්සන් කළ පසු සමාගමේ පොත් වලට ගෙන ඇත. මෙම වත්කම් වසර 30ක කාලයක් පුරා සමාන වටිනාකමින් ක්‍රමක්ෂය කරනු ලබයි.

කෙසේ වෙතත් මෙම වත්කම් පැවරෙන අවස්ථාව වන විට ගිණුම් වාර්තා වලට ගැනීම සඳහා එම වත්කම් වල පොත් අගය නොපවතීන අතර වාර්ෂික බදු කුලිය හා 12.5% වූ ඇස්තමේන්තු ගත අනාගත වට්ටම් අනුපාතය පදනම් කර ගනිමින් වත්කම් තක්සේරු කරන ලදී.

පලෙයි පොල් ඉඩම් වටිනාකම	2024 රු.	2023 රු.
වර්ෂය ආරම්භයේ	18,666,656	-
එකතු කිරීම්		18,666,656
වසර අවසානයේදී	**18,666,656**	**18,666,656**
ජනවාරි 1 දිනට	555,738	-
වර්ෂය සඳහා ක්‍රමක්ෂය	621,600	555,738
දෙසැම්බර් 31 දිනට ශේෂය	**1,177,338**	**555,738**
පවත්වාගෙන යන වටිනාකම	**17,489,318**	**18,110,918**

06. කල්බදු දේපල සංවර්ධනය (ධාරක පෙව වත්කම්)

පිරිවැය	නොමේරූ වගා	මේරූ වගා			2024	2023
		පොල්	කජු	වෙනත්		
	රු.	රු.	රු.	රු.	රු.	රු.
වර්ෂය ආරම්භයේදී	240,610,201	863,469,849	100,026,612	7,968,053	1,212,074,715	1,156,816,784
එකතු කිරීම්	80,605,403	-			80,605,403	59,035,164
නොමේරූ වලින් මාරු කිරීම්		99,217,316	-	5,871,082	105,088,397	55,790,869
මේරූ වලට මාරු කිරීම	(105,088,397)	-	-	-	(105,088,397)	(55,790,869)
වත්කම් හීනි වීම	-	-	-	-	-	(3,777,233)
වර්ෂය අවසානයෙදී	216,127,206	962,687,164	100,026,612	13,839,135	1,292,680,118	1,212,074,715
ක්ෂයවීම						
වර්ෂය ආරම්භයේදී		93,376,269	52,518,538	2,423,187	148,317,995	127,991,586
වර්ෂය සඳහා		17,344,940	4,001,064	691,957	22,037,961	20,577,053
වත්කම් හීන වීම/ බැහැර කිරීම		-		-	-	(250,644)
වර්ෂය අවසානයේදී		110,721,209	56,519,602	3,115,144	170,355,956	148,317,995
පවත්වාගෙන යන අගය	216,127,206	851,965,955	43,507,010	10,723,991	1,122,324,162	1,063,756,720

සිදුවෙමින් පවතින ප්‍රාග්ධන කටයුතු

ජනවාරි 1 දිනට	**10,058,485**	-
වසර තුළ එකතු කිරීම්	1,065,811	10,058,485
වර්ෂය තුළ ප්‍රාග්ධනීකරණය සහ පිටතට මාරු කිරීම්	**10,058,485**	-
දෙසැම්බර් 31 දිනට	1,065,811	10,058,485
පවත්වාගෙන යන වටිනාකම	1,123,389,973	1,073,815,205

සටහන:

මේවා සමාගම ස්ථාපිත කළ දින සිට මේරූ සහ නොමේරූ වගා සඳහා කළ ආයෝජනයි. කල්බදු යටතේ අත්පත් කර ගත් වත්කම් (වැවිලි වත්කම් ඇතුළත්ව) සටහන් අංක 4, සහ 5 යටතේ විදහා පෙන්වයි. තවදුරටත් කල්බදු පදනම යටතේ පවරා ගන්නා ලද වත්කම් වල නොමේරූ වගාවන් වෙනුවෙන් කළ ආයෝජනයන් මෙම සටහන තුළ ඇතුළත් වේ. එවැනි වගා මේරූ තත්ත්වයට පැමිණි විට, මේරූ තත්ත්වයට ගෙන ඒමට යෙදූ අමතර ආයෝජනය මෙම සටහන අනුව නොමේරූ සිට මේරූ කොටසට මාරු කර ඇත. ඒ අකාරයෙන්ම, ජනවසම කල්බදු පෙර කරන ලද ආයෝජනය වෙනුවෙන්ද නොමේරූ සිට මේරූ දක්වා මාරු වීම් වලට අදාළ වෙනස්වීම සටහන් අංක 5.1 මඟින් පෙන්වයි.

පෙව වත්කම් ගිණුම්කරණ ප්‍රමිත අංක 41 හි දක්වා තිබූ පරිදි සාධාරණ වටිනාකමින් විකුණුම් පිරිවැය අඩු කර අගය හදුනා ගැනීමේ අවශ්‍යතාවය 2012 මාර්තු 02 දින වරලත් ගණකාධිකාරි ආයතනයෙන් නිකුත් කළ නිර්දේශයන් හා නියමයන් මඟින් අවලංගු වේ. ඒ අනුව සමාගම පෙව වත්කම් අගය කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 -දේපල, පිරියත හා උපකරණ ප්‍රමිතයට අනුව පිරිවැය මත සිදු කරනු ලබයි.

වගා වියදම් මූල්‍යනය කිරීම සඳහා විශේෂිත ණය පහසුකම් ලබාගෙන නොමැත. එම නිසා ණය පිරිවැය වර්ෂය තුළ නොමේරූ වගාවන් යටතේ ප්‍රාග්ධනිත කර නොමැත. (2024 නොමැත)

7.1 පෙව වත්කම් - පශු සම්පත්

		2024 රු.	2023 රු.
කිරි පශු සම්පත්	07.1.1	12,151,415	10,221,915
වෙනත් පශු සම්පත්	07.1.2	15,205,360	15,322,900
		27,356,775	**25,544,815**

7.1.1 කිරි පශු සම්පත්

	නොමේරූ දෙනුන් පැටවු/ වැස්සියන් රු.	මේරූ දෙනුන් (කිරි දෙන සහ නොදෙන දෙනුන්) රු.	2024 රු.	2023 රු.
ජනවාරි 01 දා ට	1,280,220	8,941,695	10,221,915	9,507,450
වර්ෂය තුළ එකතු වූ	587,576		587,576	166,000
වර්ෂය සාධාරණ අගයට ලද ලාභය/පාඩු	(362,248)	271,659	(90,589)	800,699
මාරු කිරීම් ඇතුළට / පිටතට		117,714	117,714	170,311
වෙනත් වතු වලින් මාරු කිරීම්	(303,268)	2,696,448	2,393,179	1,228,865
මරණ / විකුණුම්		(1,078,380)	(1,078,380)	(1,651,410)
දෙසැම්බර් 31 දා ට	1,202,280	10,949,135	12,151,415	10,221,915

පශු සම්පත් මනිනු ලබන්නේ ඒවායේ සධාරණ අගයෙන් විකුණුම් වියදම් අඩු කිරීමෙනි. පශු සම්පත් සාධාරණ වටිනාකම ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් නිකුත් කල චක්‍රලේඛයට අනුව තීරණය කරනු ලබයි.

7.1.2 වෙනත් පශු සම්පත් (ධාරක පෙව් වත්කම්)

	මී හරක් රු.	කරත්ත ගොන්නු රු.	පට්ටි ගොන්නු රු.	බැටළුවන්/එළුවන් රු.	එළහරක් රු.	2024 රු.	2023 රු.
ජනවාරි 01 දා ට	7,380,450	2,697,300	357,750	4,657,000	230,400	15,322,900	16,271,650
